

# කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම්

## සුන්දරත්වයේ අසුන්දර පැතිකඩ

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය | 2014 අප්‍රේල්

# කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම්: සුන්දරත්වයේ අසුන්දර පැතිකඩ

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
2014 අප්‍රේල්

## ස්තුතිය

මෙම වාර්තාව සම්පාදනය කළේ ඉරෝමි පෙරේරා, ලුවී ගනේෂදාසන්, සුභාෂිණී සමරාරච්චි හා ත්‍යාගි රුවන්පතිරණ යන අයවලුන්ය. පර්යේෂණය හා වාර්තා කෙටුම්පත පිළිබඳව තම විවේචනාත්මක අදහස් ලබා දුන් ආචාර්ය පී. සරවනමුත්තු මහතාට කතුවරුන්ගේ ස්තුතිය හිමි වේ.

කොළඹ ජීවත් වන බොහෝ පුද්ගලයන් සැපයූ සහාය හා උදව් නො තිබෙන්නට මෙම පර්යේෂණය හා වාර්තාව යථාර්ථයක් බවට පත් නො වන්නට ඉඩ තිබිණ. තොරතුරු හා ලියකියවිලි සැපයූ පුද්ගලයන්හට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බෙහෙවින් ණයගැති වේ. ඔවුන්ගේ නම් ප්‍රසිද්ධ කර නැත්තේ ඔවුන්ගේම ඉල්ලීම මත ය.

කවරයේ ඡායාරූපය මිගාර තෙගාල්ගෙනි - සිය නිවාස කඩා දැමීමට මුහුණ පෑ කොම්පඤ්ඤවීදියේ වැසියෝ, 2014 පෙබරවාරි.

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සැබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටුවනු ලැබුවේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යාවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙනය. මහජන ප්‍රතිපත්ති විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැප වී සිටී.

ලිපිනය: 24/2, 28 වන පටුමග, මල් පාර,
කොළඹ, ශ්‍රී ලංකාව
දුරකථනය: +94 (11) 2565304/5/6
ෆැක්ස් අංකය: +04 (11) 4714460
වෙබ් අඩවිය: www.cpalanka.org
විද්‍යුත් තැපැල: info@cpalanka.org

# පටුන


| | |
|---|---|
| **සංක්ෂේත නාම** | 5 |
| **පෙරවදන** | 6 |
| **1 වන කොටස: කොළඹ නාගරික පුනර්ජීවනය හා බලහත්කාරී නෙරපා හැරීම් – දේශපාලනික හා ප්‍රතිපත්තිමය සන්දර්භය** | 8 |
| හැඳින්වීම | 8 |
| ජාතික නිවාස ප්‍රතිපත්තිය හා කොළඹ නාගරික පුනර්ජීවන වැඩසටහන | 9 |
| හමුදාකරණය හා ප්‍රජාතන්ත්‍රවාදය බාදනය වීම | 11 |
| බලහත්කාරී නෙරපා හැරීම් හා කොළඹ පවතින ඉඩම් පිළිබඳ දේශපාලන ආර්ථිකය | 12 |
| ලෝක බැංකුවේ කාර්ය භාරය | 15 |
| නිගමනය | 16 |
| **2 වන කොටස: කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම්වල අත්දැකීම — රැකවරණයන් දුර්වල කිරීම හා අයිතිවාසිකම් බාදනය කිරීම** | 18 |
| දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්: කෙටි සමාලෝචනයක් | 18 |
| සිද්ධි අධ්‍යයනයන් හා ප්‍රමුඛ සැලකිලිමත් වීම් | 22 |
| හමුදාකරණය | 24 |
| නීතිය තෝරා බේරා ගත් පාර්ශවයන් කෙරෙහි හා අක්‍රමවත් ලෙස යොදා ගැනීම | 25 |
| තොරතුරු හා සහභාගිත්වයක් නොමැතිකම | 27 |
| වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හා නව නිවාස සඳහා මුදල් ගෙවීමට නිවැසියන්ට බල කිරීම | 28 |
| වන්දි ගෙවීම් පමා වීම | 29 |
| ජීවනෝපායන්ට හා අධ්‍යාපනයට ඇති ප්‍රවේශය අනතුරට ලක් කිරීම | 30 |
| **නිර්දේශ** | 31 |
| **1 වන ඇමුණුම** | 36 |
| **2 වන ඇමුණුම** | 40 |
| **3 වන ඇමුණුම** | 42 |

## සංකේත නාම

| | |
|---|---|
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| CMC | කොළඹ මහ නගර සභාව |
| CPA | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය |
| DS | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| FKM | කොම්පඤ්ඤවීදියේ මුස්ලිම් දේවස්ථාන සම්මේලනය |
| GCEC | මහ කොළඹ ආර්ථික කොමිසම |
| LAA | ඉඩම් අත්පත් කර ගැනීමේ පණත |
| LLRC | උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම |
| LARC | ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව |
| MCUDP | මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතියට |
| NHP | ජාතික නිවාස ප්‍රතිපත්තිය |
| NIRP | ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය |
| PEA | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන |
| RAP | නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් |
| SCDP | ක්‍රමෝපායාත්මක නගර සංවර්ධන ව්‍යාපෘතියට |
| UDA | නාගරික සංවර්ධන අධිකාරිය |
| UNP | එක්සත් ජාතික පක්ෂය |
| UPFA | එක්සත් ජනතා නිදහස් සන්ධානය |
| URP | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය |
| WB | ලෝක බැංකුව |

# පෙරවදන

මෙම වාර්තාව බිහි වන්නේ කොළඹ නගරය තුළ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් පිළිබඳව ඇති වූ බැරෑරුම් සැලකිලිමත් වීම්වල ප්‍රතිඵලයක් වශයෙනි. විශේෂයෙන් ම, හමුදාව යටතේ පාලනය වන නාගරික සංවර්ධන අධිකාරිය (UDA) බලහත්කාරී නෙරපා හැරීම්වලට සම්බන්ධ වීම, උතුරු හා නැගෙනහිර පළාත්වල දී යොදා ගත්තාට සමාන විධික්‍රම යොදා ගැනීම හා සමහර තක්සේරු සලකා බලන විට මේ නෙරපා හැරීම්වල පරිමාණය යුද්ධයේ අවසන් අවුරුදු දෙකෙහි ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ සිදු වූ අවතැන් වීම ද ඉක්මවා යා හැකි ය.

මෙම වාර්තාවේ දී මතු කෙරෙන ප්‍රධාන තර්කය වන්නේ කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් අතිවිශාල සමාජීය, මහජන හා මානව පිරිවැයවල් වසං කිරීම සඳහා පමණක් යොදා ගන්නා සංවර්ධන ව්‍යාපෘතියක කොටසක් ලෙස දැකිය යුතු බව යි. එම නිසා මේ වාර්තාව, කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට පදනම් වන පරමාර්ථ හා අභිමතාර්ථ (1 වන කොටස) මෙන් ම ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂයෙන් ම ඉඩම් අත්පත් කර ගැනීමට හා ස්වේච්ඡාමය නොවන ආකාරයෙන් නැවත පදිංචි කිරීමට අදාළ පරමාර්ථ හා අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකාවේ රජය යොදා ගෙන ඇති විධික්‍රම හා ක්‍රියාවලි (2 වන කොටස) ද ප්‍රශ්නයට බඳුන් කරයි.

මේ ක්‍රියාවලියේ දී දැනට පවත්නා දේශීය නීතිමය හා ප්‍රතිපත්තිමය ආරක්ෂණයන් හා ප්‍රමිතීන් ගණනාවක් ම කිසිදු බාධාවකට ලක් නො වී නො තකා හැර ඇතැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) විශ්වාස කරයි. දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට ගරු කිරීම බලහත්කාරී නෙරපා හැරීම් වැළැක්වීම හා අවම කිරීම සඳහාත් කුමන නැවත පදිංචි කිරීමකින් වුව සිවිල්මය, ආර්ථික, දේශපාලනික හා සමාජීය අයිතිවාසිකම් වැඩි දියුණු වීමක් මිස ඒවා බාදනය වීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහාත් තීරණාත්මක වන බව වාර්තාව අවධාරණය කරයි.

මේ වාර්තාව කොළඹ නගරය තුළ දැන් සිදු වෙමින් පවතින හා සිදු වීමට නියමිත බලහත්කාරී නෙරපා හැරීම් හමුදාවට සම්බන්ධ කොට පමණක් නො ව වර්තමාන රජයේ වෙළඳ පොළ නැඹුරුවට ද සම්බන්ධ කොට සිය විශ්ලේෂණයට පදනම් කර ගනියි. කොළඹ නගරය තුළ දැන් සිදු වන පරිවර්තනයට යටින් පවත්නේ නාගරික ඉඩම් වෙළඳ පොළවල බලපවත්වන දේශපාලනය, දේශීය, කලාපීය හා ජාත්‍යන්තර නිශ්චල දේපොළ මූල්‍ය හා ප්‍රාග්ධන ආයතනවල බලය සහ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සංවර්ධන ණය යන්ත්‍රණවල කාර්ය භාරය හා බලපෑම යි. නාගරික පුනර්ජීවන පරිශ්‍රමය ද "මුඩුක්කු නිවාසවලින් තොර" (වුවත් දරිද්‍රතාවෙන් තොර නොවූ) හා "සුන්දර" (වුවත් සියල්ලන් ඇතුළත් කර නොගත්) කොළඹක් පිළිබඳ සටන් පාඨ ද බලහත්කාරී නෙරපා හැරීම් ද යන මේ සියල්ල ම නගරය තුළ පවත්නා ඉඩම් පිළිබඳ දේශපාලන ආර්ථිකයට වෙන් නොකළ හැකි ලෙස සම්බන්ධ ය.

මේ ලියවිල්ල විස්තරාත්මක හෝ 'පරිපූර්ණ' ලියවිල්ලක් නො වේ. ඊට හේතුව, ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු සීමිත වීම නොහොත් ඒවා හිතාමතා ම එසේ සීමාසහිතව ප්‍රසිද්ධ කිරීම, පීඩාවට පත්ව සිටින පුද්ගලයන් සංඛ්‍යාව අතිවිශාල වීම සහ නීතිවල හා රෙගුලාසිවල සංකීර්ණත්වය යි; අන් සියල්ලට මත් වඩා, කාලය හා හැකියාව අතින් පමණක් නො ව නාගරික සංවර්ධන අධිකාරියේ යන්ත්‍රණය විසින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සිත් තුළ ජනිත කර ඇති බිය, හිර වීම හා සැකය නිසා ද ක්ෂේත්‍ර වැඩ කටයුතු සීමා වීම යි. එහෙත්, නගරයේ විවිධ කොටස්වල වෙසෙන පීඩාවට පත් පුරවැසියන්ගෙන් ලබා ගත් සම්මුඛ සාකච්ඡාවන් ද එකිනෙකට වෙනස් ප්‍රජාවන් තුනක් ලද අත්දැකීම් ඇසුරින් සකස් කර ගත් කෙටි සිද්ධි අධ්‍යයනයන් ද පදනම් කර ගන්නා වාර්තාව කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් ආශ්‍රිත ප්‍රධාන ගැටලු හා සැලකිලිමත් වීම් සංක්ෂිප්තව ගෙන හැර පායි.

එම නිසා මෙම වාර්තාව, බලහත්කාරී නෙරපා හැරීම් මෙන් ම ඒවා මෙහෙයවන දේශපාලනික, ආර්ථික, නීතිමය හා ආයතනික යන්ත්‍රණයන් ඊට සම්බන්ධ වන ආකාරය කෙරෙහිත් අවධානය යොමු කිරීමට පොලඹවන්නක් ද විද්වතුන්, පර්යේෂකයන්, සිවිල් සමාජ හා මානව අයිතිවාසිකම් සංවිධාන, සියලු දේශපාලන පක්ෂ සහ මාධ්‍යය වෙත එසේ අවධානය යොමු කරන ලෙස කැඳවුම් කරන්නක් ද වේ.

සංවර්ධන පරමාර්ථවල හා උපක්‍රමවල වැදගත්කම ප්‍රතික්ෂේප කළ නොහැකි ය. කොළඹ නගරයෙහි බලහත්කාරී නෙරපා හැරීම් හා ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් සිදු වෙමින් පවතිද්දී සමහර පුද්ගලයන් හා පවුල් තමන්ගේ නැවත පදිංචිය හා තමන් නැවත පදිංචි කළ ස්ථානය ගැන තෘප්තිමත් වන අයුරු හුවා දක්වමින් ඉදිරිපත් කෙරෙන පටු ප්‍රතිඵලවාදී තක්සේරු ගැන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අනතුරු අඟවයි. සමහරුන් එසේ තෘප්තිමත් වන බව සත්‍යයක් විය හැකි නමුත් තනි පුද්ගලයෙකු පදනම් කර ගත්තා වූත් 'සංක්ෂිප්ත වූත්' සමස්තයෙන් වෙන් කොට ගෙන කෙරෙන්නා වූත් එවැනි තක්සේරුවල අනතුරක් ගැබ් වෙයි.[1] මෙහි දී පරදුවට තබා ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, නීතියේ ආධිපත්‍ය සහ ව්‍යවස්ථානුකූලව හා ජාත්‍යන්තරව පිළිගත් අයිතිවාසිකම් ය. වෙනත් වචනවලින් කිව හොත්, පුරවැසිභාවය මය.

[1] සැබවින් ම, එවන් අදහසක් සමස්තය ලෙස සැලකීමට යාමෙන් මෑත පැවැත්වූ බස්නාහිර පළාත් සභා මැතිවරණයේ දී පාලක සන්ධානය ලද සැලකිය යුතු පරාජයන් විමසා බැලීම පමණක් වුව ද මේ සඳහා ප්‍රමාණවත් ය.

# 1 වන කොටස: කොළඹ නාගරික පුනර්ජීවනය හා බලහත්කාරී නෙරපා හැරීම් — දේශපාලනික හා ප්‍රතිපත්තිමය සන්දර්භය

## හැඳින්වීම

"2020 වන විට කොළඹ නගරය තුළ එක ද පැල්පත් වාසියෙකුවත් නොසිටිනු ඇත."
– මහින්ද චින්තන 2010[2]

2010 මුල දී අතිමහත් බහුතර ඡන්දයකින් ලද මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව ජනාධිපති රාජපක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය (UDA) ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගත්තේ ය. ඉන් වැඩි කලක් ගත වීමට පෙර 2010 මැයි මාසයේ දී නාගරික සංවර්ධන අධිකාරිය හමුදාවේ සහාය ලැබ එය ක්‍රියාත්මක කළ නෙරපා හැරීම්වල පළමු පියවරට මුල පිරුවේ ය. හමුදා සොල්දාදුවන් සමග පැමිණි බුල්ඩෝසර කොළඹ කොම්පඤ්ඤවීදියේ මිව්ස් වීදියෙහි වාසය කළ කුඩා පහළ මධ්‍යම පන්තික ප්‍රජාවකට අයත් නිවාස හා ව්‍යාපාර කඩා බිඳ දැමුවේ ය.[3] අවසානයේ දී ඔවුන්ගේ නිවාස හමුදා නිලධාරීන්ගේ දරුවන් සඳහා වූ පාසලක් බවට පත් විය. නිවැසියන්ට නිසි පූර්ව නිවේදනයක් නොකළ අතර, වන්දි ගෙවීමක් ද නො කෙරිණ. මේ වන විට අවුරුදු හතරකට ආසන්න කාලයක් ගත වී ඇතත් තව මත් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට පොරොන්දු වූ පරිදි විකල්ප වාසස්ථානය ලබා දීමක් ද සිදු වී නැත (2 වන කොටසෙහි ඇතුළත් කර ඇති මිව්ස් වීදි සිද්ධි අධ්‍යයනය බලන්න).

තම පරමාර්ථය කොළඹ නගරය මුඩුක්කු නිවාසවලින් තොර "ලෝක මට්ටමේ" "උද්‍යාන නගරයක්" නොහොත් "ජාත්‍යන්තර ව්‍යාපාරික ලෝකය හා සංචාරක ව්‍යාපාරය වඩා කැමති වන ආකාරයේ ගමනාන්තයක්" බවට පරිවර්තනය කිරීම බව දැන් ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයේ මුලසුන දරන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ නැවත නැවතත් අවධාරණය කර ඇත.[4] නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (URP) සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන්නේ මෙය යි. ව්‍යාපෘතිය පිළිබඳ සියලු විස්තර නිල වශයෙන් ප්‍රසිද්ධ කර නැතත් ඒ යටතේ නගරය පුරා සිටින දුප්පත් අඩු-මැදි ආදායම්ලාභී පවුල් දහස් ගණනක් බලහත්කාරයෙන් වෙනත් ස්ථානවල පදිංචි කිරීමට යන බව කඩිනමින් ප්‍රත්‍යක්ෂ වෙමින් පවතී. ඊළඟ වසර කිහිපයේ දී වෙනත් ස්ථානවල පදිංචි කිරීමට නියමිත පවුල් සංඛ්‍යාව පිළිබඳ නිල තක්සේරුවලින් පවුල් "70,000ක පමණ"[5] සිට 135,000[6] දක්වා වූ එකිනෙකට වෙනස් සංඛ්‍යා පෙන්නුම් කරයි. සාමාන්‍ය නාගරික කුටුම්බයක විශාලත්වය 4.2 ලෙස උපකල්පනය කිරීමෙන්[7] ඇඟවෙන්නේ 280,000 සිට 500,000 ඉක්මවන ජනතාවක් වෙනත් යම් ස්ථානවල පදිංචි කිරීමෙන් පරිමාණය හා සංකීර්ණත්වය නිසා නොයෙක් ආකාරයේ සමාජීය හා ආර්ථික අවදානම් ඇති වන බව යි.

කොළඹ නගරය රම්‍ය වූත් මුඩුක්කු හා පැල්පත්වලින් තොර වූත් ස්ථානයක් බවට පත් කිරීම පිළිබඳ නාගරික පුනර්ජීවන ව්‍යාපෘති අභිමතාර්ථය බොහෝ දුරට රාජ්‍ය පාලිත මාධ්‍යය හා ප්‍රසිද්ධ සංවාද මණ්ඩප තුළ නිමක් නැතිව පුනරුච්චාරණය කෙරේ. එහෙත්, උදාහරණයක් ලෙස අනෙක් බොහෝ ආසියානු නගර ගත හොත් ඒවායේ මෙන් විශාල ලෙස පැතිරුණු මුඩුක්කු නිවාස සහිත ප්‍රදේශ

---

[2] 'Sri Lanka – The emerging Wonder of Asia' Mahinda Chintana – Vision for the future: The Development Policy Framework, Government of Sri Lanka, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, 2010, 175 පි., මෙතැන් සිට මහින්ද චින්තන 2010 ලෙස හැඳින්වේ.
[3] The Sunday Times, "UDA offers Rs. 8,000 a month for Mews St. evictees," 2010 මැයි 16, සහ The DailyFT, "Ranil rakes up evictions in Colombo city," 2013 නොවැම්බර් 6.
[4] 'Development Plans For The City Of Colombo,' ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා පැවැත්වූ සුජාතා ජයවර්ධන අනුස්මරණ දේශනය, 2011.
[5] The Island, "Colombo to become Garden City, 70,000 families to be relocated: Gota," 2013 මාර්තු 20.
[6] Defence.lk, "Prospects of relocating underserved settlements in Colombo suburbs," 2013 පෙබරවාරි 2.
[7] Household Income and Expenditure Survey - 2009/10, Preliminary Report, ශ්‍රී ලංකා රජයේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

කොළඹ නගරයෙහි කිසි දා නොතිබූ බව මෙහි දී අවධාරණය කිරීම වැදගත් වේ. කොළඹ මහ නගර සභාව සහ සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය 2001 දී කළ සමීක්ෂණයක දී නගරය තුළින් සමස්තයක් ලෙස අඩු ආදායම්ලාභී ජනාවාස 1,614ක ජීවත් වූ පවුල් 77,612ක් හඳුනා ගැනිණ.[8] කෙසේ වෙතත්, "හඳුනා ගත් අඩු ආදායම්ලාභී ජනාවාස සියල්ල ම මුඩුක්කු ප්‍රදේශ ලෙස වර්ග කිරීම අසීරු" බව ද අධ්‍යයනය විසින් සොයා ගෙන තිබීම වැදගත් ය.[9] එමෙන් ම, අනෙක් විශාල දකුණු ආසියානු නගරවල මෙන් නොව කොළඹ නගරයෙහි පැවතියේ සාපේක්ෂ වශයෙන් කුඩා නිවාස පොකුරුවලින් සමන්විත අඩු ආදායම්ලාභී ජනාවාස බව ද ඉන් සියයට 74ක තිබෙන්නේ නිවාස ඒකක 50කට වඩා අඩුවෙන් බව සහ ඒකක 500කට වැඩියෙන් තිබෙන ජනාවාස ඇත්තේ කොළඹ පිහිටි අඩු ආදායම්ලාභී මුළු ජනාවාස සංඛ්‍යාවෙන් 0.7ක පමණක් බව ද එය සොයා ගත්තේ ය.[10] කෙසේ වෙතත්, හිමිකම් අයිතිය තිබුණේ මෙම පවුල්වලින් සියයට 25කට අඩු ප්‍රමාණයකට වන අතර, මෙම ජනගහනයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයකට භුක්තිය පිළිබඳ සුරක්ෂිතතාවක් නො පැවතිණ.[11]

## ජාතික නිවාස ප්‍රතිපත්තිය හා කොළඹ නාගරික පුනර්ජීවන වැඩසටහන

කොළඹ පිහිටි අඩු ආදායම්ලාභී ජනාවාසවලින් බොහොමයකට ඉහළ මට්ටමේ සේවා සම්පාදනයක් අවශ්‍ය බවට ද ප්‍රමාණවත් නිවාස, සුරක්ෂිත භුක්තිය හා හිමිකම් අයිතියක් නොමැතිකම ඒ බොහොමයක කනස්සල්ලට කරුණක් වී ඇති බවට ද කිසිදු සැකයක් නොමැත. එහෙත්, සවිස්තරාත්මක හිමිකම් රාමුවක් සහ ජාතික[12] හා ජාත්‍යන්තර[13] ප්‍රමිතීන්ට අනුකූල ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියක් නොමැති නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය වඩා හොඳ නිවාස හා සේවාවන් වෙත ප්‍රවේශ වීම සඳහා පූර්ව කොන්දේසියක් ලෙස වෙනත් ස්ථානයක පදිංචි කිරීම පිළිගැනීම අනිවාර්ය කරයි. නිවාස සම්බන්ධ නාගරික පුනර්ජීවන ව්‍යාපෘති ප්‍රවිෂ්ටය සීමාසහිතකම් පවතින නමුත් බොහෝ ධනාත්මක අංගවලින් සමන්විත කෙටුම්පත් ජාතික නිවාස ප්‍රතිපත්තිය (NHP) තුළ ප්‍රකාශිත ප්‍රවිෂ්ටයට පටහැනි ය. එනම්, ජාතික නිවාස ප්‍රතිපත්තියේ ප්‍රවිෂ්ටය මුළුමනින් ම නොසලකා හරින නාගරික සංවර්ධන අධිකාරිය කරන්නේ එය සතු බලයත් අලංකාරෝක්ති සපිරි කතාව හා ක්‍රියාව අතර පුළුල් වෙමින් පවත්නා පරතරයත් අවධාරණය කිරීම පමණකි.

"තමන්ගේ ම නිවාස ඉදි කර ගත හැකි පවුල්වලට ඉඩම නීත්‍යනුකූල බවට පත් කර දෙමින් ද මූලික (මෙසේ සඳහන් විය) සැප පහසුකම් සම්පාදනය කරමින් ද අවශ්‍ය තාක්ෂණික සහාය සහිතව සහනදායී පොලී අනුපාතික මත නිවාස සහාය මුදා හරිමින් ද ඍජුව සහාය සැපයිය යුතු" යැයි ජාතික නිවාස ප්‍රතිපත්තිය ඉල්ලා සිටී.[14] එහෙත්, හිමිකම නීත්‍යනුකූල කිරීම හා පෙර පැවති ස්ථානයේ ම හෝ සුදුසු වෙනත් ස්ථානයක තමන්ගේ ම නිවාස ඉදි කර ගැනීමට පවුල්වලට හැකියාව ලබා දීම ද එලෙස තම ප්‍රජාවන්ට සමාජීය හා ආර්ථික වටිනාකමක් එක් කර ගැනීම සඳහා එම පවුල් බල ගැන්වීම ද වෙනුවට අනියම් හිමිකම් ක්‍රමය යොදා ගන්නා නාගරික සංවර්ධන අධිකාරිය කරන්නේ ජනතාවට වන්දි ලබා ගැනීමේ අවස්ථාව අහිමි කරන ගමන් නැවත පදිංචි කෙරෙන නිවාස සඳහා ගෙවීමට ඔවුන්ට බල කරමින් ඔවුන්ගේ භුක්තිය පැහැර ගැනීම යි. දක්ෂිණ අධිවේගී මාර්ගය පිළිබඳ තත්වය මීට වෙනස් ය. එහි දී ගොඩනැගිලි, වත්කම් හා ආදායම් අහිමි වීම වෙනුවෙන් වන්දි ලබා ගැනීමේ සුදුසුකම හිමිකම් අයිතිය නොමැති අයට මෙන් ම ලියාපදිංචි

---

[8] The case of Colombo, Sri Lanka, සෙවනත.
[9] එම, 6 පි.
[10] එම, 6-7 පිටු.
[11] එම, 10 පි.
[12] උදාහරණයක් ලෙස, ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් සැපයෙන දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සමග එක්ව මාර්ග සංවර්ධන අධිකාරිය සහ වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය සකස් කළ National Policy on Involuntary Resettlement in Sri Lanka බලන්න.
[13] සංවර්ධනකාරී අවතැන් වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ (UN Guidelines on Development Induced Displacement) මෙන් ම ලෝක බැංකුව වැනි ආයතනවල ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් පිළිබඳ ප්‍රතිපත්ති ද මීට ඇතුළත් වේ.
[14] Draft National Housing Policy, 10 පි.

නොකළ ව්‍යාපාරවල අයිතිකරුවන්ට ද ලැබිණ.[15] නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ කොටසක් ලෙස ස්වේච්ඡාමය නොවන ජනාවාස ක්‍රියාවලියේ හා පරමාර්ථවල සියලු පැතිකඩවලට අදාළ වූත් ජාතිකව හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වූත් සවිස්තරාත්මක අයිතිවාසිකම් හා හිමිකම් රාමුවක් නොමැතිකම කොළඹ ජීවත් වන දහස් ගණනක් ජනතාවගේ අයිතිවාසිකම්වලට බරපතළ තර්ජනයක් එල්ල කරයි.

"නිවාස සංවර්ධනයේ දී ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට ප්‍රජා මූල සංවිධාන ශක්තිමත් කළ යුතු" යැයි ද "තීරණ ගැනීමේ ක්‍රියාවලි පිළිබඳව දුප්පත් ප්‍රජාවන්ට මග පෙන්විය යුතු" යැයි ද ජාතික නිවාස ප්‍රතිපත්තිය විශේෂයෙන් ඉල්ලා සිටී. "සහභාගිත්ව ක්‍රමවේදී ප්‍රවිෂ්ටයන්, හැකියා ගොඩ නැගීම හා අඩු ආදායම්ලාභී නිවාස සංවර්ධනයට බල ගැන්වීම ගැන අවධාරණය නොකිරීම"[16] ශ්‍රී ලංකාවේ නිවාස ප්‍රතිපත්තිය සම්බන්ධ බරපතළ ප්‍රශ්නයක් යැයි ද ජාතික නිවාස ප්‍රතිපත්තිය සඳහන් කරයි.

කෙසේ වෙතත්, වෙනත් ස්ථානයක පදිංචි කිරීම සම්බන්ධයෙන් එකඟතාව පළ කිරීමට හෝ තෝරා ගැනීමක් කිරීමට ඉඩ දී නැතුවා පමණක් නොව, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය තුළ පොදුවේත් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය තුළ විශේෂයෙනුත් දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ තොරතුරු වෙත ප්‍රවේශය හා අර්ථාන්විත මහජන අදහස් විමසීමක් නොමැතිකම යි. ප්‍රසිද්ධ කර නැති සමීක්ෂණ ද නෙරපා හැරීම්වලට මුහුණ දෙන ප්‍රජාවන් ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු හමුදාවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග පෙර පැවැත්වූ රැස්වීම් ද 'අදහස් විමසීම්' ලෙස හුවා දක්වනු ලැබේ. ජනාවාස අඩවි සැලසුම් කිරීමෙහි හා ඉදි කිරීමෙහි ලා සහභාගි වීමට ප්‍රජාවන්ට අවස්ථාව දී නැතුවා පමණක් නො ව, නව නිවාස එනම් සිරස් කුලුනු මාදිලියේ වු ඒවා, සියල්ල සැලසුම් කිරීම හා ඉදි කිරීම සිදු වන්නේ[17] ඒ ඒ ප්‍රජාවන්ගේ විශේෂ අවශ්‍යතා තක්සේරු කිරීමට හෝ තීරණය කිරීමට බොහෝ කලකට පෙර ය.

එක ම ප්‍රමාණය හැමෝට ම ගැළපෙන බව සිතන එවැනි ප්‍රවිෂ්ටයන් අසාර්ථක වන බව අතීතයේ දී ඔප්පු වී ඇත. උදාහරණයක් ලෙස, පැල්පත් නිවාසවලින් ඉවත් කර වෙනත් ස්ථානවල පදිංචි කළ අයට නිවාස සැපයූ ඊසාන දිග කොළඹ පිහිටි සහස්පුර කුලුනු නිවාස සංකීර්ණයේ වැසියන් ගැන 2010 දී කළ අධ්‍යයනයක නිගමනය වුයේ "වෙනත් ස්ථානයක පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සිය ඉලක්ක ඉටු කර ගැනීමෙහි ලා අසමත් වීමට වැඩි වශයෙන් හේතු වූයේ ජනාවාසකරණ ක්‍රියාවලිය සමාජ වියමන බිඳ වැටීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හා එම ක්‍රියාවලියට සමාජීය බිඳී විසිරී යාම වැළැක්වීමේ ක්‍රමෝපායන් ඇතුළත් නොවීම" බව යි. "එය නොවිධිමත් ආදායම් උපයන්නන්ගේ ජීවනෝපායන් හා ඔවුන්ට ණය වෙත පවත්නා ප්‍රවේශය වැනි සමාජ-ආර්ථික පැතිකඩවල් කෙරෙහි ද අවධානය යොමු නොකළේ ය."[18]

---

[15] ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය සහ වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය සකස් කළ National Policy on Involuntary Resettlement in Sri Lanka.

[16] Draft National Housing Policy, 4 පි.

[17] "නිවාස සංකීර්ණ" – එනම් ප්‍රධාන වශයෙන් සිරස් කුලුනු – ඉදි කෙරෙන්නේ පහත දැක්වෙන පදිංචි කිරීමේ අඩවිවල යඃ හේනමුල්ල, අලුත් මාවත, ෆර්ගියුසන් පාර, සිරිල් සී. පෙරේරා මාවත, එදිරිසිංහ මාවත, මාලිගාවත්ත ලංකා දුම්රිය සේවා ඉඩම, දෙමටගොඩ ලංකා දුම්රිය සේවා ඉඩම, 31 වත්ත-ඔරුගොඩවත්ත අඩවිය, 54 හා 56 වතු, රජයේ කර්මාන්ත ශාලා ඉඩම-කොලොන්නාව, සාලමුල්ල හා අංගොඩ. මේ අතරින්, දැන් මිහිඳු සෙන්පුර නමින් හැඳින්වෙන දෙමටගොඩ පිහිටි අඩවියේ ඉදි කිරීම් කටයුතු අවසන්ව ඇති අතර, නගරයේ විවිධ කොටස්වලින් නෙරපා හැරුණු අය එහි පදිංචි වෙමින් සිටිති. <http://www.uda.lk/investment_relocation.html> වෙබ් පිටුව බලන්න.

[18] Factors contributing to the failure of development induced resettlement projects: a case study of the "Sahaspura" slum relocation project, Colombo, Sri Lanka, එස්.එල්. ධම්මික කේ. විජයසිංහ, රොටර්ඩෑම්හි ඉරැස්මස් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර නාගරික කළමනාකරණ ආයතනයට ඉදිරිපත් කළ ශාස්ත්‍රපති නිබන්ධය, 55 පි.

## හමුදාකරණය හා ප්‍රජාතන්ත්‍රවාදය බාදනය වීම

කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය තුළ ඉඩම් අයිතීන් හා හිමිකම් සුරක්ෂිත කිරීමට අදාළව වේවා විනිවිද භාවය හා සහභාගිත්වය සහතික කිරීමට අදාළව වේවා පවතින බරපතළ ඌනතා සියලු මහ නගර සභා මට්ටම්වල දී ද ඇතුළුව ශ්‍රී ලංකාවේ පාලනය තුළ පශ්චාත් යුද සමයේ සිදු වූ හමුදාකරණය සමග වෙන්නොකල හැකි ලෙස සම්බන්ධ ය. හමුදාව කොළඹ සෑම තැනක ම සිටින අතර, භූ දර්ශනය සැකසීමෙහි, ඉදි කිරීමෙහි, පිරිසුදු කිරීමෙහි හා සාමාන්‍යයෙන් මහ නගර සභාවට අයත් වන බොහෝ කාර්යයන් ඉටු කිරීමෙහි නිරතව සිටිනු දැකිය හැකි ය.[19] විනය පාලනය සඳහා — නගරයට ප්‍රවේශ වීම පාලනය කිරීම සඳහා ‘නොසැලකිලිමත්ව පාරේ ගමන් කිරීම’ වෙනුවෙන් දඩ ගැසීමේ සිට ‘පාරිසරික පොලීසිය’ දක්වා — නොයෙක් තන්ත්‍රයන් පිහිටුවා ඇති අතර, ප්‍රසිද්ධ ස්ථාන හමුදාවේ හා පොලීසියේ අඛණ්ඩ සමීප නිරීක්ෂණයට ලක් වේ.

හමුදාව නාගරික සංවර්ධන අධිකාරිය මගින් හා එය තුළ ක්‍රියා කරමින් නෙරපා හැරීමේ හා වෙනත් ස්ථානවල පදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීමෙහි ද යෙදෙයි. පීඩාවට පත් නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ තමන්ට තම ඉල්ලීම් හා දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සිදු වූයේ මහ නගර සභාවට හෝ වෙනත් ආයතනවලට නො ව ක්‍රියාවලිය අධීක්ෂණය කරන ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන්ට බව යි. වෙනත් ස්ථානවල පදිංචි කිරීමට පෙර හා පසුව හමුදාවේ හා පොලීසියේ කාර්ය මාණ්ඩලිකයන් සම්බන්ධ කර ගෙන ඉහළ මට්ටමේ සමීප නිරීක්ෂණයක් සිදු වන බව ද ඔවුහු වාර්තා කළහ. පැල්පත් කඩා දමන අතරතුර හා ඉන් පසුව හමුදාවේ කාර්ය මාණ්ඩලිකයන් ක්‍රියාකාරීව සිටිනු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකයන් ද දැක ඇත.

හමුදාවේ කාර්ය භාරය පුළුල් කිරීමෙන් ඔබ්බට ගොස් ශ්‍රී ලංකාවේ නාගරික පාලනය හමුදාකරණය කිරීම සමාජීය, ආර්ථික හා දේශපාලනික ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිසංවිධානය කිරීම ද ඇතුළත් බෙහෙවින් පුළුල් සංසිද්ධියක් ලෙස තේරුම් ගත යුතුව ඇත.[20] නාගරික සංවර්ධන අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගැනීම ද ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පාවිච්චි කිරීම සීමා කිරීම අදහස් කර ගෙන ම කරන ලද්දක් බව යුද්ධය අවසන්ව දෙවසරකට ආසන්න කාලයක් තිස්සේ හදිසි අවස්ථා රෙගුලාසි මාලාවක් පනවමින් කොළඹ මහ නගර සභා (CMC) මැතිවරණය කල් දමන විට පැහැදිලි විය. කොළඹ මහ නගර සභා මැතිවරණය පැවැත්වුණේ මේ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පැනවූ නඩුව ද ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු විභාග ගණනාවකින් අභියෝගයට ලක් වීමට ඔන්න මෙන්න කියා තිබිය දී පමණකි.[21]

හමුදාවේ අතිවිශාල මානව, මූල්‍ය හා තාක්ෂණික සම්පත්වල පිටුබලය ලද නාගරික සංවර්ධන අධිකාරියත් එහි දේශපාලන බලපෑමත් කොළඹ මහ නගර සභාව හුදු සේවා සම්පාදකයෙකු පමණක් බවට පහත හෙලා ඇත. පළාත් පාලන ආයතනයට තේරී පත් වූ නියෝජිතයන්ට නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය තුළ කිසිදු සැලකිය යුතු මතවාදී නියෝජනයක් නොමැති වීමත් හමුදාවේ/නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය පැතිරී ඇති තරමත් සැලකිල්ලට ගන්නා විට සමස්ත ඉඩම් අත්පත් කර ගැනීමේ හා වෙනත් ස්ථානවල පදිංචි කිරීමේ ක්‍රියාවලිය ම තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවල සීමාවෙන් ඔබ්බෙහි ය. පීඩාවට පත් ප්‍රජාවන් හා ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන් එම ක්‍රියාවලියට බලපෑම් කිරීමට දරන පරිශ්‍රම මේ නිසා සැබෑ ලෙස ම උදාසීනත්වයට පත් වේ. දේශපාලන නියෝජිතයන් ‘සම්බන්ධ වීම’ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (UPFA) නියෝජිතයන් සම්බන්ධ වීමට පමණක් සීමා වී ඇති අතර, චාරිත්‍රයක් වශයෙන් කෙරෙන්නක් හෝ ප්‍රජාවන්ට ඔවුන්ගෙන් (නව නිවාස සඳහා මූලික ගෙවීම් කිරීමේ දී සහාය වීම

---

[19] විශ්ලේෂණයක් සඳහා Cementing Hegemony: Politics of Urban Transformation in Post-War Colombo, Economic & Political Weekly, xlvlil වෙළුම, අංක 34 බලන්න.

[20] විශ්ලේෂණයක් සඳහා B. Skanthakumar, Growth With Inequality: The Political Economy Of Neoliberalism In Sri Lanka, Country Paper For The South Asia Alliance For Poverty Eradication (SAAPE) Crises, Vulnerability And Poverty In South Asia, 2013 බලන්න.

[21] Dr. Paikiasothy Saravanamuttu vs. Mahinda Deshapriya (SC FR 251/2011) බලන්න. Daily Mirror, “FR petition for CMC elections filed in SC,” 2011 ජූනි 21 ද බලන්න.

වැනි) සහන ඉල්ලා සිටීමට සිදු වන විට හෝ ප්‍රජාවන් (නැවත පදිංචි කෙරෙන අඩවිවල නිවාස වෙන් කිරීමේ දී සිදු වන වැරදි වැනි) සිය දුක් ගැනවිලිවලට විසඳුම් සොයන විට තම අනුග්‍රාහකාත්මක ජාල ශක්තිමත් කර ගැනීමේ අදහසින් කෙරෙන්නක් බවට පත්ව ඇත.

## බලහත්කාරී නෙරපා හැරීම් හා කොළඹ පවතින ඉඩම් පිළිබඳ දේශපාලන ආර්ථිකය

රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන මහින්ද චින්තන 2010 තුළ සාරාංශ කර ඇති පරිදි නාගරික සංවර්ධනයේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ "කොළඹ පිහිටි ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදුව නැති ජනාවාස පෞද්ගලික සංවර්ධකයන් මාර්ගයෙන් වැඩි දියුණු කිරීම හා ප්‍රශස්ත තත්වයේ ඉඩම් වාණිජ ක්‍රියාකාරකම් සඳහා මුදා ගැනීම (මෙසේ සඳහන් විය) යි. මෙම ක්‍රියාවලිය හරහා ප්‍රශස්ත තත්වයේ පවතින ඌන උපයෝජිත නාගරික ඉඩම් පෞද්ගලික අංශය විසින් සංවර්ධන හා වාණිජ අභිමතාර්ථයන් උදෙසා යොදා ගැනෙනු ඇත."[22] සැබවින් ම, එවැනි ඉඩම් 'මුදා ගැනීමකින්' "වාණිජ හා මිශ්‍ර සංවර්ධනය සඳහා යොදා ගත හැකි ප්‍රශස්ත තත්වයේ ඉඩම් අක්කර 350ක් පමණ නිදහස් වන" බවත් "2015 වන විට පැල්පත්වාසීන් සඳහා මහල් නිවාස ඒකක 40,000ක් ද කලින් ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදුව නැති ප්‍රදේශ සඳහා සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී මහල් නිවාස 20,000ක් ද ඉදි වන" බවත් මහින්ද චින්තන පැහැදිලිව ප්‍රකාශ කරයි.[23]

තව දුරටත් කිව හොත්, මේ ඉඩම් "ඌන උපයෝජිත" යැයි පැවසීමෙන් අදහස් වන්නේ කුමක් දැයි විස්තර කර නොමැති නමුත් සමීපව කියැවීමෙන් හැඟෙන්නේ මෙහි සැබෑ අදහස මේ ඉඩම් පෞද්ගලික වාණිජමය භාවිතය සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි බව යි. බොහෝ විට දශක ගණනාවක් තිස්සේ දුප්පත් හෝ අඩු-මැදි ආදායම්ලාභී ප්‍රජාවන්ට නිවහනව තිබූ මෙම "ප්‍රශස්ත තත්වයේ ඌන උපයෝජිත නාගරික ඉඩම්" පෞද්ගලික අංශයට පැවරීම නිසා සාධාරණත්වය පිළිබඳ බැරෑරුම් සැලකිලිමත් වීම් ඇති වේ. එමෙන් ම, "දුප්පතුන් සඳහා මහල් නිවාස ඒකක 40,000ක්" ඉදි කිරීම සහ "සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී මහල් නිවාස 20,000ක්" ඉදි කිරීම එකිනෙකට සමාන බව අඟවන සරල සමීකරණයෙන් බොහෝ ඔබ්බට ඒවා ගමන් කරයි. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ මෙම පැතිකඩ හා අනෙක් පැතිකඩවල් සම්බන්ධයෙන් ක්‍රමානුකූල පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් යන්තමින් හෝ කර ඇත් නම් එම විශ්ලේෂණය කිසි විටෙක පාර්ලිමේන්තු හා මහ නගර සභා විවාදයට හෝ මහජනයා අතර සියුම් පරීක්ෂාවට ලක්ව නොමැති බව කිව යුතු ය.

පෞද්ගලික සංවර්ධකයන් හා ප්‍රාග්ධනය මත රඳා පැවතීම දෙසට සිදු වන මෙම මාරු වීම තේරුම් ගත යුත්තේ මහින්ද චින්තනයෙහි සඳහන් නිර්දේශය පදනම් කර ගනිමිනි. එහි මෙසේ සඳහන් වේ: "**සංවර්ධකයෙකුගේ හා මූල්‍ය සම්පාදකයෙකුගේ සිට නියාමකයෙකු හා පහසුකම් සපයන්නෙකු දක්වා මාරු වෙමින් නිවාස අංශය තුළ රජය ඉටු කරන කාර්ය භාරයෙහි දැන් සිදු වෙමින් පවතින වෙනස අඛණ්ඩව සිදු වනු ඇත.** ක්‍රමෝපායාත්මක නිවාස ආයෝජන විශේෂයෙන් ම අනතුරට පත්වීමට ඉඩ ඇති ජනගහනයන් ඉලක්ක කර ගැනීමට සහ හදිසි අවශ්‍යතා සැපිරීමට කරන එවැනි ආයෝජන තව දුරටත් රජය විසින් කළ හැකි ය. කෙසේ වෙතත්, නිවාස සංවර්ධනය සම්බන්ධයෙන් අභිමත විකල්පයන් ක්‍රියාත්මක විය යුත්තේ පෞද්ගලික අංශය සක්‍රියව සම්බන්ධ වීම හරහා ය"[24] (අවධාරණය එකතුකරන ලදී).

රජය 'සංවර්ධකයා හා මූල්‍ය සම්පාදකයා' ලෙස සිටීමෙන් ඈත් වීමේත් ඒ වෙනුවට පෞද්ගලික අංශයේ ප්‍රධානත්වය අවධාරණය කිරීමේත් ඍජු ප්‍රතිවිපාකයක් වන්නේ නිවස හා ඊටත් වඩා ඉඩම වෙළඳ භාණ්ඩ බවට ඌනනය වී ඒවායේ මූලික වටිනාකම මූල්‍යමය බවට පත් වීමත් ඒවායේ සමාජීය වටිනාකම හෙවත් ජනතාවගේ අයිතිවාසිකම් හා හිමිකම් සහ රජය එම අයිතිවාසිකම් හා හිමිකම් මූර්තිමත් කරමින් පවත්වා ගෙන යන බැඳීම් අහිමි වී යාමත් ය. එසේ ම, 'නියාමකයා හා මූල්‍ය සම්පාදකයා' ලෙස රජය ඉටු කරන කාර්ය භාරය පැහැදිලිව නිර්වචනය කර ඇති අතර, ඒ

---

[22] Mahinda Chintana: A Ten year Horizon development Framework 2006-2016, සාකච්ඡා පත්‍රිකාව, 115 පි.
[23] Mahinda Chintana 2010, 174 පි.
[24] Mahinda Chintana 2010, 174 පි.

අනුව එහි කාර්ය භාරය වන්නේ ජනතාවගේ අයිතිවාසිකම්වල හා හිමිකම්වල ආරක්ෂාව සහතික කිරීම නො ව පෞද්ගලික ප්‍රාග්ධනයට "සිත් ගන්නාසුලු දිරි දීම්" සැපයෙන බවටද හා එමගින් " හිතකර ප්‍රතිපත්තිමය වාතාවරණයක් නිර්මාණය වන" බවට ද "සංවර්ධන පාලන රෙගුලාසි හා අනුමැතිය ලබා දීමේ ක්‍රියා පටිපාටි වඩා සරල හා වඩා කාර්යක්ෂම" කෙරෙන බවට ද සහතික කිරීම යි.[25]

මෙය අකුරට ම අනුගමනය කරනු ලැබේ. උදාහරණයක් ලෙස, පෞද්ගලික සංවර්ධකයෙකුට පැවරූ පළමු ඉහළ පෙළේ ව්‍යාපෘතීන්ගෙන් එකක් වන (ඉන්දියාවේ ක්‍රිෂ් ගෘහ ආයතනයට පැවරූ) ඩොලර් මිලියන ගණනක් වටිනා සුඛෝපභෝගී මිශ්‍ර ප්‍රයෝජන සහිත 'ට්‍රාන්ස්වර්ක්ස් හවුස්' ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය[26] සඳහා සම්පාදනය කළ දිරි දීම් සලකා බැලිය හැකි ය. ඉඩම ශ්‍රී ලංකා රුපියල් බිලියන 5ක් වැනි මුදලකට 99 අවුරුද්දකට ක්‍රිෂ් සමාගමට බදු දීම, 10 වසරක ආදායම් බදු විරාමයක් ලබා දීම, ඊළඟ 15 වසර සඳහා සහනදායක සියයට 6ක බද්දක් නියම කිරීම, වසර 11ක් යන තුරු කොටස්කරු ලාභාංශ බදුවලින් නිදහස් කිරීම සහ තවත් තීරු බදු හා ආදායම් බදු මාලාවකින් නිදහස් කිරීම එම දිරි දීම්වලට ඇතුළත් විය.[27] එමෙන් ම, දැවැන්ත බදු ප්‍රතිලාභ සැලසීම,[28] ආර්ථික සේවා ගාස්තු අඩු කිරීම, ආනයන තීරු බදු අඩු කිරීම යනාදියට ඉඩ සැලසෙන ක්‍රමෝපායාත්මක සංවර්ධන පණතේ විෂය පථය යටතේ හෝටල් හා සූදු පොළවල් ඇතුළු වෙනත් පෞද්ගලික ඉඩම් ප්‍රතිසංවර්ධන මුල පිරීම් ආරම්භ කිරීම සඳහා වන යෝජනා ද එහි අඩංගු ය.[29] එපමණක් නො ව, සංවර්ධන හිමිකම් පිරිනැමීමේ ක්‍රියාවලිය තුළ විනිවිද භාවයක් නොමැතිකම — බොහෝ ඒවායේ තිබෙන්නේ තනි ලංසුවක් නොහොත් තරගකාරී නොවන පිරිනැමීම් ය — හා මහා පරිමාණ දූෂණ පිළිබඳව එල්ල වන චෝදනා සම්බන්ධයෙන් ද බොහෝ සැලකිලිමත් වීම් ඇති වී ඇත.[30]

අන් අයුරකින් කිව හොත්, විශේෂයෙන් ම මූල්‍ය දිරි දීම් හා ඇප වීම් මාලාවක් සමග සියලු 'බැඳීම්වලින්' නිදහස් ඉඩම් සම්පාදනය කරමින් විදේශීය හා දේශීය පෞද්ගලික ආයෝජකයන්ට බැරෑරුම් සහනාධාර හා ආධාර සම්පාදනය කරන තාක් දුරට රජය ඇත්ත වශයෙන් ම කරන්නේ පුරවැසියන් වෙනුවෙන් නො ව දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයන් වෙනුවෙන් 'සංවර්ධකයෙකු හා මූල්‍ය සම්පාදකයෙකු' ලෙස ක්‍රියා කිරීම යි.

මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) යටතේ 1978 දී පිහිටුවන ලැබූ අපනයන ප්‍රවර්ධන කලාප කම්කරු අයිතිවාසිකම්වලට හානිකර අයුරින් විදේශීය සමාගම්වලට හා ප්‍රාග්ධනයට වාසිදායක රෙගුලාසි සම්පාදනය කළ පරිදි ම අද දින කොළඹ සිදු වන නාගරික සංවර්ධනය ද පුරවැසි අවශ්‍යතාවන් පරදුවට තබමින් බලගතු දේශීය හා ගෝලීය අවශ්‍යතාවන්ට අනුග්‍රහ දක්වයි. ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සාමූහිකය නමැති සංවිධානය සඳහන් කර ඇති පරිදි "කොළඹ සිදු වන නාගරික සංවර්ධනය අවස්ථා හඳුනා ගෙන නගරය අලංකාර කරන මධ්‍යස්ථ ව්‍යායාමයක් නො වේ," බලගතු ගෝලීය හා දේශීය ප්‍රාග්ධන ජාල සම්බන්ධ බව ඇඟවෙන "නිශ්චිත දේශපාලන අවශ්‍යතා" පිළිබිඹු කරන්නකි.[31] එපමණක් නො ව, කොළඹ පෞද්ගලික ව්‍යාපාරවල වාසිය තකා දැන් ප්‍රසිද්ධියේ සිදු වන ඉඩම් අත්පත් කර ගැනීම බොහෝ විට හමුදාව සම්බන්ධ කර ගෙන පහසුකම් සපයන සංචාරක ව්‍යාපාරයේ, කාර්මික හා ආර්ථික සංවර්ධනයේ හෝ සුරක්ෂිතතාවේ නාමයෙන් රට පුරා සිදු වන වඩා පුළුල් 'ඉඩම් ඩැහැගැනීමක' කොටසකි.[32] 'ප්‍රශස්ත තත්වයේ ඉඩම්' බලාත්කාරයෙන්

---

[25] Mahinda Chintana 2010, 176 පි.

[26] The Island, "Krrish Lanka to partner Ritz Carlton," 2012 දෙසැම්බර් 6.

[27] Lanka Business Online, "Sri Lanka Krrish project gets sweeping tax breaks,"2012 ඔක්තෝබර් 8.

[28] සමහර අවස්ථාවල දී වසර 25ක් තරම් දීර්ඝ කාලයකට බදුවලින් නිදහස් කෙරිණ.

[29] CalvinAyre.com, "Sri Lankan Government's Proposed Tax Breaks For Casinos Criticized," 2013 මාර්තු 16.

[30] The Island, "Ranil queries lease of Fort land to KRRISH," 2012 නොවැම්බර් 6. ඊට දැක්වූ ප්‍රතිචාරය සඳහා The Island, "Minister explains Transworks property transfer to Krrish Group," 2012 නොවැම්බර් 9 බලන්න.

[31] The Island, "Towards a World-Class Colombo: Development without Democracy," 2013 ජූනි 16.

[32] උදාහරණ ලෙස බලන්න: The Investigative Report On The Looting Of Sustenance Lands Belonging To Kalpitiya Island Inhabitants: Study of the issues on Land Grabbing and its Socio-Cultural, Economic and Political Implications on Kalpitiya Island Communities, Herman Kumara (සංස්.), ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය [NAFSO], 2013 අප්‍රේල්; B. Fonseka සහ D. Jegatheeswaran, "Politics, Policies and Practices with Land Acquisitions and Related Issues in the North and East of

අත්පත් කර ගෙන අනතුරුව ඒවා විනිවිද භාවයෙන් තොර ක්‍රියාවලි ඔස්සේ හා සැක සහිත කොන්දේසි මත පෞද්ගලික ව්‍යාපාරවලට පවරා දීම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්ගේ නාමයෙන් හා "හොර රහසේ පෞද්ගලීකරණය කිරීමකට" බෙහෙවින් සමාන ස්වරූපයකින් රාජ්‍ය ධනය පෞද්ගලික අත්වලට ක්‍රමයෙන් මාරු වී යාමක් ද පෙන්නුම් කරයි."[33]

වෙනත් ස්ථානවල පදිංචි කිරීම යුක්ති සහගත කිරීම සඳහා යොදා ගන්නේ 'සංවර්ධනය' ගැන නැවත නැවතත් කීම පමණක් නො වේ. විශේෂයෙන් ම කොළඹ දුප්පත් වැසියන්ට වඩා හොඳ නිවාස හා සැප පහසුකම් සම්පාදනය කිරීමට නම් පෞද්ගලික අංශය නාගරික ඉඩම් භාවිතයෙන් ලැබෙන ආදායම අවශ්‍ය ය යන ප්‍රකාශය ද ඒ සඳහා නිරතුරුව යොදා ගනු ලැබේ. එහෙත් යථාර්ථය වන්නේ ලෝටස් කුලුන හා කොළඹ වරාය නගරය වැනි මහජන උපයෝගිතාවක් ඇත් ද යන්න සැක සහිත වූත් පරීක්ෂාවට ලක් නොකළා වූත් මතුපිට අටෝපෘනිශ්පල ව්‍යාපෘති සඳහා දැවැන්ත ණයවලට යට වෙමින් සිටීම යි. මෙකී ව්‍යාපෘති දෙක සඳහා ඩොලර් මිලියන ගණනින් අරමුදල් සැපයෙන්නේ චීනයෙන් ලබා ගන්නා ණය මගිනි. බෙහෙවින් අවශ්‍ය ගංවතුර පාලන වැඩ පිළිවෙළවල් හැරුණු විට පසු ගිය වසර තුන තුළ සිදු වූ කොළඹ නාගරික සංවර්ධනයෙන් වැඩි හරිය සැබවින් ම අවධානය යොමු කළේ ගෝලීය ප්‍රාග්ධනය, සංචාරක ව්‍යාපාරය හා විනෝදායනය සඳහා මධ්‍යස්ථානයක් ලෙස නගරයේ වාණිජ මුහුණුවර වෙනස් කිරීම කෙරෙහි ය. මේ 'ප්‍රතිසංවර්ධනය' ඍජුව හා වක්‍රව යන දෙයාකාරයෙන් ම රාජ්‍ය සම්පත් සැලකිය යුතු ප්‍රමාණයක් කා දමන නමුත් සියල්ලන් ඇතුළත් කර ගැනීම හෝ සාධාරණත්වය වැඩි දියුණු නො කරයි.

එපමණක් නො ව, විශේෂයෙන් ම අදාළ කොන්දේසි තීරණය කරන්නේ බලයෙහි සිටින්නන් බැවින් මෙන් ම දැක්ම ස්වදේශීය නොවන බැවින් ද සුන්දර කිරීම පිළිබඳව කෙරෙන අවධාරණය කිසි සේත් ම දේශපාලනිකව මධ්‍යස්ථ වූවක් නො වේ. කොළඹ ඇති වෙමින් පවතින නාගරික පෙනුම හා සෞන්දර්ය තන්ත්‍රය කෙරෙහි බෙහෙවින් ම බලපා ඇත්තේ "ලෝක මට්ටමේ" නගරයක[34] පෙනුම කුමක් විය යුතු ද යන්න පිළිබඳව පවත්නා ආධිපත්‍යධාරී අදහස් වන අතර, එය සිංගප්පූරුව හෝ ෂැංහයි වැනි නගරයක් බවට පරිවර්තනය කිරීමට ප්‍රාර්ථනා කරමින් බොහෝ විට කෙරෙන ප්‍රකාශවලින් ඒ බව පැහැදිලි වේ. අව්‍යාජ ලෙස සියල්ලන් ඇතුළත් කර ගැනීම ප්‍රවර්ධනය කිරීම වෙනුවට – රජයේ ගොඩනැගිලි පරිශ්‍රයන් හෝ උද්‍යාන වටා ඇති තාප්ප ඉවත් කරන අතර ම එම ස්ථාන පාලනය කිරීම වැඩි කිරීම[35] යනාදී වශයෙන් – පෙරමුණු සුන්දර කොට අනෙක් තැන් බැහැර කිරීමට යොමු වීමේ ප්‍රවණතාවක් මේ තුළ නිසැකව ම ඇත. සියලු පොදු ස්ථානවල තරගකාරී ස්වභාවයක් පවතිද්දී ඒ බව නො තකා සියල්ලන් ඇතුළත් කර ගත් ස්ථාන නිර්මාණය කිරීමක් ගැන නාගරික සංවර්ධන අධිකාරිය කරන ප්‍රකාශ එක් මෑත අධ්‍යයනයකින් ප්‍රශ්නයට බඳුන් කෙරේ. අඩුවෙන් ලේඛනගත පොදු ස්ථාන වෙනුවෙන් කතා කරමින් එය සඳහන් කරන්නේ කොළඹ ඇති වෙමින් පවත්නා පොදු ස්ථානවල "පමණ ඉක්මවා සාදා සකස් කිරීමේ හා පමණ ඉක්මවා අලංකාර කිරීමේ" හෝ "නිශ්චිත ආදායම්ලාභීන් කණ්ඩායමකට පමණක් ආරාධනා කිරීමේ" ලක්ෂණය බොහෝ විට දක්නට ලැබෙන බව යි.[36]

කොළඹ මහ නගර සභා ප්‍රදේශය රට තුළ පවත්නා වැඩි ම ජනවාර්ගික මිශ්‍රණයක් සහිත ප්‍රදේශවලින් එකක් බව සැලකිල්ලට ගෙන එවැනි පෙරමුණු හා බැහැර කිරීම් සලකා බැලීම ද තීරණාත්මක වේ. පවත්නා තොරතුරුවලින් ඇඟවෙන්නේ මෙහි අහිතකර බලපෑමට ලක් වූ

---

Sri Lanka", විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2013 නොවැම්බර්; M. Raheem, "Protracted Displacement, Urgent Solutions: Prospects for Durable Solutions for Protracted IDPs in Sri Lanka," CPA, 2013.

[33] B. Skanthakumar, "Growth With Inequality: The Political Economy Of Neoliberalism In Sri Lanka", Country Paper For The South Asia Alliance For Poverty Eradication (SAAPE) Crises, Vulnerability And Poverty In South Asia, 2013.

[34] *"Rule by Aesthetics: World- Class City Making in Delhi,"* D.A. Ghertner, in Ananya Roy and Aihwa Ong (සංස්.), Worlding Cities: Asian Experiments and the Art of Being Global, Blackwell, 2011 බලන්න.

[35] සුන්දර කිරීමත් විනයගත කිරීම හා පාලනය කිරීම වැඩි වීමත් අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ විශ්ලේෂණය පිළිබඳව කළ විශ්ලේෂණයක් සඳහා *"Cementing Hegemony: Politics of Urban Transformation in Post-War Colombo,"* Economic & Political Weekly, xlvIiI වෙළුම, අංක 34 බලන්න.

[36] "Public Space and Quality of Life: A Case Study of Mount Lavinia Beach," Debra Efroymson සහ Udan Fernando, 2013 ජුලි, 51 පි.

ජනගහනයෙන් විශාල කොටසක් දෙමළ හා මුස්ලිම් අය බව යි. එමෙන් ම, මෙම ප්‍රජාවන්ගෙන් විශාල කොටසක් දේශපාලන විපක්ෂයේ කොටසක් සමග පෙළ ගැසී සිටින බැවින් නෙරපා හැරීම් පසුපස දේශපාලන චේතනාවන් පැවතිය හැකි බවට ද ප්‍රශ්න මතු වී ඇත.[37]

## ලෝක බැංකුවේ කාර්ය භාරය

විදේශීය ප්‍රාග්ධනය ඉටු කරන කාර්ය භාරය ගැන සඳහන් කළ බැවින් අවසන් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය ආයතන විශේෂයෙන් ම ලෝක බැංකුව (WB) ඉටු කරන කාර්ය භාරය ගැන සඳහන් කිරීම වැදගත් වේ. එය ශ්‍රී ලංකා රජයේ සංවර්ධන හා ආර්ථික ප්‍රතිපත්තිවලට දක්වන සහාය මුළුමනින් ම රඳා පවතින්නේ විශේෂයෙන් ම මහින්ද චින්තනය තුළ පිළිරැව් දෙන තරගකාරී නාගරික සැකැස්මවල් නිර්මාණය කර[38] රටේ ආර්ථික සැකැස්ම නැවත හැඩ ගැස්වීම සම්බන්ධයෙන් බැංකුවට පවත්නා ඉදිරි දැක්මවල්[39] මත ය. ප්‍රාදේශීය සංවර්ධන අසමතුලිතතාවන් පසුපස පවතින ඓතිහාසික හේතු සහ යුද්ධය හා එහි ප්‍රතිවිපාක ප්‍රමාණවත් ලෙස සැලකිල්ලට ගැනීමට අසමත් වීම ඇතුළු නොයෙක් කරුණු පදනම් කර ගෙන ලෝක බැංකුව නිර්දේශ කරන ප්‍රවිෂ්ටය විවේචනයට ලක් කර ඇතත් ඒ අතරින් මේ වාර්තාව සඳහා වඩාත් ම අදාළ වන්නේ ලෝක බැංකුව "දුර්වල වෙමින් පවතින ප්‍රජාතන්ත්‍රවාදය පරදුවට තබමින් වෙළඳ පොළේ 'කාර්යක්ෂමතාව'" අවධාරණය කරන බවට කෙරෙන විවේචනය යි.[40] ලෝක බැංකුව නාගරික සංවර්ධන අධිකාරියට දෙන අඛණ්ඩ සහායෙන් තරම් අන් කිසිවකින් මෙය වැඩියෙන් පැහැදිලි නො වේ. ජනතා සහභාගිත්වය, දේශීය ප්‍රජාතන්ත්‍රවාදය හා වග වීම ගැන ලෝක බැංකුව කරන සිත් ගන්නාසුලු කතා තිබිය දී ම නාගරික සංවර්ධන අධිකාරියේ රැකවල් යටතේ සිදු වන හමුදාකරණය හා දේශීය ප්‍රජාතන්ත්‍රවාදයේ ඛාදනය නිහඬව අනුමත කරමින් ලෝක බැංකුව නාගරික සංවර්ධන අධිකාරියේ මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතියට (MCUDP)[41] එ.ජ.ඩො. මිලියන 213ක ණයක් සම්පාදනය කර ඇත.

ලෝක බැංකුව මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතියට අමතරව ගාල්ල හා මහනුවර නගර ප්‍රතිසංවර්ධනය සඳහා මුල පිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ අනුග්‍රහය යටතේ ක්‍රමෝපායාත්මක නගර සංවර්ධන ව්‍යාපෘතියට (SCDP) ද එ.ජ.ඩො. මිලියන 147ක ණයක් පිරිනමමින් සිටී.[42] ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් පිළිබඳ ලෝක බැංකු මාර්ගෝපදේශවලින් කොළඹ දී නෙරපා හැරෙන ප්‍රජාවන් ආවරණය නොවුණත් ඉහත සඳහන් ව්‍යාපෘතීන්ගෙන් පීඩාවට පත් වන ප්‍රජාවන් ආවරණය වන අතර, මෙම ව්‍යාපෘති සඳහා පුළුල් සමාජ-ආර්ථික අධ්‍යයනයන් පදනම් කර ගත් සවිස්තර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් (RAP) හා හිමිකම් රාමු සකසා ඇත.[43]

එක් අතකින්, නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට අයත් මහා පරිමාණ නැවත පදිංචි කිරීම් ඇතුළත් ව්‍යාපෘති අංශ සඳහා ලෝක බැංකුව හෝ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි ණය දෙන ආයතනවලින් අරමුදල් ලබා ගැනීමට උත්සාහ නොකරන බවක් පෙනේ. ඊට හේතු වන්නේ, උදාහරණයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් සැපයෙන දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දී හෝ ගාල්ල හා මහනුවර නගරවල ලෝක බැංකුවෙන් අරමුදල් සැපයෙන ව්‍යාපෘතිවල දී මෙන් එවැනි අරමුදල් සමග ඇඳී එන බැඳීම්වලට යටත් වන ලෙස

---

[37] Tisaranee Gunasekara, "The Sunday Leader, "Rajapaksas' Operation Colombo," 2010 සැප්තැම්බර් 26.
[38] Sri Lanka: Reshaping Economic Geography, ලෝක බැංකුව, 2010.
[39] එක්සත් ජාතීන්ගේ සංවිධානය හා හැබිටැට් ආයතනය ඒකාබද්ධව 2012 දී සකස් කළ *"Turning Sri Lanka's Urban Vision Into Policy and Action"* නමැති ලියවිල්ල මෙය තව දුරටත් දෝංකාර දෙවමින් විස්තර කරයි.
[40] කෙටි විවේචනයක් සඳහා The Island, "Urban Development: Where the World Bank Leads, Sri Lanka Follows," ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සාමූහිකය, 2013 ජූනි 23 බලන්න.
[41] මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය අවධානය යොමු කරන්නේ ගංවතුර පාලන වැඩ පිළිවෙළවල් වැඩි දියුණු කිරීම හා නගරය තුළ පයින් ගමන් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම කෙරෙහි සහ ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් අවම වශයෙන් ඇතුළත් වන වැඩ පිළිවෙළවල් කෙරෙහි ය.
[42] Project Information Document (PID), Appraisal Stage, වාර්තා අංකː PIDA2513, ලෝක බැංකුව, ශ්‍රී ලංකාව බලන්න.
[43] http://documents.worldbank.org/curated/en/docsearch/report/RP1580 වෙබ් පිටුවෙන් ලබා ගත හැකි ය, පිවිසීම 2014 මාර්තු 31. මේ වාර්තා ද එමෙන් ම ඒවායේ ක්‍රමවේදයන් හා සොයා ගැනීම් ද සෑම අතකින් ම පරිපූර්ණ යැයි අදහස් නොකෙරෙන නමුත් එවැනි අධ්‍යයනයන් සිදු කර ඇති බවත් මේ වාර්තා මහජනතාවට ලබා ගත හැකි බවත් සඳහන් කිරීම වැදගත් ය.

කෙරෙන බල කිරීම මග හැරීමේ වුවමනාව යි. කෙසේ වෙතත් අනෙක් අතින්, නාගරික සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධනයේ නාමයෙන් සැලසුම් සහගතව දහස් ගණනක් බලහත්කාරයෙන් නෙරපා හැරුණු අවස්ථා දැක දැක ම නොදුටුවා සේ සිටිමින් ලෝක බැංකුව එම ආයතනයට අඛණ්ඩව අරමුදල් සපයයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස රට තුළ පුරවැසි කොට්ඨාස දෙකක් නිර්මාණය වී ඇත. මින් එක් කොට්ඨාසයක් සමහර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හිමිකම් හා රැකවරණය ලැබීමට සුදුසු යැයි සැලකෙන අතර, අනෙක් කොට්ඨාසය සවිස්තරාත්මක හිමිකම් රාමුවක් නැතිව කෙරෙන නෙරපා හැරීම්වලට ද නාගරික සංවර්ධන අධිකාරියේ හා හමුදාවේ ත්‍යාගශීලී භාවයට හා පාලනයට ද ගොදුරු විය හැකි ය.

මෙම නෙරපා හැරීම් සිදු වන්නේ කොළඹ නාගරික ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියට අයත් ලෝක බැංකුවෙන් අරමුදල් සැපයෙන ව්‍යාපෘති අංශවල කොටසක් ලෙස නොවන බව මින් පැහැදිලි යැයි පැවසීම උපරිම මට්ටමින් ගත් විට වුව ද ඉතා ම දුර්වල යුක්ති සහගත කිරීමක් වේ. ලෝක බැංකුවේ සහාය ලබන මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය කොළඹ 'ප්‍රතිසංවර්ධනයේ' කොටසක් වන තරමට ම බලහත්කාරී නෙරපා හැරීම්වල ද කොටසක් වන අතර, මේ දෙක ම ක්‍රියාත්මක කරන්නේ නාගරික සංවර්ධන අධිකාරිය විසිනි. එම නිසා, හමුදාවෙන් පහසුකම් සපයනු ලැබ සිදු වන මෙම නෙරපා හැරීම්වලට ලෝක බැංකුව ඍජුව අරමුදල් නො සපයතත් එය නාගරික සංවර්ධනය සඳහා වඩා පුළුල් ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් කරන තාක් දුරට හා වෙනත් පෙරමුණුවල දී දැරෙන ප්‍රතිසංවර්ධන පරිශ්‍රමයන්හි දී නාගරික සංවර්ධන අධිකාරියට සක්‍රියව අරමුදල් සපයන තාක් දුරට කරන්නේ ඊට සහාය වීම යි. මේ අනුව, කොළඹ සිදු වන නෙරපා හැරීම් මෙන් ම ශ්‍රී ලංකාවේ අනෙක් මහ නගර හා නගරවල සිදු කිරීමට නියමිත නෙරපා හැරීම් ද ජාත්‍යන්තර සංවර්ධන ණය සම්පාදන ආශ්‍රිත දේශපාලන ආර්ථිකයකටත් සම්බන්ධ බව පැහැදිලි ය. තමන් සහාය දෙන ව්‍යාපෘති හා ආයතන නිර්ප්‍රජාතන්ත්‍රවාදී, නීතියෙන් බැහැර හෝ අසාධාරණ ලෙස නීතිමය, හමුදාකරණය කෙරුණු හා වෙළඳ පොළ හිතැති වඩා පුළුල් පාලන රාමුවේ කොටසක් වුව ද සංවර්ධනයේ නාමයෙන් ඒවා ශක්තිමත් කරන්නේ වුව ද මෙම දේශපාලන ආර්ථිකයේ උදව්වෙන් ණය දෙන්නන්ට තම දෑත් පිරිසුදු යැයි මවා පෑ හැකි ය.

## නිගමනය

ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අනුව "වෙනත් ස්ථානවල පදිංචි කිරීමෙන් කොළඹ අවට පවත්නා ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදුව නැති ජනවාසවලට" සැලසෙන ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ අතරට මේවා ඇතුළත් වේ:

> "නිවසක හිමිකරුවෙකු වීමේ නීතිමය අයිතිය හා ගෞරවය, ජනතාව අතර ව්‍යවසායකත්ව සංවර්ධනය, පිළිගත් රැකියා අවස්ථා
>
> "සමාජීය පිළිගැනීම, ස්ථිර ලිපිනයක්, වඩා යහපත් සමාජයක්, නීති විරෝධී ක්‍රියාකාරකම් තුරන් කිරීම
>
> "ළමයින්ට නිසි කාන්තාවන් හා තරුණ අධ්‍යාපනයක් වෙත වඩා යහපත් ප්‍රවේශයක් ලැබෙනු ඇත. සමාජය තුළ කාන්තාවන් පිළිගැනීම විවාහය පිළිබඳ වඩා යහපත් බලාපොරොත්තුවලට හේතු වේ."[44]
> *(රචනා ආකෘතිය හා භාෂාව මුල් ලියවිල්ලේ පරිදි ය)*

"සමාජීය පිළිගැනීම," "වඩා යහපත් සමාජයක්" හා "නීති විරෝධී ක්‍රියාකාරකම් තුරන් කිරීම" පිළිබඳව කරන අවධාරණයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රවිෂ්ටයට සැබවින් ම පදනම් වන අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සම්බන්ධයෙන් පවත්නා බෙහෙවින් අගති සහගත දැක්ම එළිදරව් වේ. වෙනත්

[44] Prospects of relocating underserved settlements in Colombo suburbs, ආරක්ෂක අමාත්‍යාංශය.

ස්ථානයක පදිංචි කළ පමණින් ම කාන්තාවන්ට "විවාහය පිළිබඳ වඩා යහපත් බලාපොරොත්තු" ඇතුළු වඩා ඉහළ සමාජ තත්ත්වයක් සැලසෙන්නේ ය යන අදහස තුළ දෝංකාර දෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ ද රජයේ ද ප්‍රතිපත්තිමය මැදිහත් වීම් පෝෂණය කරන ගැඹුරින් ම මුල් බැස ගත් පන්තිමය හා පීතෘ මූලික අගතීන් ය. වෙනත් ස්ථානවල පදිංචි කිරීමෙන් "තරුණ අධ්‍යාපනය" වැඩි දියුණු වන බවට කරන ප්‍රකාශ බෙහෙවින් අලංකාර ය. එහෙත් යථාර්ථයේ දී සත්‍යය වන්නේ මෙහි ප්‍රතිවිරුද්ධය යි. විශේෂයෙන් ම තමන් දැන් සිටින වටපිටාවේ ම තව දුරටත් පදිංචි වී සිටීමෙන් තම දරුවන්ට ජනප්‍රිය පාසල් වෙත ප්‍රවේශයක් ලැබීමට ඉඩ තිබිය දී එම වටපිටාවන්ගෙන් ඉවත් වන ලෙස ප්‍රජාවන්ට බල කෙරෙන විට සත්‍යය වන්නේ මෙහි ප්‍රතිවිරුද්ධය යි. "ව්‍යවසායකත්ව සංවර්ධනය" සම්බන්ධ සත්‍යය ද මෙය ම වන්නේ විශේෂයෙන් ම වෙනත් ජනාකීර්ණ ස්ථානවල පදිංචි කිරීමෙන් සැබවින් ම බොහෝ ජනයාගේ ජීවනෝපායන් කෙරෙහි සැලකිය යුතු අහිතකර බලපෑමක් සිදුව ඇති බැවිනි. මෙම වාර්තාවේ 2 වන කොටසේ දී මෙම ගැටලු විස්තරාත්මකව විමසා බැලේ.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නිවසකට "නීතිමය අයිතිය" හිමි වන්නේ නීතිය තුළ තහවුරු කර ඇති අනෙක් ව්‍යවස්ථානුකූල හා ව්‍යවහාරික අයිතිවාසිකම් පරදුවට තැබීමෙන් හා සැලකිය යුතු ආර්ථික පිරිවැයක් දැරීමෙන් පමණකි. කලින් සඳහන් කළ පරිදි හා පහත විස්තරාත්මකව තව දුරටත් සාකච්ඡා කෙරෙන පරිදි, සාධාරණ නීතිමය ක්‍රියාවලියක් නොමැතිකමෙන් හා හිමිකම් පිළිබඳ ක්‍රියාත්මක රාමුවක් නොමැතිකමෙන් සිදු වන්නේ අයිතිවාසිකම් බාදනය වැඩි වීම පමණකි. එනම්, ක්‍රියාවලිය නීතිගත කර තිබීමෙන් සිදු වන්නේ නීතියේ පාලනය නො ව නීතිය මගින් පාලනය කිරීමක් දෙසට යොමු වීමේ ප්‍රවණතාවක් තිබෙන බවත් තවත් ප්‍රමුඛ සැලකිලිමත් වීමක් වන ක්‍රියාත්මක නීතිමය පිළියම් වෙත ප්‍රවේශයක් නොපවතින්නේ ය යන කරුණත් අවධාරණය වීම පමණකි. අග්‍ර විනිශ්චයකාරවරිය දෝෂාභියෝගයට ලක් කිරීමත් හිටපු නීතිපතිවරයා – එම තනතුරේ බලතල මත නාගරික සංවර්ධන අධිකාරියට නීතිමය උපදෙස් සැපයුවේ ඔහු ය – අග්‍ර විනිශ්චයකාර තනතුරට පත් කිරීමත් නිසා හට ගත් භීතිය හේතුවෙන් නෙරපා හැරීම් සම්බන්ධ මූලික අයිතිවාසිකම් නඩුවල දී පිළියම් ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන හැකියාව සැබවින් ම මොට වී ඇති බව දැනට මත් ඔප්පු වී හමාර ය. ශ්‍රේෂ්ඨාධිකරණය එය විභාග කළ එක් නඩුවක දී මහජන අයිතිවාසිකම් කෙරෙහි සුළු සැලකිල්ලක් පෙන්වා ඇතත් එය වැඩි වශයෙන් කර ඇත්තේ ගැටලුව පිළිබඳ රජයේ හා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රවිෂ්ටය ආරක්ෂා කිරීම යි.[45] "කොළඹ දැන් සිදු වෙමින් පවතින සංවර්ධන වැඩ සටහන්වලට කිසිවෙකු බාධා නොකළ යුතු යැ"යි අගවිනිසුරුවරයා පැවසූ බව උපුටා දක්වා තිබිණ.[46] කොළඹ සිදු වෙමින් පවත්නා හා සිදු වීමට නියමිත නෙරපා හැරීම් හා ඒවායේ බලපෑම් සවිස්තරව විමසා බැලිය යුත්තේ ඒවා මෙකී වඩා පුළුල් ප්‍රතිපත්තිමය, නීතිමය හා දේශපාලනමය තත්වයේ කොටසක් ලෙස සලකමිනි.

[45] Colombo Telegraph, "Defence Ministry Slams Supreme Court; Cheats Displaced People With SC approval," 2013 නොවැම්බර් 25.
[46] World Socialist Website, "Sri Lankan chief justice backs Colombo evictions," 2013 ඔක්තෝබර් 5.

## 2 වන කොටස: කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම්වල අත්දැකීම — රැකවරණයන් දුර්වල කිරීම හා අයිතිවාසිකම් බාදනය කිරීම

සංවර්ධනය පදනම් කර ගත් නෙරපා හැරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්මවලින් හා මාර්ගෝපදේශවලින් කියැවෙන්නේ බලහත්කාරී නෙරපා හැරීම් "***පුද්ගලයන්, කණ්ඩායම් හෝ ප්‍රජාවන් බලහත්කාරයෙන් හෝ ස්වේච්ඡාමය නොවන ආකාරයෙන් නිවාසවලින් සහ/හෝ ඉඩම්වලින් සහ ඔවුන් අල්ලා ගෙන සිටි හෝ රැඳී සිටි පොදු දේපොළ සම්පත්වලින් අවතැන් කිරීමත්*** *එලෙස අදාළ නීතිමය හෝ වෙනත් රැකවරණ ආයතනික විධිවිධානවලින් තොරව හා එවැනි ආයතනික විධිවිධාන වෙත ප්‍රවේශය සැපයීමකින් තොරව යම් පුද්ගලයෙකුට, කණ්ඩායමකට හෝ ප්‍රජාවකට* යම් වාස භූමියක, වාසස්ථානයක හෝ ස්ථානයක රැකියාව කිරීමට හෝ *වාසය කිරීමට තිබෙන හැකියාව තුරන් කිරීම හෝ සීමා කිරීමත්* ඇතුළත් ක්‍රියාවන්ට සහ/හෝ ප්‍රමාද දෝෂයන්ට" සම්බන්ධ බව යි[47] (අවධාරණය එකතු කරන ලදී).

මින් අනතුරුව කෙරෙන සාකච්ඡාව කොළඹ සිදු වන නෙරපා හැරීම් අ) බලහත්කාරී හා ස්වේච්ඡාමය නොවන ආකාරයත්, ආ) නගරය තුළ පිහිටි යම් වාස භූමියක හෝ ස්ථානයක වාසය කිරීමට පුරවැසියන්ට තිබෙන හැකියාව තුරන් කිරීම හෝ සීමා කිරීම සඳහා සැලසුම් කර ඇති ආකාරයත්, ඇ) පිළියම් සහ අදාළ නීතිමය හා වෙනත් රැකවරණ ආයතන වෙත ජනතාවට සක්‍රිය ප්‍රවේශයක් සපයා දීම ප්‍රතික්ෂේප කරමින් අරඹා ඇති ආකාරයත් අවධාරණය කරයි. කොළඹ ස්ථාන තුනක දී නෙරපා හැරුණු ප්‍රජාවන් තුනක් පිළිබඳ කෙටි සිද්ධි අධ්‍යයනයන් ද දැනට මත් නෙරපා හැර ඇති හෝ එසේ නෙරපා හැරීමට මුහුණ දෙමින් සිටින වෙනත් ප්‍රජාවන්ට අයත් වැසියන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවන් ද පදනම් කර ගන්නා වාර්තාවේ මේ කොටස නගරයෙහි සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් සමන්විත වන නොයෙක් ආකාරයේ බරපතළ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ද සාධාරණ නීතිමය ක්‍රියාවලිය උල්ලංඝනය කිරීම් ද ඉස්මතු කර දක්වයි.

රටේ බලපවත්වන නීතිමය හා ප්‍රතිපත්තිමය රාමුවෙහි සැලකිය යුතු දුර්වලතා පවතින බවත් ඒවා නෙරපා හැරීම් සිදු කිරීමට හැකියාව ලබා දෙන බවත් ඉස්මතු කර දැක්වීම වැදගත් වේ. ජනතා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට අසමත් අසාධාරණ නීති හා රෙගුලාසි මෙන් ම නාගරික සංවර්ධන අධිකාරියට බලහත්කාරී නෙරපා හැරීම්වලට එරෙහිව රැකවරණයක් සහ ගොදුරු වූවන්ට පිළියම් හා සහන සපයන රටෙහි නීති හා ප්‍රතිපත්ති අදාළ කර ගැනීම හිතාමතා මග හැරිය හැකි බව සහතික වන හිදැස් ද මේ දුර්වලතා අතර පවතී. එම නිසා, අයිතිවාසිකම් හා සාධාරණ නීතිමය ක්‍රියාවලිය පිළිබඳ උල්ලංඝනයන්හි ස්වභාවය හා තරම ද අවබෝධ කර ගත යුත්තේ ඒවා රට තුළ දැනට පවත්නා හැකියාව ලබා දෙන ප්‍රගතිශීලී ජාතික ප්‍රමිතීන් හා සුරක්ෂිතතාවන් සමග මෙන් ම බලහත්කාරී නෙරපා හැරීම්වලින් හා ඒ ආශ්‍රිත මානව අයිතිවාසිකම් උල්ලංඝනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා සැලසුම් කර ඇති ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ගේ ද සන්ධර්භය තුලය.

### සංවර්ධනය පදනම් කර ගත් නෙරපා හැරීම් හා ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්: කෙටි සමාලෝචනයක්

2001 දී ශ්‍රී ලංකාව ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP) සම්මත කර ගත්තේ ය. එම ප්‍රතිපත්තිය ම එහි පූර්විකාවෙහි ('Rationale') සඳහන් කරන පරිදි, එය සම්මත කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාව තුළ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පවතින ප්‍රධාන නීතිමය රාමුව වන 1950 ඉඩම් අත්පත් කර ගැනීමේ පණත "ඉඩම්, ගොඩනැගිලි හා බෝග වගා සඳහා වන්දි ලබාදීම සඳහා පමණක්" සීමා වන බැවිනි. එමෙන් ම එම පණත, "අ) ජනතාවට ඇති වන බලපෑම

[47] මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, Basic principles and guidelines on development-based evictions and displacement.

මග හරින හෝ අවම කරන විකල්ප ව්‍යාපෘති අවස්ථා සොයා බැලීම, ආ) ඉඩම සඳහා හිමිකම් අයිතිය නොමැති අයට වන්දි ගෙවීම, ඇ) නැවත පදිංචි කිරීම පිළිබඳ විකල්පයන් සම්බන්ධයෙන් පීඩාවට පත් පුද්ගලයන්ගෙන් හා සත්කාරකයන්ගෙන් අදහස් විමසීම, ඈ) පීඩාවට පත් පුද්ගලයන් හා ඔවුන්ට සත්කාර කරන්නන් අතර සාර්ථක සමාජීය හා ආර්ථික ඒකාබද්ධතාවක් ඇති වීමට පහසුකම් සැපයීම සහ ඉ) පීඩාවට පත් පුද්ගලයන් සමාජීය හා ආර්ථික වශයෙන් පූර්ණ ලෙස පුනරුත්ථාපනය කිරීම වැනි නැවත පදිංචි කිරීම ආශ්‍රිත ප්‍රධාන ගැටලුවලට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන (PEA) විසඳුම් සෙවිය යුතු යැයි නියම නො කරයි."

ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා අවධාරණය කරන ප්‍රධාන 'ප්‍රතිපත්තිමය මූලධර්ම' අතරට මේවා ඇතුළත් වේ:

- "ව්‍යාපෘතිය සඳහා පවතින විකල්පයන් හා ව්‍යාපෘතිය තුළ පවත්නා විකල්පයන් ගැන සිතා බැලීම" මගින් ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් හැකි තාක් දුරට මග හැරීම හෝ අවම කිරීම.

- "පදිංචි කෙරෙන වෙනත් ස්ථාන, ජීවනෝපාය වන්දි හා සංවර්ධන විකල්ප සම්බන්ධයෙන් තේරීම් කිරීමේ දී" පීඩාවට පත් පුද්ගලයන් "පූර්ණ ලෙස සම්බන්ධ කර ගන්නා" බව සහතික කිරීම.

- "ඉඩම සඳහා ලිඛිත හිමිකම් අයිතියක් නොමැති පීඩාවට පත් පුද්ගලයන්ට සාධාරණ හා යුක්ති සහගත සැලකීමක් ලැබිය යුතු ය."

- "ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් හඳුනා ගෙන ඔවුන්ගේ ජීවන තත්වයන් ප්‍රමාණවත් ලෙස වැඩි දියුණු කර ගැනීම සඳහා නිසි සහායක් සම්පාදනය කළ යුතු ය."

*(ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳ පූර්ණ විස්තරයක් සඳහා 1 වන ඇමුණුම බලන්න)*

ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය "රජය විසින් කෙරෙන සංවර්ධනකාරී ඉඩම් අත්පත් කර ගැනීම් හෝ භුක්තිය ආපසු ලබා ගැනීම් සියල්ල" සඳහා ම අදාළ කර ගත හැකි අතර, "පවුල් 20ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් පීඩාවට පත් වන තැන්වල දී සවිස්තර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු" යැයි නියම කරයි. එපමණක් නො ව, එම ප්‍රතිපත්තිය " අරමුදල් මූලාශ්‍රය නො තකා සියලු ව්‍යාපෘතිවලට අදාළ වේ." කෙසේ වෙතත්, නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ සිදු කරන නෙරපා හැරීම්වල දී ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය අදාළ කර නොගන්නා අතර, කිසිදු සවිස්තර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම හෝ ප්‍රතිපත්තිය තුළ සාරාංශ කර ඇති ප්‍රතිපත්තිමය මූලධර්මවලට ගරු කිරීම සඳහා පියවර ගැනීම හෝ කර නැත.

සංවර්ධනය මගින් මෙහෙයවනු ලැබූ ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම්වලට අදාළව සැලකිය යුතු ජාත්‍යන්තර ප්‍රමිතීන් සංඛ්‍යාවක් තිබෙන බව සඳහන් කිරීම වැදගත් වේ. **සංවර්ධනය මගින් මෙහෙයවනු ලැබූ නෙරපා හැරීම් හා අවතැන් වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම** (එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ) මේ අතර ඇති වැදගත් ම ප්‍රමිතීන්ගෙන් එකකි. නෙරපා හැරීමට පෙර, නෙරපා හැරීම සිදු වන අතරතුර හා නෙරපා හැරීමෙන් පසුව පීඩාවට පත් පුද්ගලයන් සඳහා ඉතා වැදගත් ස්වාධීන හා ක්‍රියා පටිපාටිමය සුරක්ෂිතතාවන් හා රැකවරණයන් මාලාවක් සම්පාදනය කරන එම ප්‍රමිතිය විශේෂයෙන් ම ඒ සම්බන්ධයෙන් රජය මත නොයෙක් බැඳීම් පනවයි.

"නෙරපා හැරීම් සිදු වන්නේ සුවිශේෂ තත්වයන්හි දී පමණක් බව" රාජ්‍යයන් විසින් "සහතික කළ යුතු යැ"යි එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ පැහැදිලි ලෙස නියම කරයි. "නෙරපා හැරීම්වල දී ජාත්‍යන්තරව පිළිගත් මානව හිමිකම් මාලාවකට ම ඒවායින් ඇති වන හානිකර බලපෑම නිසා එවැනි නෙරපා හැරීම් පූර්ණ ලෙස සාධාරණීකරණය කළ හැකි මට්ටමක පැවැතිය යුතුය." (අංක 21). මෙහි දී විශේෂයෙන් ම අදාළ වන්නේ "මෙම ක්‍රියා පටිපාටිමය අවශ්‍යතා සැපිරීම මගින් සැපයෙන රැකවරණය නිවස හා දේපොළ සඳහා දේශීය නීතියට අනුකූල හිමිකම් අයිතියක් තිබෙන්නේ ද නැද්ද යන්න නො තකා ගොදුරු වීමට ඉඩ ඇති සියලු පුද්ගලයන්ට ද පීඩාවට පත් සියලු කණ්ඩායම්වලට ද අදාළ වේ" (අංක 21) යැයි එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශවල ඇතුළත් වන නියමය යි.

එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ අනුව ගත් විට, "නාගරික හෝ ග්‍රාමීය සැලසුම්කරණ හා සංවර්ධන ක්‍රියාවලීන්ට පීඩාවට පත් විය හැකි සියල්ලන් සම්බන්ධ කර ගත යුතු අතර, පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු යඃ"

- යෝජිත සැලසුම් හා විකල්පයන් සම්බන්ධයෙන් පැවැත්වෙන ප්‍රසිද්ධ විභාග කිරීම් ද ඇතුළු අවස්ථාවල දී පීඩාවට පත් විය හැකි සියලු පුද්ගලයන් වෙත නිසි නිවේදනයක් කිරීම;

- ඉඩම් වාර්තා ද ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම්වලට රැකවරණය සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් යෝජිත සවිස්තර නැවත පදිංචි කිරීමේ සැලසුම් ද ඇතුළු අදාළ තොරතුරු කල් තියා සාර්ථක ලෙස ප්‍රචාරය කිරීම;

- යෝජිත සැලැස්ම සමාලෝචනය කිරීම, ඒ පිළිබඳව අදහස් දැක්වීම සහ/හෝ විරුද්ධත්වය පළ කිරීම සඳහා ජනතාවට ප්‍රමාණවත් කාලයක් ලබා දීම;

- පීඩාවට පත් පුද්ගලයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් හා ඔවුන්ට ඇති විකල්පයන් පිළිබඳව නීතිමය, තාක්ෂණික හා වෙනත් උපදෙස් සැපයීම; සහ

- නෙරපා හැරීමේ තීන්දුවට අභියෝග කිරීම සහ/හෝ විකල්ප යෝජනා ඉදිරිපත් කිරීම සහ තම ඉල්ලීම් හා සංවර්ධන ප්‍රමුඛතා ප්‍රකාශයට පත් කිරීම සඳහා පීඩාවට පත් පුද්ගලයන්ට හා ඔවුන් වෙනුවෙන් පෙනී සිටින්නන්හට අවස්ථා සැපයෙන ප්‍රසිද්ධ විභාග පැවැත්වීම.

මේ නියමයන්ගෙන් බොහොමයක් ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය තුළ ද දෝංකාර දෙන නමුත් කොළඹ සිදු වන නෙරපා හැරීම්වල දී ඒ සියල්ල නො තකා හැර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය නෙරපා හැරෙන සියලු දෙනාට ම වන්දි ලබා දීම ප්‍රතික්ෂේප කර ඇතත් එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ (අංක 61) නිශ්චිතව අවධාරණය කරන්නේ "ක්‍රියාවලියේ දී අහිමි වූ හෝ හානි වූ මුල් වාසස්ථානය හා ඉඩම ද ඇතුළු බලපෑමට ලක් වූ තම දේපොළ නිසා ඇති වූ අහිමි වීම සඳහා, ඒවා නැවත ලබා ගැනීම සඳහා සහ ඒවා ප්‍රවාහනය කිරීම සඳහා වන්දි ලබා ගැනීමේ හිමිකම සිය දේපොළට හිමිකම් අයිතියක් ඇතත් නැතත් නෙරපා හැරෙන සියල්ලන්ට ම ලැබිය යුතු" බව ය. එපමණක් නො ව, ඉඩම් කැබලි, ඉදි කළ නිවාස, ඒවායේ තිබූ දෑ, උකස් හෝ වෙනත් ණය පිළිබඳ දඬුවම්, තාවකාලික හෝ විකල්ප නිවාස, නිලධාරී හා නීතිමය ගාස්තු, අහිමි වූ වැටුප්, ආදායම් හා ව්‍යාපාර, අහිමි වූ අධ්‍යාපන අවස්ථා, සෞඛ්‍ය හා වෛද්‍ය රැකවරණය සහ (විශේෂයෙන් ම ජීවනෝපාය මූලාශ්‍රයෙන් ඈත පිහිටි වෙනත් ස්ථානයක පදිංචි කෙරෙන විට) නැවත පදිංචි වීම හා ප්‍රවාහනය සඳහා දැරූ වියදම් ඇතුළු "අහිමි වීම් හා පිරිවැයවල් ආර්ථික හානිය පිළිබඳව කෙරෙන තක්සේරුවේ දී සැලකිල්ලට ගත යුතු" බව ද එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ (අංක 63) පැහැදිලිව සඳහන් කරයි.

එමෙන් ම, "තමන් වාසය කරන ඉඩමට කිසිදු පිළිගත් නීතිමය අයිතියක් හෝ හිමිකමක් නැති අය" ද ඇතුළු 'පීඩාවට පත් පුද්ගලයන්' ලෙස හඳුනා ගැනෙන සියල්ලන්ට "ඉඩම හැර වත්කම් අහිමි වීම්

සඳහා වන්දි ලබා දිය" යුතු බව **ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් පිළිබඳ ලෝක බැංකු මෙහෙයුම් ප්‍රතිපත්ති අංක 4.12** ද නියම කරයි. එපමණක් නො ව, නැවත පදිංචි කිරීමේ සැලැස්මට හෝ ප්‍රතිපත්තිමය රාමුවට පහත සඳහන් පියවරයන් ඇතුළත් විය යුතු බව ද මෙහෙයුම් ප්‍රතිපත්ති අංක 4.12 නියම කරයිඃ

(i) නැවත පදිංචි කිරීමට අදාළ විකල්පයන් හා අයිතිවාසිකම් පිළිබඳව අවතැන් වූවන් දැනුවත් කළ යුතු ය;

(ii) අවතැන් වූවන්ගේ අදහස් විමසා, තේරීම් කිරීමේ අවස්ථා ලබා දී, තාක්ෂණිකව හා ආර්ථිකව සාක්ෂාත් කර ගත හැකි නැවත පදිංචි කිරීමේ විකල්පයන් සම්පාදනය කළ යුතු ය, සහ

(iii) වත්කම් අහිමි වීම් පූර්ණ ලෙස හිලව් කිරීමේ වගකීම ව්‍යාපෘතියට ඍජුව පැවරෙන අවස්ථාවල දී කඩිනම් හා ප්‍රමාණවත් වන්දි ලබා දිය යුතු ය.

අවසන් වශයෙන්, "නිවස හෝ දේපොළ සඳහා දේශීය නීතියට අනුකූල හිමිකම් අයිතියක් තිබෙන්නේ ද නැද්ද යන්න නො තකා බලහත්කාරී නෙරපා හැරීම්වලට එරෙහි රැකවරණය ගොදුරු වීමට ඉඩ ඇති සියලු පුද්ගලයන්ට හා කණ්ඩායම්වලට අදාළ විය යුතු" බව එනම් "පොදු නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී ඒවා බලහත්කාරී නෙරපා හැරීම් යුක්ති සහගත කිරීම සඳහා කිසි ලෙසකින් වත් යොදා නො ගත යුතු" බව **ප්‍රමාණවත් නිවාස පහසුකම් සඳහා ඇති අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත** (Rapporteur) විසින් ද අවධාරණය කර ඇති බව සඳහන් කිරීම වැදගත් වේ.[48] එමෙන් ම, රාජ්‍යයන් බැඳී සිටින්නේ "නෙරපා හැරීම් සිදු වන්නේ අවසන් විසඳුමක් ලෙස පමණක් බව හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බව සහතික කිරීම" සඳහා පමණක් නොවන බව සහ "ආගමික හා ජනවාර්ගික සුළුතර කණ්ඩායම් සංවර්ධන ව්‍යාපෘතිවලින් පීඩාවට පත් වන්නේ විසමානුපාතිකව නොවන බව හා රජය විසින් සිදු කෙරෙන නිවාස හා ඉඩම් අත්පත් කර ගැනීම්වලට අභියෝග කිරීමට අවශ්‍ය නීතිමය පිළියම් ක්‍රම ඔවුන්ට තිබෙන" බව ද රාජ්‍යයන් විසින් සහතික කළ යුතු යැයි විශේෂ නියෝජිත (Rapporteur) සඳහන් කර ඇත.[49]

මෙම ප්‍රමිතීන් හා ප්‍රතිපත්තීන් අවධාරණය කිරීමෙන් සිදු වන්නේ බලහත්කාරී නෙරපා හැරීම් හා ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් නිසා අවදානම් මාලාවක් ඇති වන්නේ යැයි පිළිගැනීම බව අවධාරණය කිරීම වැදගත් වේ. උදාහරණයක් ලෙස, ලෝක බැංකුව සිය අත්දැකීම පදනම් කර ගෙන මෙසේ පවසයිඃ

> "සංවර්ධන ව්‍යාපෘති යටතේ සිදු වන ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් වල හානිකරබව අවම නොකළ හොත් බොහෝ විට දරුණු ආර්ථික, සමාජීය හා පාරිසරික අවදානම් ඇති කරයිඃ නිෂ්පාදන පද්ධති බිඳී විසිරී යයි, සිය නිෂ්පාදන වත්කම් හා ආදායම් අහිමි වන විට ජනතාව දිළිඳුකමට මුහුණ පායි, සිය නිෂ්පාදන නිපුණතාවල අදාළත්වය අඩු හා සම්පත් සඳහා වැඩි තරගකාරිත්වයක් පවත්නා පරිසරයන්හි ජනතාව පදිංචි කෙරේ, ප්‍රජා ආයතන හා සමාජීය ජාල දුර්වල වේ, නෑදෑ පිරිස් විසිරී යයි, සංස්කෘතික අනන්‍යතාව, සාම්ප්‍රදායික අධිකාරය හා එකිනෙකාට උදව් වීමට තිබෙන හැකියාව අඩු හෝ අහිමි වේ."[50]

48 A/HRC/16/42/Add.3 (SR Housing, 2011) බලන්න.
49 E/CN.4/2006/41/Add.2 (SR Housing, 2006) බලන්න.
50 World Bank, Operational Manual, OP 4.12 - Involuntary Resettlement.

## සිද්ධි අධ්‍යයනයන් හා ප්‍රමුඛ සැලකිලිමත් වීම්

නීතිමය ක්‍රියාවලියක් නොමැතිකම, ක්‍රියාත්මක පිළියම් වෙත ප්‍රවේශයක් නොමැතිකම හා ව්‍යවස්ථානුකූලව හා ජාත්‍යන්තරව පිළිගත් නොයෙක් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම ද ඇතුළු කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් නිසා ඇති වන මානව අයිතිවාසිකම් සැලකිලිමත් වීම් හා අවදානම් මාලාවට මිව්ස් වීදියේ නෙරපා හැරීම් උදාහරණ වන්නේ ය.

**මිව්ස් වීදියේ (Mews Street) සිද්ධිය**

2010 මැයි 8 වන දා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) කොළඹ 2 කොම්පඤ්ඤවීදියේ මිව්ස් වීදියෙහි පිහිටා තිබූ පවුල් 33ක් වාසය කළ නිවාස 20ක් කඩා බිඳ දැමී ය. පීඩාවට පත් පවුල්වල සමහර සාමාජිකයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ තම නිවාස හිස් කර දිය යුතු බව තමන්ට දැනුම් දුන්නේ ඒවා කඩා බිඳ දැමීමට මසකට පෙර බවත් ඒ බව ලිඛිතව දැනුම් දුන්නේ ඒවා කඩා බිඳ දැමීමට දින 3කට කලින් බවත් ය. විකල්ප නවාතැන් හෝ වන්දි පිළිබඳ යම් තොරතුරක් සැපයූ බව ඔවුහු කිසිවෙක් සඳහන් නො කළහ. මේ නිසා නාගරික සංවර්ධන අධිකාරියේ බලධාරීන් බුල්ඩෝසර රැගෙන සන්නද්ධ සොල්දාදුවන් ද සමග පැමිණි විට නිවැසියන් ප්‍රතිරෝධය පෑ නමුත් නිෂ්ඵල විය.

සිය දේපොළවලින් බොහොමයක් විනාශ වූ බැවින් නිවැසියන් අසරණ වූ අතර, සිය ඥාතීන්ගේ නිවෙස්වල හෝ අන් තැනක විකල්ප නවාතැනක් සොයා ගන්නා තෙක් දින 3-4ක් තිස්සේ ඔවුන්ට නවාතැන් දී එදිනෙදා ආහාර සැපයුවේ කොම්පඤ්ඤවීදි මුස්ලිම් දේවස්ථාන සම්මේලනය (FKM) යි. දෙමටගොඩ අලුතින් ඉදි කෙරෙන (මිව්ස් වීදියට කි.මී. 6ක් පමණ ඊසාන දෙසින් පිහිටි) නැවත පදිංචි කිරීමේ අඩවියක වසරක් තුළ ඔවුන්ගේ ස්ථිර නිවාස – බද්ධ නිවාස – සූදානම් වන තෙක් විකල්ප නවාතැනක් සපයා ගැනීම සඳහා සෑම කුටුම්බයකට ම මසකට රු. 8,000/- බැගින් වසරක කුලී දීමනාවක් ගෙවන බව අනතුරුව නාගරික සංවර්ධන අධිකාරිය ඔවුන්ට දැනුම් දුන්නේ ය.[51] ඔවුන්ට තොටළඟ පිහිටි තාවකාලික නැවත පදිංචි කිරීමේ යෝජනා ක්‍රමයක — "තනි කාමරයේ ලැලි ගෙවල් පේළි" යැයි "මැණික් ෆාම් 1 වන කලාපයේ" ප්‍රකාශකයන් දෙදෙනෙකු කී කතාව සිහි ගැන්වූ"[52] — විකල්ප නිවාස ලබා දුන් අතර, දෙමටගොඩ අලුතින් ඉදි කෙරෙන මහල් නිවාස සංකීර්ණයක් තුළ වසරක් ඇතුළත ස්ථිර නිවාස ලබා දෙන බවට පොරොන්දු විය. පසුව, බලහත්කාරයෙන් පළවා හැරුණු නිවැසියන්ට අන් තැනක ජීවත් වීමේ හැකියාව ලබා දීමට කුලී දීමනාවක් ද ගෙවනු ලැබිණ.

කෙසේ වෙතත්, ඔවුන් කිසිවෙකුට මේ බව හෝ නැවත පදිංචි කිරීමේ අඩවියෙහි බද්ධ නිවාස ලබා දෙන්නේ කිනම් කොන්දේසි යටතේ දැයි ලිඛිතව ප්‍රකාශ කළ යමක් ලැබුණේ නැත. ඔවුන් නෙරපා හැර වසරක් ගත වන විටත් නව මහල් නිවාස සූදානම්ව නොතිබූ අතර, නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුලී දීමනාව මසකට රු. 12,000/- සිට 15,000/- දක්වා වැඩි කළ හෙයින් තවත් වසරකට එක වර මුදලක් ලැබිණ. එහෙත්, දෙවන වසර අවසන් වන විටත් මහල් නිවාස සූදානම්ව නොතිබූ අතර, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් අවධාරණයෙන් කියා සිටියේ මාස කිහිපයක් තුළ මහල් නිවාස ලබා දෙන බවත් එම නිසා කුලී දීමනාව ලබා දෙන්නේ මාස 3-4 කොටස් වශයෙන් බවත් ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස කුලී දීමනාව ලබා ගැනීමේ දී පමා වීම් සිදු වූ අතර, පීඩාවට පත් නිවැසියන්ට එය ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත කිහිප වරක් යාමට සිදු විය.

ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කෙරුණු අතර, 2010 ජූනි 24 වන දා ඔවුන්ට එම පෙත්සම පවත්වා ගෙන යාමට අවසර ලැබිණ. බලහත්කාරයෙන් නෙරපා හැරුණු අයට

[51] The Sunday Times, "UDA offers Rs. 8,000 a month for Mews St. evictees," 2010 මැයි 16.
[52] Nicola Perera සහ Sivamohan Sumathy, Sri Lanka: Securing the city by evicting poor, Himal South Asian, 2010 ජූලි.

ස්ථිර විකල්ප නිවාස ලබා දෙන බවට නාගරික සංවර්ධන අධිකාරිය හා අධිකරණය සහතික විය.[53] එහෙත්, ජනාධිපතිවරයා 2013 නොවැම්බර් 18 වන දා දෙමටගොඩ පිහිටි දැන් මිහිඳු සෙන්පුර නමින් හැඳින්වෙන නව නැවත පදිංචි කිරීමේ සංකීර්ණය නිල වශයෙන් විවෘත කළ විට මිව්ස් වීදියෙන් නෙරපා හැරුණු කිසිවෙකුට එහි තිබෙන මහල් නිවාස 500න් එකක් වෙන් කර නොතිබූ අතර, ඒවා බෙදා දී තිබුණේ නගරයේ අන් තැන්වලින් නෙරපා හැරුණවුන් අතර ය. වසර තුන හමාරකට වැඩි කාලයක් ගත වී ඇතත් මිව්ස් වීදියෙන් නෙරපා හැරුණවුන්ට තව මත් විකල්ප නිවාස ලබා දී නොමැති නමුත් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියට එරෙහිව පියවර ගැනීම හෝ අධිකරණයේ පූර්ව ප්‍රතිඥාවන්/නියෝග බලාත්මක කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතික්ෂේප කෙරිණ.[54]

මෙහි ප්‍රතිඵලයක් ලෙස මේ වසර මුල දී ඒ වන විටත් ස්ථිර විකල්ප නිවාස ලැබී නොතිබූ මිව්ස් වීදි පවුල් 17කට (ඉහත මූලාශ්‍රය බලන්න) පවසන ලද්දේ නෙරපා හැරීම්වලින් පීඩාවට පත් වූවන් සඳහා තනි තට්ටුවේ නිවාස 40ක් ඉදි කෙරෙන දෙමටගොඩ පිහිටි වෙනත් ස්ථානයක ඔවුන්ට නව නිවාස ලබා දෙන බව යි. එහෙත්, ප්‍රජාවේ සමහර සාමාජිකයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ ප්‍රධාන මාර්ගයට බොහෝ ඈතින් හා මුඩුක්කු ප්‍රදේශයක් මැද පිහිටි බැවින් අලුත් ස්ථානය ගැන තමන්ගේ සතුටක් නැති බව යි. මෙය ලියන මොහොත වන විට ඔවුන් නෙරපා හැර වසර 4කට ආසන්න කාලයක් ගත වී තිබුණත් පොරොන්දු වූ ස්ථිර නිවාස ඔවුන්ට ලැබී නො තිබිණ.

කඩා බිඳ දැමුවේ පැල්පත් නිවාස යැයි නාගරික සංවර්ධන අධිකාරිය කියා සිටියත් නෙරපා හැරුණු සමහර අය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ තමන්ට තිබුණේ නිසි ලෙස ඉදි කරන ලද නිවාස බවත් සමහර නිවාස තට්ටු දෙකේ ඒවා බවත් ය. කෙසේ වෙතත්, ඔවුන් කියා සිටියේ නාගරික සංවර්ධන අධිකාරිය තමන්ට සලකා ඇත්තේ රජය සතු ඉඩමක නො ඉවසිය හැකි කොන්දේසි යටතේ නීති විරෝධී ලෙස ජීවත් වන වැසියන් පිරිසකට මෙන් යැයි ක්‍රියාවලිය ඇරඹුණු තැන් සිට ම තමන්ට හැඟුණු බව යි.

නාගරික සංවර්ධන අධිකාරිය කුමක් කීවත් 2010 මැයි මාසයේ දී නෙරපා හරින ලද මිව්ස් වීදි වැසියන් රජයේ ඉඩමක නීති විරෝධී ලෙස පදිංචි වූවන් නොවූ බව හා ඉඩම් සඳහා ඔප්පු තිබූ බව නැවතත් කිව යුතු ය. කොම්පඤ්ඤවීදී මුස්ලිම් දේවස්ථාන සම්මේලනය විසින් සංග්‍රහ කොට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග බෙදාහදා ගත් සවිස්තරාත්මක ලියවිලි සංග්‍රහයෙන් පෙනී යන්නේ සියලු මිව්ස් වීදි වැසියන්ට තම ඉඩම් සඳහා ඔප්පු තිබූ බව යි. මීට පැවරුම් ඔප්පු[55] 11ක් ද ත්‍යාග ඔප්පු[56] 5ක් ද අන්තිම කැමති පත්‍රයක්[57] ද ඇතුළත් විය.

*(පෞද්ගලික ඉඩමක් අත්පත් කර ගන්නා විට අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ තොරතුරු සඳහා 2 වන ඇමුණුම බලන්න)*

---

[53] S.S.Janagan, Asian Tribune, “Sri Lanka: Urban Development Authority offers alternative accommodations for the houses demolished,” 2011 ජනවාරි 28.

[54] Colombo Telegraph, “Defence Ministry Slams Supreme Court; Cheats Displaced People With SC approval,” 2013 නොවැම්බර් 25.

[55] පැවරුම් ඔප්පුවක් යනු එක් පුද්ගලයෙකුට අයත් දේපොළක් තවත් පුද්ගලයෙකුට විකුණන/පවරන විට සකස් කෙරෙන ලියවිල්ලකි. මෙම ඔප්පුවෙහි විකුණුම්කරුවන්ගේ හා ගැනුම්කරුවන්ගේ නම්, ලිපින හා ජාතික හැඳුනුම් පත් අංක, හිමිකම් අයිතිය විකුණුම්කරුට පැවරීම සඳහා යොදා ගත් පරණ ඔප්පුව පිළිබඳ තොරතුරු සහ ගෙවන මුදල (විකුණුම් මිල) අඩංගු විය යුතු ය. විකුණුම්කරු ඔප්පුවට අත්සන් කළ යුත්තේ සාක්ෂිකරුවන් දෙදෙනෙකු සිය අත්සන තැබීමෙන් පසුව ය. ඉන් පසු නොතාරිස්වරයා විසින් ඊට සාක්ෂි දරා නියමිත පරිදි මුද්‍රා තබනු ලැබේ.

[56] ත්‍යාග ඔප්පුව යොදා ගන්නේ පරිත්‍යාගකරුවෙකුගෙන් පරිත්‍යාගලාභියෙකුට දේපොළ පැවරීම සඳහා ය. මෙහි දී කිසිදු මූල්‍යමය ගෙවීමක් නොකෙරෙන නමුත් පරිත්‍යාගලාභියාගේ දයාබර බව හා අභිවෘද්ධිය සැලකිල්ලට ගැනෙයි. පැවරුම් ඔප්පුවට අදාළ විධිමත් ක්‍රියා පටිපාටි ද අනුගමනය කරනු ලැබේ (පරිත්‍යාගකරුවා හා පරිත්‍යාගලාභියා ද සාක්ෂිකරුවන් විසින් ද අත්සන් තබනු ලැබේ. නොතාරිස්වරයා විසින් සාක්ෂි දරා නියමිත පරිදි මුද්‍රා තබනු ලැබේ).

[57] අන්තිම කැමති පත්‍රය යනු තමන් ජීවිත කාලය තුළ දී උපයා ගත් දේපොළ තමන්ගේ මරණින් පසු අන්සතු විය යුතු ආකාරය ප්‍රකාශ කරමින් අන්තිම කැමතිකරුවෙකු කරන අවසන් ප්‍රකාශය යි. පුද්ගලයෙකු අන්තිම කැමති පත්‍රයක් ලියා තබා මිය ගිය විට අනුප්‍රාප්තිකත්වයට අදාළ සියලු නීති අභිභවා අන්තිම කැමති පත්‍රය ප්‍රමුඛත්වය අත් කර ගනියි.

මිව්ස් වීදි සිද්ධිය ඉස්මතු කර දක්වන්නේ කාර්යමය අත්තනෝමතිකත්වය සහ නෙරපා හැරුණු ප්‍රජාවන් එක දිගට ම හා වැඩි වැඩියෙන් අත්විඳින අහිමි වීම් හා හානි සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා රජය පළ කරන අතිශය නොතැකීම යි. මිව්ස් වීදිය කඩා බිඳ දැමීමෙන් පසු ආසන්න කාලයේ නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශකයෙකු මෙසේ පැවසී යැයි වාර්තා විය:

> *"නොයෙක් වර්ගවල ඔප්පු තියෙනවා. විධිමත් ඔප්පු තියෙනවා නම් ඔවුන්ට පුළුවන් ඒවා ඉදිරිපත් කරන්න. මේක රජයේ ඉඩමක්, මේවා රජයේ ඉඩමක අනවසරයෙන් කර තිබෙන ඉදි කිරීම්" යැයි ඔහු පැවසී ය. අධිකරණය හමුවට යාමට නිවැසියන්ට ඇති අයිතිය පිළිගත් නමුත් ඔහු අවධාරණය කළේ එමගින් වෙනත් ස්ථානයක පදිංචි කිරීමේ වැඩ සටහනට බාධා නොවන බව යි. "උසාවි යන්න ඔවුන්ට අයිතිය තියෙනවා. ඒකෙන් ක්‍රියාවලිය මන්දගාමී වෙන්නේ නැහැ, ඒකෙන් සිද්ධ වෙන්නේ ක්‍රියාවලිය වේගවත් වෙන එක විතර යි."*[58]

පමා වීම් හෝ විකල්ප නිවාස සැපයීම ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් අධිකරණය හමුවට යාම, විරෝධය පෑම හෝ නාගරික සංවර්ධන අධිකාරියට අභියෝග කිරීම වැනි නීත්‍යානුකූල විධික්‍රම යොදා ගැනීමට උත්සාහ කිරීම තවත් පලි ගැනීම්වලට හේතු විය හැකි බව ප්‍රකාශයෙන් පැහැදිලි ය. එපමණක් නො ව, මිව්ස් වීදියේ හා ජාවා පටුමගේ අත්දැකීම්වලින් (පහත තව දුරටත් සාකච්ඡා කෙරේ) පෙන්නුම් කෙරෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය නාගරික සංවර්ධන අධිකාරියේ දැක්ම අනුමත කරන බවත් එමගින් එලෙස බලහත්කාරී නෙරපා හැරීම්වල අවදානමට ලක්ව සිටින්නන් තුළ අධිකරණමය සුරක්ෂිතතාවන් සම්බන්ධයෙන් පවත්නා අපේක්ෂාවන් තව දුරටත් අනතුරට පත් කරන බවත් ය.

## හමුදාකරණය

ඉඩම් අත්පත් කර ගැනීම සඳහා සහ කොළඹ දී ජනතාව නෙරපා හැරීම සඳහා යොදා ගන්නා ක්‍රියාවලි තීරණාත්මක ආකාර දෙකකින් පශ්චාත් යුද උතුරේ දී හා නැගෙනහිර දී යොදා ගත් පියවරයන්ට සමාන ය. පළමු වැන්න හමුදාවේ සක්‍රිය සම්බන්ධය ද දෙවැන්න නීතිය අප්‍රතිපත්තිකව යොදා ගැනීම ද වන අතර, මේ කරුණු දෙක පහත තව දුරටත් සාකච්ඡා කෙරේ.

පීඩාවට පත් බොහෝ ප්‍රජාවන්හි නිවැසියන් සඳහන් කළේ තීරණ ගන්නේ හා ක්‍රියාවලිය අධීක්ෂණය කරන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය සමග වැඩ කරන හමුදා කාර්ය මාණ්ඩලිකයන් බව යි. නෙරපා හැරීම් සම්බන්ධ විවිධ කාර්යයන්හි හමුදා කාර්ය මාණ්ඩලිකයන් නිරතව සිටින අයුරු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ද ඍජුව ම දැක ඇත. හමුදාවේ සම්බන්ධය පුරවැසියන් විසින් ක්‍රියාවලිය ප්‍රශ්න කිරීමට තිබෙන ඉඩකඩ අවම කරයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය චාරිකා කළ නෙරපා හැරීමට මුහුණ දී සිටින ප්‍රජාවන් අතර පැහැදිලිව පෙනෙන භීතියක් පැවතිණ. කේන්ද්‍රය සමග කතා කළ බොහෝ නිවැසියන් පැවසුවේ පලි ගනිතැයි බියෙන් නෙරපා හැරීම්වලට එරෙහිව විරුද්ධත්වය පෑමට හෝ විරෝධය පෑම සඳහා සංවිධානය වීමට ජනතාව බිය වූ බව යි. උදාහරණයක් ලෙස, කොම්පඤ්ඤවීදියේ වෙනත් කොටස්වල ජීවත් වන සමහර නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ ප්‍රතිරෝධය පෑව හොත් මිව්ස් වීදියේ අයට මුහුණ පෑමට සිදු වූ ඉරණමට ම තමන්ටත් මුහුණ දීමට සිදු වේ යැයි තමන් බිය ගත් බව යි. ඉහළ මට්ටමේ සමීප නිරීක්ෂණයක් පවතින බවට හා ප්‍රජාව නිරීක්ෂණය කොට වාර්තා කිරීම සඳහා තොරතුරු සපයන්නන් යොදා තිබෙන බවට ද නිවැසියෝ චෝදනා කළහ.

උතුරේ දී හා නැගෙනහිර දී සිදු වූවාට බෙහෙවින් සමාන අයුරින් හමුදා සංස්ථාපිතය හා රජය එක්ව නෙරපා හැරීම් පිළිබඳ මාධ්‍ය ආවරණය සීමා කිරීමට තැත් කර ඇත. මිව්ස් වීදියේ කඩා බිඳ දැමීම් වෙත යොමු වෙමින් සන්ඬේ ටයිම්ස් වාර්තාවක් සඳහන් කළේ නෙරපා හැරීම් වාර්තා කිරීමෙන්

[58] The Sunday Times, "UDA offers Rs. 8,000 a month for Mews St. evictees," 2010 මැයි 16.

මාධ්‍යය වැළැක්වූ බව යි. වාර්තාව අනුව, හමුදාවේ කාර්ය මාණ්ඩලිකයෝ නාගරික සංවර්ධන අධිකාරිය නිවාස කඩා දැමූ අවධියේ දී ඡායාරූප මාධ්‍යවේදීන් ගත් ඡායාරූප විනාශ කළේ ය. ඡායාරූප මකා දමන ලෙස හා රූපවාහිනී මාධ්‍යවේදීන්ගේ වීඩියෝ පට ඉවත් කරන ලෙස බැනවදින සුළු ආකාරයෙන් කතා කළ බ්‍රිගේඩියර්වරයෙකු විසින් හමුදා කාර්ය මාණ්ඩලිකයන්ට නියෝග කරනු ඇසිණ."[59] කාසල් වීදියෙන් නෙරපා හැරුණු සමහර නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ තමන් තම කතාව හා දුක් ගැනවිලි කීමට රූපවාහිනී නාළිකා දෙකක් වෙත ගිය විට එවැනි කතාවන් ආවරණය නොකරන ලෙස තමන්ට 'උපදෙස් දී' ඇතැයි එම නාළිකාවල නියෝජිතයන් තමන්ට කී බව යි. නෙරපා හැරීම් ආශ්‍රිත යථාර්ථයන් පිළිබඳ දැනුවත් ප්‍රසිද්ධ විවාදයක් හා ස්වාධීන මාධ්‍ය ආවරණයක් නොමැතිකම නිසා පීඩාවට පත් ප්‍රජාවන් තුළ පවතින භීතිය මුසු වාතාවරණය වඩා කැපී පෙනේ.

## නීතිය තෝරා බේරා ගත් පාර්ශවයන් කෙරෙහි හා අක්‍රමවත් ලෙස යොදා ගැනීම

පශ්චාත් යුද උතුරු හා නැගෙනහිර පළාත්වල දී රජය මේ වන විට යෙදී සිටින්නේ සැබවින් ම බොහෝ විට හමුදාව යොදා ගෙන සිදු කළ පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම නීත්‍යනුකූල කිරීමේ වෑයමක ය.[60] කොළඹ ඉඩම් අත්පත් කර ගැනීම යටින් සිදු වන නීතිය තෝරා බේරා ගත් පාර්ශවයන් කෙරෙහි හා අක්‍රමවත් ලෙස යොදා ගැනීම මගින් ඇඟවෙන්නේ ඒ හා සමාන උපක්‍රම යොදා ගනෙමින් පවතින බව විය හැකිය. පෞද්ගලික දේපළ අත්පත් කර ගැනීම හා රාජ්‍ය ඉඩම් නැවත අත්පත් කර ගැනීම සඳහා නීතියෙන් නියම කරන ලද පැහැදිලි ක්‍රියා පටිපාටීන් පවතින අතර, කොළඹ දී මේ ක්‍රියා පටිපාටින් අනුගමනය කරන බවක් නො පෙනේ.

උදාහරණයක් ලෙස, පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පණත (LAA) අනුගමනය කළ යුතු ය. යම් ඉඩමක් මහජන කාර්යයක් සඳහා අත්පත් කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව ඇමතිවරයා විසින් අවසන් තීරණයක් ගැනීමට පෙර අත්පත් කර ගැනීම පිළිබඳ නොතීසිය භාෂා තුනෙන් ම භාර දිය යුතු බවත් අත්පත් කර ගැනීමට විරුද්ධත්වය පළ කිරීම සඳහා යටත් පිරිසෙයින් දින දහහතරක කාල පරිච්ඡේදයක් ලබා දිය යුතු බවත් ඇතුළු සවිස්තරාත්මක ක්‍රියාවලියක් එය විසින් නියම කෙරේ. එපමණක් නො ව, වන්දි ඉල්ලා සිටීමේ අයිතිය මෙන් ම වන්දි ප්‍රමාණය සම්බන්ධයෙන් සමාලෝචන මණ්ඩලයක් වෙත හා ඉනුත් ඔබ්බට ගොස් අභියාචනාධිකරණය වෙත අභියාචනා කිරීමේ අයිතියක් ද එය පීඩාවට පත් පාර්ශ්වයන්ට පිරිනමයි. කෙසේ වෙතත්, පීඩාවට පත් ප්‍රජාවන් සැපයූ තොරතුරු හා ප්‍රසිද්ධ කර ඇති සීමිත තොරතුරු ප්‍රමාණය අනුව පැහැදිලි වන්නේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ කොටසක් ලෙස සිදු වූ මිව්ස් වීදි හා ජාවා පටුමග සිද්ධිවල දී ද ඇතුළු බලහත්කාරී නෙරපා හැරීම්වල දී හා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම්වල දී එවැනි ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නැති බව යි (පහත බලන්න).

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශනයකින් මේ බව තව දුරටත් අනාවරණය වේ. 2014 දී නාගරික සංවර්ධන අධිකාරිය බස්නාහිර පළාත තුළ සිදු කරන සංවර්ධන ක්‍රියාකාරකම් විස්තර කරන අතරතුර "කොම්පඤ්ඤවීදි ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියේ 1 වන අදියර" සම්බන්ධයෙන් එය සඳහන් කරන්නේ දැනට මත් – 2014 ජනවාරි මාසය වන විට මත් – අත්පත් කර ගැනීමේ නිලධාරියා ඉඩම අත්පත් කර ගෙන ඇති බව යි (S. 38a අදහස් දැක්වීම බලන්න).[61] කෙසේ වෙතත්, ක්‍රියාකාරකම් පිළිබඳව කෙරෙන සවිස්තරාත්මක පැහැදිලි කිරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ 2014 අප්‍රේල් මස අවසානයේ දී අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිම වන බව යි. රජය ඉඩමේ භුක්තිය අත්පත් කර ගැනීම සිදු කළ යුත්තේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසානයේ දී පමණක් මිස ඊට පෙර නො වේ යැයි ඉඩම් අත්පත් කර ගැනීමේ පණත අනුව අපේක්ෂා කෙරෙන බව සඳහන් කළ යුතු යි.

---

59 The Sunday Times, "Outrage in Mews St. as UDA demolishes houses," 2010 මැයි 09.

60 B. Fonseka සහ D. Jegatheeswaran. "Politics, Policies and Practices with Land Acquisitions and Related Issues in the North and East of Sri Lanka," විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2013 නොවැම්බර්, 43-55 පිටු.

61 නාගරික සංවර්ධන අධිකාරිය, Development Activities for 2014 for the Western Province, 2014 ජනවාරි.

කොළඹ සිදු වන නෙරපා හැරීම්වල දී පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ දී සහ රජයේ ඉඩම් ආපසු අත්පත් කර ගැනීමේ දී නීතියෙන් නියම කෙරෙන ක්‍රියා පටිපාටිය දැඩිව පිළිපැදීමක් සිදු නොවන බව පැහැදිලි ය. ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් විනිවිද භාවයෙන් යුතු වූත් නීතියට බැඳුණා වූත් ක්‍රියාවලියක් නොමැතිකම ප්‍රධාන සැලකිලිමත් වියයුතු කරුණකි. උදාහරණයක් ලෙස, මිව්ස් වීදියට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය හා ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ කොන්දේසි යාබද ජාවා පටුමගට අදාළ ක්‍රියාවලියෙන් හා කොන්දේසිවලින් සැලකිය යුතු ලෙස වෙනස් වන අතර (පහත බලන්න), මේ එක් සිද්ධියක දී වත් නීතියෙන් නියම කෙරෙන ක්‍රියා පටිපාටිය අනුගමනය කරන බවක් නො පෙනේ. රජයසතු ඉඩම්වලින් උදාහරණයක් ලෙස කාසල් වීදියෙන් (මෙය ද පහත සාකච්ඡා කෙරේ) හා අන් තැන්වලින් ඉවත් විය යුතු යැයි නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයන් ප්‍රජාවන්ට නියම කළ අවස්ථාවේ නව නිවාස ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය 'අයැදුම් පත්වලට' අත්සන් කරන ලෙස ඔවුන්ට බල කරන ලදී. පූර්ණ හිමිකම් අයිතියක් නැති ඉඩම්වල පිහිටි නිවාස වෙනුවට අලුතින් ඉදි කළ මහල් නිවාස කට්ටිවල පූර්ණ අයිතිය සහිත ස්ථිර නිවාස ලබා දීමට යන බව ඔවුන්ට දැනුම් දෙනු ලැබිනි. ස්වේච්ඡාමය නොවුණ ද මෙමගින් සමස්ත ක්‍රියාවලියට ම ස්වේච්ඡාමය මුහුණුවරක් ලැබිණ. අත්තනෝමතිකත්වය හා විටින් විට යොදා ගන්නා ප්‍රවිෂ්ටයන් නිසා ක්‍රියා පටිපාටිමය හා සැලකිය යුතු අයිතිවාසිකම් උල්ලංඝනයන් සිදු වීමේ බරපතළ අවදානම් මතු වනවා පමණක් නො ව ජාවා පටුමගෙන් නෙරපා හැරුණවුන් මුහුණ පාමින් සිටින ආකාරයේ භීතීන් හා අවිනිශ්චිතතා ද ප්‍රජාවන් අතර හට ගනී.

**ජාවා පටුමග සිද්ධිය**

මිව්ස් වීදි නිවැසියන් ලද අත්දැකීම නිසා ජාවා පටුමග වැනි අසල්වැසි ප්‍රදේශවල ජනයා වඩා මැනවින් සූදානම්ව සිටියහ. රට තුළ පැවති පැරණිතම මැලේ මුස්ලිම් ජනාවාස ප්‍රදේශයක් වූ ජාවා පටුමගේ වැසියන්ගෙන් බහුතරයකට දශක කිහිපයක අතීතයක් සහිත හිමිකම් ඔප්පු තිබූ බැවින් ඔවුහු අත්පත් කර ගැනීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පෙත්සමක් ගොනු කළහ. කෙසේ වෙතත්, 2013 ඔක්තෝබර් මාසයේ දී අධිකරණය ඔවුන්ට පැවසුවේ 2013 දෙසැම්බර් 1 වන දා වන විට තම ඉඩම් අයිතිය නාගරික සංවර්ධන අධිකාරියට භාර දිය යුතු බව යි.[62] පසුව මෙම කාලය මාස කිහිපයකින් දීර්ඝ කරනු ලැබිණ.

තමන්ට වසර 2ක් සඳහා එක වර කුලී දීමනාවක් ලැබෙන බවත්[63] ප්‍රතිසංවර්ධනය සඳහා ඉන්දියාවේ ටාටා හවුසිං සමාගම වෙත පැවරුණු ඉඩමේ කොටසක තමන් සඳහා ඉදි කෙරෙන උස තට්ටු ගොඩනැගිලිවල පසුව තමන්ට බද්ධ නිවාස ලබා දෙන බවත් නිවැසියන්ට පවසනු ලැබිණ. එහෙත්, මේ විකල්පයට අකැමති වූ අයට ඒ වෙනුවට මූල්‍යමය වන්දි ලබා ගැනීමේ විකල්පය හිමි විය.

කෙසේ වෙතත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කතාබහ කළ පීඩාවට පත් එක ද පවුලක් වත් තම අයිතිවාසිකම්, නාගරික සංවර්ධන අධිකාරිය හෝ පෞද්ගලික සංවර්ධකයා දරා සිටින බැඳීම් හා හිමිකම, භාර දිය හැකි දෑ හා කාල රාමු සම්බන්ධයෙන් දරා සිටින බැඳීම් දැක්වෙන ලිඛිත ලියකියවිලි කිසිවක් තමන් සතුව තිබෙන බව නොපැවසුවේ ය. මේ නව ගොඩනැගිලිවලට අදාළව තමන්ට ඇති හිමිකම් හෝ මේ මහල් නිවාසවල සැලැස්ම, විශාලත්වය හා පිරිවිතර සම්බන්ධයෙන් වත් ඔවුන් සතුව කිසිදු තොරතුරක් නැත. මහල් නිවාස යටත් පිරිසෙයින් ප්‍රමාණ තුනකින් වත් ඉදි කෙරෙන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැන සිටින නමුත් බොහෝ නිවැසියන් එය සමග පැවසුවේ නව මහල් නිවාස ඉතා කුඩා ප්‍රමාණයේ ඒවා යැයි තමන් විශ්වාස කරන බව යි. මීට විශේෂයෙන් ම හේතු වූයේ ඔවුන් ජීවත්ව තිබුණේ එක් තට්ටුවකට වැඩියෙන් තිබූ නිවාසවල වීම හා කාලයත් සමග නව නිවාස වැඩි දියුණු කර ගැනීමේ කිසිදු සලකා බැලීමක් කළ නොහැකි වීම යි.

---

[62] The Sunday Times, "SC says 500 Slave Island families must vacate their houses by Dec. 1," 2013 ඔක්තෝබර් 27.

[63] පීඩාවට පත් නිවැසියන්ට හිඟ බිල් පත් ගෙවීම සඳහා රු. 25,000/-ක් ද කල් තියා වසර 2ක කුලී දීමනාවක් ද ලැබිණ. කුලී ප්‍රමාණයන් පදිංචි නිවසේ විශාලත්වය අනුව මසකට රු. 18,000/- සිට රු. 28,000/- දක්වා විය හැකි බව වාර්තා විය. ඔවුන් තමන් ගෙවන කුලිය හා වසර 2ක් නිවසේ පදිංචි වී සිටින බව සඳහන් ලිපියක් ගෙවල් හිමියාගෙන් ලබා ගෙන භාර දිය යුතු ය.

අන් අයුරකින් කිව හොත්, වෙනත් ස්ථානයක පදිංචි කිරීම නිසා ඔවුන්ගේ නිවාස තත්වයන් පහත වැටිය හැකි ය.

කෙසේ වෙතත්, ඒ අතර සමහර පීඩාවට පත් නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ නාගරික සංවර්ධන අධිකාරියට පැමිණෙන්නැයි පැවසූ අවස්ථාවේ දී තමන්ට නොයෙක් ලියකියවිලිවලට අත්සන් කරන ලෙස බල කරන ලද නමුත් තමන් අත්සන් කළ දේවල එක ද පිටපතක් වත් තමන්ට ලබා නොදුන් බව යි. අත්සන් කළ ලියකියවිලිවල පිටපත් ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ලිඛිතව ඉල්ලීම් ඉදිරිපත් කළත් ඒවාට පිළිතුරු ලැබී හෝ ඒවා ලැබුණු බව දන්වා හෝ නැත. එපමණක් නො ව, ප්‍රජාවෙන් වැඩි කොටස මැලේ ජාතිකයන් හා දෙමළ කතා කරන්නන් වුවත් අත්සන් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටි සියලු ලියකියවිලි තිබුණේ සිංහල භාෂාවෙන් බැවින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට තමන් අත්සන් කළේ කුමකට දැයි නොවැටහුණු නමුත් ඒවා එකතු කර ගත් නිලධාරීන් සමග තර්ක කිරීමට හෝ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමට තිබුණේ සුළු අවස්ථාවකි. නාගරික සංවර්ධන අධිකාරිය තුළ සිටි අවස්ථාවේ දී පිටපත් ඉල්ලා බල කළේ නම් හෝ ප්‍රශ්න මතු කළේ නම් තම මුල් පදිංචි ස්ථානයෙහි ලබා දීමට පොරොන්දු වූ මහල් නිවාසය අහිමි වේ යැයි සිතුණු බැවින් නිවැසියෝ එසේ නොකිරීමට පරිස්සම් වූහ.

## තොරතුරු හා සහභාගිත්වයක් නොමැතිකම

නාගරික සංවර්ධන අධිකාරි වෙබ් අඩවියෙහි ඇතුළත් සමහර සීමිත තොරතුරු හැරුණු විට වෙනත් ස්ථානයක පදිංචි කිරීම සම්බන්ධයෙන් පීඩාවට පත් ප්‍රජාවන් වෙත කිසිදු විධිමත් තොරතුරක් ලබා දී නැත. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එනම් බොහෝ විට ගෝඨාභය රාජපක්ෂ මහතා චාරිකා කළ අවස්ථාවල දී නිවැසියන්ට පවසන ලද්දේ ඔවුන් මාරු කෙරෙන පූර්ණ ලෙස සේවා සම්පාදිත 'නූතන' මහල් නිවාස කට්ටි දැන් ඉදි කෙරෙමින් පවතින බව ඒ පිළිබඳ තොරතුරු විමසීමෙන් තමන්ට දැන ගැනීමට ලැබුණු වග යි. උදාහරණයක් ලෙස කාසල් වීදියේ නිවැසියන් සඳහන් කළේ තමන් නෙරපා හැරීමට යන බව දැනුම් දීමට පැමිණි අවස්ථාවේ දී ඔහු වන්දි ලබා දෙන්නේ දැයි හෝ තම නව නිවාස සඳහා රුපියල් මිලියනයක් ගෙවීමේ අවශ්‍යතාව අත් හරින්නේ දැයි ප්‍රශ්න කිරීම සඳහා හෝ ආයාචනා කිරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා නොදුන් බව යි. දශක දෙකකට වැඩි කාලයක් එම ජනාවාසයේ පදිංචිව සිටි එක් මැදි වියේ කාන්තාවක ඔහුගේ චාරිකාව හා ඔහු නිවැසියන් සමග කතාබහ කළ ආකාරය සිහිපත් කරමින් පැවසුවේ මෙය යි: "එයා කිසි ම අනුකම්පාවක් දැක්කුවේ නැහැ."

2014 පෙබරවාරි 13 වන දා හමුදා නිලධාරීන් ද කැටුව රාජපක්ෂ මහතා ඊසාන කොළඹ වනාතමුල්ලේ පිහිටි අඩු ආදායම්ලාභී ජනාවාසයක් වෙත කළ එවැනි එක් චාරිකාවක දී වඩා විශාල නිවාස හා වන්දි ඉල්ලා සිටිමින් නිවැසියන් නෙරපා හැරීමට විරෝධය පෑ ප්‍රාදේශීය ප්‍රජා සංවිධානයක නායකයෙක් නව නිවාස සඳහා මුදල් ගෙවන ලෙස නිවැසියන්ගෙන් ඉල්ලා සිටීම ගැනත් විරෝධය පළ කළේ ය. පසුව ඔහුට නිර්නාමිකව තර්ජනය කරමින් දුරකථන ඇමතුම් ලැබුණු අතර, දින දෙකකට පසුව නාඳුනන පුද්ගලයන් විසින් පැහැර ගෙන ගොස් තර්ජනය කොට කොළඹ අවට පෙදෙසක දී වාහනයකින් එළියට ඇද දමා ගොස් තිබිණ.[64]

මේ ආකාරයෙන් 'එක් පාර්ශ්වයකින් පමණක් අදහස් විමසීම' පිළිබඳ හොඳ ම උදාහරණයක් නම් සංවර්ධනය සඳහා ඉඩම අත්පත් කර ගැනෙමින් තිබූ කොම්පඤ්ඤ වීදි නිවැසියන් සඳහා ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් 2013 ජනවාරි 28 වන දා පැවැත්වූ වැඩ සටහන යි. සහභාගි වූ සමහර නිවැසියන් 'දැනුවත් කිරීමේ වැඩ සටහන' විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හමුවේ විස්තර කළේ "ඒකපාර්ශ්වීය" රැස්වීමක් ලෙස ය. ඔවුන් සඳහන් කළේ ආරක්ෂක ලේකම්වරයා හා හමුදාව කිසිදු සැලකිලිමත් වීමක් ඉදිරිපත් නොකරන තැනට තමන් බිය ගැන්වූ බව යි. එපමණක්

[64] The Island, "Wanathamulla abduction: Red Pajero has replaced white van syndrome - Eran," 2014 පෙබරවාරි 28.

නො ව, රැස්වීමට පෙර සමහර සෘජුව කතා කරන නිවැසියන්ට කිසිදු ප්‍රශ්නයක් ඇති නොකරන ලෙස දැනුම් දුන් බව ද ඔවුහු සඳහන් කළහ.

සහභාගිත්වය හා අදහස් විමසීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හා රජය කුමක් කීවත් නැවත පදිංචි කිරීමේ අඩවිවල සැලැස්ම පිළිබඳව පීඩාවට පත් එක ද ප්‍රජාවකගෙන් වත් අදහස් විමසා නැති බව පෙන්වා දීම මෙහි දී තීරණාත්මක වේ. බොහෝ තට්ටු ඇති ගොඩනැගිලි සියල්ල ම එක ම සැලැස්මකට අනුව තනා ඇති අතර, අක්කරයකට ස්ථාවර ඝනත්වයක් ඇති වන පරිදි සෑම බද්ධ නිවාසයක ම විශාලත්වය ආසන්න වශයෙන් වර්ග අඩි 400ක් වේ. මෙම ගොඩනැගිලි නිර්මාණයේදී ඒවායේ පදිංචි කෙරෙමින් පවත්නා ප්‍රජාවන්ගේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික විශේෂතාවන් හා අවශ්‍යතාවන් සැලකිල්ලට නොගැනේ.

විධිමත් තොරතුරු නොමැති තත්වය තුළ බොහෝ ප්‍රජාවන් දිවි ගෙවන්නේ නෙරපා හැරීම් පිළිබඳ භීතියෙනි. උදාහරණයක් ලෙස, නාගරික සංවර්ධන අධිකාරිය එය 'ආයෝජකයන් සොයන' අඩවි ගණනාවක් සිය වෙබ් අඩවියෙහි ලැයිස්තුගත කර ඇත.[65] කෙසේ වෙතත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කොළඹ 7 පිහිටි එවැනි එක් අඩවියක් වෙත ගිය විට තම ඉඩම ප්‍රතිසංවර්ධනය සඳහා තෝරා ගෙන ඇති බව ඔවුන් දැන සිටියත් ඔවුන්ගේ නිවාසවලට අත් වන ඉරණම, තමන්ට වෙනත් ස්ථානයක පදිංචි වීමට සිදු වේ ද ඒ කවදා ද, සංවර්ධකයන් සොයා ගෙන තිබෙනවා ද නැද්ද හෝ නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම සම්බන්ධයෙන් තමන්ට පවතින විකල්ප කවරේ ද යන්න ගැන ඔවුන් කිසිදු තොරතුරක් දැන සිටියේ නැත.

ක්‍රියාවලිය තුළ බෙහෙවින් බලපවත්වන ඉහළ සිට පහළට තීරණ ගැනීමේ හා හමුදාකරණය වූ ස්වභාවයත් කවරකාර හෝ ප්‍රශ්න කිරීම් හෝ විරෝධය පෑම් නොඉවසීමත් සමග එක් වී මේ සියල්ල ම නාගරික සංවර්ධන අධිකාරියට හා රජයට එරෙහිව නැගී සිට පීඩාවට පත් ප්‍රජාවන් වෙනුවෙන් සාකච්ඡා කළ හැකි ප්‍රජා මූල කණ්ඩායම් වර්ධනය වීම වැළැක්වීමට දායක වී ඇත.

## වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කිරීම හා නව නිවාස සඳහා මුදල් ගෙවීමට නිවැසියන්ට බල කිරීම

අහිමි වූ ඉඩම්, ඉදි කිරීම්, වත්කම් හෝ ව්‍යාපාර වෙනුවෙන් ජනතාවට වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කර ඇතුවා පමණක් නො ව රජයසතු ඉඩම්වලින් පලවා හැරුණවුන්ට නව නිවාසවල පූර්ණ හිමිකම තමන්ට පිරිනැමීමට පෙර සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ගෙවීමට ද සිදු වී ඇත. නැවත පදිංචි කිරීමේ අඩවිවල ඉදි කර ඇති එක් බද්ධ නිවාසයක් රු. මිලියන 7ක් වටිනා බව රජය හා නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රකාශ කරයි. ඒවා නැවත පදිංචි වන්නන්ට ලබා දෙන්නේ එකක් රු. මිලියනය වන සේ පහත සඳහන් කොන්දේසි යටතේ යː එනම්, රු. 50,000ක් වන පළමු වාරිකය කල් තියා ද නඩත්තුව හා නඩත්තු වියදම් සඳහා තවත් රු. 50,000ක් මාස තුනක් ඇතුළත වාරික තුනකින් ද ගෙවිය යුතු අතර, ඊළඟ 20 වසර පුරා රු. 3,960 බැගින් මාසික වාරික මුදල් ගෙවිය යුතු ය. මේ නිසා, බලාත්කාරයෙන් නෙරපා හැරුණවුන්ට දෙයාකාර බරක් ඉසිලීමට සිදු වී ඇත. එනම්, එක් අතකින් ඔවුන්ට නිවාස හා ඉදි කිරීම් සහ කාලයක් තිස්සේ තමන් සැලකිය යුතු මුදලක් ආයෝජනය කර තිබූ ව්‍යාපාර පවා අහිමි විය. අනෙක් අතින් ඔවුන්ට රුපියල් මිලියනයක් හා ඉන් රු. 100,000ක් කෙටි කාලයක් ඇතුළත ගෙවිය යුතු වන ණය බැඳීමකට ගොදුරු වීමට සිදු වී ඇත.

*(මේ තොරතුරු බද්ධ නිවාසලාභීන් වෙත දැනුම් දුන් නාගරික සංවර්ධන අධිකාරියෙහි ලිපිය (සිංහල භාෂාවෙන් පමණකි) සඳහා කරුණාකර 3 වන ඇමුණුම බලන්න)*

---

65 නාගරික සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය, Seeking Investors.

**කාසල් වීදියේ සිද්ධිය**

2013 නොවැම්බර් 22 හා 24 අතරතුර දී බොරැල්ලේ කාසල් වීදියෙන් උතුරු දේසට වන්නට පිහිටි අඩු ආදායම්ලාභී ජනාවාසයක ජීවත් වූ පවුල් දුසිම් ගණනක් අලුතින් ආරම්භ කළ නැවත පදිංචි කිරීමේ අඩවියක පදිංචි කෙරිණ. මේ පවුල් රජයට අයත් එම ඉඩමෙහි දශක ගණනාවක් තිස්සේ වාසය කර තිබිණ. ඔවුන් සතුව පැහැදිලි හිමිකම් අයිතියක් නොපැවතුණු නමුත් මහ නගර සභාව ඔවුන්ට ජල හා විදුලිබල සේවාවන් පූර්ණ ලෙස සම්පාදනය කළ අතර නොයෙක් නිල ලියකියවිලිවල දී ඔවුන්ගේ ලිපිනයන් පිළිගෙන තිබිණ.

*(රජයේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ නීතිය සඳහා 2 වන ඇමුණුම බලන්න)*

නිවාස කඩා බිඳ දැමීමට කලින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රජාව වෙත චාරිකා කළ අවස්ථාවේ දී පැහැදිලි වූයේ සමහර පවුල් දුප්පත් හා කුඩා වාසස්ථානවල ජීවත් වන බවත් පවුල් වැඩි සංඛ්‍යාවක් බොහෝ විට පවුල් පුළුල් වෙද්දී ඊට ගැළපෙන පරිදි එක් තට්ටුවකට වඩා ඉදි කරමින් තම නිවාස සඳහා සැලකිය යුතු ආයෝජනයන් කර තිබෙන බවත් ය. තවත් බොහෝ අය සිල්ලර කඩ, රථවාහන අලුත්වැඩියා කිරීමේ ස්ථාන හා වෙනත් ව්‍යාපාර වැනි ක්ෂුද්‍ර ව්‍යවසායන් පවත්වා ගෙන ගියහ. කෙසේ වෙතත්, මේ එක ද ආයෝජනයක් හෝ බොහෝ විට එක් නිවසක එක් පවුලකට වඩා ජීවත් වන්නේ ය යන කරුණ හඳුනා නො ගැනිණ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සම්මුඛ සාකච්ඡාවට ලක් කළ කාසල් වීදි නිවැසියන් සඳහන් කළේ නැවත පදිංචි කිරීමේ අඩවියෙහි නිවාස වෙන් කිරීමේ දී හමුදාවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හැරුණු විට පාලක පක්ෂයේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයන් ද ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ බව යි. නිවාස වෙන් කිරීම අත්තනෝමතික විය. ඇත්ත වශයෙන් ම, පාරෙන් එහා පැත්තේ එනම් කාසල් වීදියේ දකුණු පස වාසය කළ තවත් පවුල් ගණනාවක් වසරකට කලින් තාවකාලික වාසස්ථානවලට නෙරපා හැරුණු නමුත් අලුතින් ඉදි කළ නැවත පදිංචි කිරීමේ සංකීර්ණයෙහි ඔවුන්ට නිවාස ලබා නොදුන් බව නිවැසියෝ පෙන්වා දුන්හ.

එක ම ගොඩනැගිල්ලේ තට්ටු 2-3ක තමන් එකට නැවත පදිංචි කරන ලෙස ප්‍රජාව ආයාචනා කළත් ඔවුහු නැවත පදිංචි කිරීමේ අඩවියෙහි විවිධ ගොඩනැගිලි පුරා විසුරුවා හැරුණහ. ඇත්ත වශයෙන් ම, ඥාතීන් වූ යාබද නිවෙස්වල ජීවත් වූ පවුල්වලට පවා යාබද තට්ටු නිවාස ලබා දීම ප්‍රතික්ෂේප කෙරිණ. ඉදි කිරීම්වල ගුණාත්මකත්වය දුර්වල බව හා නැවත පදිංචි කිරීමේ අඩවියෙහි තිබෙන නිවාස ඉතා කුඩා බව ද නිවැසියෝ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසූහ. සැබවින් ම තම ප්‍රජාව නෙරපා හැරීමට විරෝධය පෑ වනාතමුල්ලේ ප්‍රජා නායකයා පැවසුවාක් මෙන් ම, ඉදි කර ඇති මේ මහල් නිවාස "ගෙවල්වලට වඩා හිර ගෙවල් වගේ"[66] ය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැන ගත් පරිදි ඔවුන්ට නිවාස වෙන් කෙරුණු විගස ජනාධිපතිවරයාගේ පුත්‍ර නාමල් රාජපක්ෂ සමග ඡායාරූප ගැනීමේ අවස්ථාවක් සඳහා සියලු පවුල් කැඳවනු ලැබිණ. ඉන් පසුව ඔවුන්ට පවසන ලද්දේ ඔවුන් තමන්ට ලබා දෙන ඡායාරූප තම නිවාස ඇතුළත එල්ලා තැබිය යුතු බව යි. නැවත පදිංචි කළ කාසල් වීදි වැසියෝ ද මුල් දිනවල දී ඉහළ මට්ටමේ හමුදා අධීක්ෂණයක් පැවති බවට චෝදනා කළහ.

## වන්දි ගෙවීම් පමා වීම

බද්ධ නිවාසයක් වෙනුවට වන්දි විකල්පය තෝරා ගත් කොම්පඤ්ඤ වීදි ප්‍රදේශයේ නිවැසියෝ දැනට මත් කඩා බිඳ දමා ඇති තම නිවාස වෙනුවෙන් වන්දි ලබා ගැනීම සඳහා පවතින ක්‍රියාවලිය ගැන අන්ත අතෘප්තිය පළ කළහ. නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ නිවාස කඩා බිඳ

[66] The Island, "Wanathamulla abduction: Red Pajero has replaced white van syndrome - Eran," 2014 පෙබරවාරි 28.

දැමීමට කලින් වන්දි මුදලක් පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය සමග එකඟතාවකට පැමිණීමට තමන්ට වුවමනා කළත් තම නිවාස කඩා බිඳ දමා සති ගණනාවක් ගත වී ඇති අද දින පවා තමන් සිටින්නේ ලැබෙන වන්දි මුදල් ප්‍රමාණය ගැන අවිශ්වාසයෙන් බව ය. කඩා බිඳ දැමීමට කලින් රජය විසින් නිවාස තක්සේරු කරන ලද දැයි – එනම්, එය ගණනය කළේ ද ඒ කෙසේ ද හා එය කොපමණ වී දැයි සහ නිවාස තක්සේරු නොකළේ නම් දැන් නිවාස විනාශ වී ඉඩම පමණක් තිබෙන තත්වය තුළ තක්සේරු විධික්‍රමය කුමක් වේ දැයි – ඔවුහු නො දනිති. මහල් නිවාස ලබා දීම මත වන්දි ගෙවීමට තෝරා ගත් අයට එක වර වසරක් සඳහා කුලී දීමනාවක් ලැබුණු අතර, ඉන් අදහස් වූයේ මුළු වන්දි මුදල් ප්‍රමාණය මාස හයක් ඇතුළත ලැබෙන බව යි. එහෙත් දැන් අවසන් වන්දි මුදල් ප්‍රමාණය ගැන වත් කිසිවක් නොදන්නා මේ නිවැසියෝ සිය ජීවිත පෙරට ගෙන යා නොහැකිව අවිනිශ්චිතව බලා සිටිති.

## ජීවනෝපායන්ට හා අධ්‍යාපනයට ඇති ප්‍රවේශය අනතුරට ලක් කිරීම

නිවාස පිළිබඳ සැලකිලිමත් වීම් හැරුණු විට පීඩාවට පත් ප්‍රජාවන් අතර ඉහළ ම මට්ටමේ පවතින්නේ බලහත්කාරී නෙරපා හැරීම්වලින් හා වෙනත් ස්ථානවල පදිංචි කිරීමෙන් ජීවනෝපායන් කෙරෙහි ඇති වන බලපෑම යි. උදාහරණයක් ලෙස, මිව්ස් වීදියේ හිටපු නිවැසියන්ට දෙමටගොඩ ප්‍රදේශයේ නිවාස ලබා දෙන නමුත් ඒවා පිහිටා තිබෙන්නේ කලින් පදිංචි ස්ථානයට වඩා කි.මී. 6කට වඩා දුරින් ය යන කරුණෙන් අදහස් වන්නේ විශේෂයෙන් ම මිව්ස් වීදි වැසියන්ගෙන් වැඩි දෙනා රැකියාව කළේ හෝ කුඩා ව්‍යාපාර පවත්වා ගෙන ගියේ ඒ අහල පහල බැවින් නව පදිංචිය ජීවනෝපායන් කෙරෙහි හානිකර අන්දමින් බලපාන බව යි. දෛනික වැටුප් ලබන හෙවත් නොවිධිමත් රැකියාවල නිරතව සිටි කොම්පඤ්ඤ වීදි නිවැසියන්ගේ ආදායම කෙරෙහි එදිනෙදා යාම ඒම සඳහා ගත වන කාලය හා වියදම හානිකර අයුරින් බලපානු ඇත. අන් තැන්වල පිහිටි බොහෝ නගරවල මෙන් ම කොළඹ පිහිටි නාගරික අඩු ආදායම්ලාභී ජනාවාස ද ක්ෂුද්‍ර හා නිවස පදනම් කර ගත් ව්‍යවසායන්ට නිවහන වී තිබෙන අතර, එම ව්‍යවසායන් බොහෝ විට ඒවා සේවා සපයන කුඩා ප්‍රජාවන්ගේ දේශපාලන ආර්ථිකයට සම්බන්ධිත ය. ප්‍රජාව බිඳ දැමීමෙන් මෙන් ම ඔවුන් උස තට්ටු ගොඩනැගිලිවල නැවත පදිංචි කිරීමෙන් ද අදහස් වන්නේ නිවස පදනම් කර ගත් වාහන සර්විස් කිරීම/අලුත්වැඩියාව වැනි සමහර ව්‍යවසායන් තව දුරටත් කර ගෙන යා නොහැකි බව යි. උදාහරණයක් ලෙස, නැවත පදිංචි කෙරුණු සමහර කාසල් වීදි නිවැසියන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ විශාල තට්ටු ගණනාවක් ඇති බද්ධ නිවාස කට්ටිවල සැලැස්ම හා ඒවා පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් නිසා ද සිල්ලර කඩ වැනි නිවස පදනම් කර ගත් ව්‍යාපාර පවත්වා ගෙන යාම වැළකෙන බව හෝ ඒවාට බාධා වන බව යි.

පීඩාවට පත් ප්‍රජාවන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැවසුවේ වෙනත් ස්ථානයක පදිංචි කිරීමෙන් තම දරුවන්ගේ අධ්‍යාපනයට හානිකර බලපෑමක් ඇති වෙති යි තමන් බියෙන් පසු වන බව යි. උදාහරණයක් ලෙස, මිව්ස් වීදි නිවැසියන් සඳහන් කළේ තමන්ට තම ඥාතීන් වෙත යාමට හෝ තම දරුවන් ගිය පාසලෙන් බොහෝ ඈත ස්ථානයක පදිංචි වීමට සිදු වූ බැවින් තම දරුවන්ගේ අධ්‍යාපනය කඩා කප්පල් වී ඇති බව යි. මේ අයුරින් ම ජාවා පටුමගේ නිවැසියන් ද සඳහන් කළේ නගර සීමාවෙන් පිටත වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි කිරීම හෝ වෙනත් ප්‍රදේශයක කුලී නිවසක ජීවත් වීමට සිදු වීම නිසා තම දරුවන්ට ද එවැනි ගැටලු ඇති විය හැකි බව යි. එපමණක් නො ව, තමන්ට ප්‍රවේශය තිබූ කලාපය තරම් දියුණු නැතැයි සැලකෙන පාසල් කලාපවල පදිංචි කිරීමට නියමිත නිවැසියෝ ද ගුණාත්මක බවකින් යුතු අධ්‍යාපන ප්‍රවේශය ගැන කණස්සල්ලට පත් වෙති.

# නිර්දේශ

පශ්චාත් යුද ශ්‍රී ලංකාව පාලනය මෙන් ම සංවර්ධන අවස්ථා සම්බන්ධයෙන් ද නව අත්‍යවශ්‍යතාවන් පැන නංවයි. එම නිසා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකා රජය නාගරික සංවර්ධනය කෙරෙහි දක්වන කැප වීම සතුටින් පිළිගනියි. නාගරික පාලනයේ සංකීර්ණත්වය හා තරගකාරී ප්‍රමුඛතාවන්හි අනේකවිධත්වය නිසා සියල්ලන් ඇතුළත් කර ගත් තිරසර නගර තහවුරු කිරීමට පරිශ්‍රම දැරීමේ දී ප්‍රධාන පෙළේ අභියෝග ගණනාවක් මතු වන බව අසල්වැසි ප්‍රදේශයේ දී මෙන් ම ඈත ප්‍රදේශවල දී ලද අත්දැකීමෙන් ද මැනවින් දන්නා කරුණකි. පහත දැක්වෙන නිර්දේශවල මූලික අභිමතාර්ථය බලහත්කාරී නෙරපා හැරීම් පිළිබඳ ගැටලුව කෙරෙහි අවධානය යොමු කිරීම වුවත් ඒවා සකස් කරන ලද්දේ එම අභියෝගයන්ට මුහුණ දීම සඳහා රජයේ හා සිවිල් සමාජයේ සියලු කොටස් වඩා පුළුල් දැක්මක් හා තිරසර ක්‍රියාකාරීත්වයක් සහිතව කැප වී ගැනීමේ හදිසි අවශ්‍යතාවක් පවත්නේ ය යන අවබෝධයෙන් යුක්තව ය.

**ශ්‍රී ලංකා රජයට**

### 1. නාගරික සංවර්ධන ප්‍රතිපත්තියෙහි සුසමාදර්ශ වෙනස(Paradigm shift)ක් ඇති කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය සිය ප්‍රවිෂ්ටය සම්බන්ධයෙන් කියන අලංකාර කතා කෙබඳු වුවත් එම ප්‍රවිෂ්ටය ස්වදේශීය හෝ ස්වාධීන වූවක් නො වේ. ඒ වෙනුවට ඉන් පිළිබිඹු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පරදුවට තබා තාක්ෂණික විශේෂඥයන්ගේ තන්ත්‍රයට ද මහජන යහපත පරදුවට තබා පෞද්ගලික ප්‍රාග්ධනයට ද සමාජ සංවර්ධනය පරදුවට තබා ප්‍රතිරූපය හා පෙනුම වෙනස් කිරීමට ද වරප්‍රසාද දෙන සාමාන්‍ය (හා නව-ලිබරල්වාදී යැයි තර්ක කළ හැකි) වට්ටෝරුව යි. මේ සම්බන්ධයෙන් ගත් කල, යටත් පිරිසෙයින් වැදගත් ප්‍රතිපත්තිමය වෙනස්කම් හතරක් සිදු කිරීම තීරණාත්මක වැදගත්කමකින් යුක්ත වේ:

- අ. නගරයට සමාජීය හා ආර්ථික වටිනාකම එක් කිරීමට පවත්නා බාධක ලෙස සලකා ජනතාව දෙස විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී නාගරික ප්‍රජාවන් දෙස බලන ප්‍රවිෂ්ටයෙන් ඉවත් වී ඔවුන් හවුල්කරුවන් ලෙස පමණක් නො ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්තිවලට හා හරයට අනුව යමින් පරමාධිපත්‍යය ලෙස ද පිළිගන්නා ප්‍රවිෂ්ටයක් වෙත යොමු වීම.
- ආ. සහභාගිත්වය, විනිවිද භාවය හා වග වීම පිළිබඳ ප්‍රබල යන්ත්‍රණයන් පවතින බව සහතික කිරීම ද එමෙන් ම ඒවා ආශ්‍රිත වෘත්තීය නිපුණතාවන් ගොඩ නැගීම ද ඇතුළු ක්‍රම මගින් ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීම යළි පණ ගැන්වීම තුළින් කොළඹ මහ නගර සභාව දුර්වල කිරීම වෙනුවට ශක්තිමත් කිරීම.
- ඇ. නාගරික සංවර්ධන අධිකාරිය හමුදාවේ පාලනයෙන් නිදහස් කර ප්‍රජාතන්ත්‍රවාදී වග වීම මගින් ද රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් උකහා ගත හැකි වෘත්තීය භාවය මගින් ද සුරක්ෂිත ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට ඊට හැකියාව ලබා දීම.
- ඈ. ඉඩම් අත්පත් කර ගැනීමේ අභිමතාර්ථය පිළිබඳව සහ අත්පත් කර ගන්නා ප්‍රමාණය හා අදාළ කොන්දේසි පිළිබඳව ඉඩම් අත්පත් කර ගැනීමෙන් පීඩාවට පත් සියලු දෙනාට ප්‍රශ්න කළ හැකි වූත් ක්‍රියාත්මක අධිකරණමය අධීක්ෂණයක් සහිත වූත් විනිවිද පෙනෙන, විශ්වසනීය ක්‍රියාවලියක් පවතින බව සහතික කිරීම.

## 2. බලහත්කාරී නෙරපා හැරීම්වලින් ආරක්ෂා කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණය කෙරෙන බව සහතික කිරීම

ඉඩම් භුක්තිය අහිමි කිරීම යනු දිගු කලක් තිස්සේ රට තුළ පවත්නා වඩාත් ම විවාදයට ලක් වන සමාජීය, දේශපාලනික හා නීතිමය ගැටලුවලින් එකකි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසම (LLRC) ගැටලුවේ බරපතළකම පිළිගෙන ඒ සම්බන්ධයෙන් නිර්දේශ ගණනාවක් නිකුත් කළ ද ඒවා මෙතෙක් ක්‍රියාත්මක වී නැත. ඒ හැරුණු විට, පශ්චාත් යුද සමයෙහි උතුරු හා නැගෙනහිර පළාත්වල දී යොදා ගත් ඉඩම් අත්පත් කර ගැනීමේ භාවිතයන් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය[67] හා වෙනත් සංවිධාන මීට කලින් අවධාරණය කළ සැලකිලිමත් වීම් ගණනාවක් ම දැන් ජාතික මට්ටමේ දී වඩ වඩා අදාළ වෙමින් පවතින බව ද පැහැදිලි ය.

ඉඩම්වලට අදාළව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පූර්ව වාර්තාවල දී ඉදිරිපත් කළ නිර්දේශ අප නැවත ඉදිරිපත් කරන අතර, රජයෙන් අප ඉල්ලා සිටින්නේ ඉඩම් භුක්තිය අහිමි කිරීම හා ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමට අදාළ සියලු නීති, රෙගුලාසි හා ක්‍රියා පටිපාටි පිළිබඳ පුළුල් හා සහභාගිත්ව සමාලෝචනයකට මුල පුරමින් පහත සඳහන් වාතාවරණය සහතික කරන ලෙස යඃ

අ. බලහත්කාරී නෙරපා හැරීම්වලට එරෙහිව හා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පීඩාවට ලක් වූවන්ට ඉහළ ම මට්ටමේ රැකවරණයක් සම්පාදනය කිරීම.

ආ. ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියෙහි ඇතුළත් ප්‍රතිපත්තිමය මූලධර්ම නීතිගත කිරීම.

ඇ. පීඩාවට පත් සියල්ලන්ට වෙනත් ස්ථානයක නැවත පදිංචි කෙරෙන්නේ ද නීතිමය හිමිකම් අයිතියක් තිබෙන්නේ ද යන්න නො තකා ඉඩම්, ඉදි කිරීම්, වත්කම් හා ව්‍යාපාර සඳහා වන්දි ලැබීමට ඇති හිමිකම පිළිගැනීම.

ඈ. සාමාන්‍යයෙන් උපයෝගිතා ගිවිසුම් මගින් දිගු කලක් තිස්සේ සේවාවන් සපයා හා පිළිගෙන ඇති දුප්පත් ප්‍රජාවන් වන රජයේ ඉඩම්වල පදිංචි වී සිටින්නන්ට පූර්ණ ලෙස වන්දි ලැබීමටත් සහභාගි වීමටත් පිළියම් වෙත ප්‍රවේශ වීමටත් ඇති හිමිකම ක්‍රියාත්මකව සුරක්ෂිත කිරීම.

ඉ. පීඩාවට පත් ප්‍රජාවන්ට පූර්ණ ලෙස හා කල් තියා තොරතුරු ද නිසි අධිකරණයක දී වැඩි දුර අභියාචනයක් කිරීමේ නීත්‍යානුකූල බලය සහිත ස්වාධීන විනිශ්චය සභාවක් හමුවේ තම ඉඩම් අත්පත් කර ගැනීමට සහ වන්දි හා වෙනත් ස්ථානවල පදිංචි කිරීම ආශ්‍රිත ක්‍රියා පටිපාටිමය හා දැඩි කොන්දේසිවලට එරෙහිව අභියෝග කිරීමේ අයිතිය ද ලබා දීම.

**නාගරික සංවර්ධන අධිකාරියට**

## 3. ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමට අදාළ පවත්නා ප්‍රතිපත්තිමය ආකෘතින් හා ආරක්ෂණයන් අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.

කලින් ද අවධාරණය කළ පරිදි, කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් හා නැවත පදිංචි කිරීම් වඩා විශාල සංවර්ධන ව්‍යාපෘතියක කොටසක් ලෙස හැම විට ම ඉදිරිපත් කෙරෙන නමුත් ඒවායේ දී ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP) පිළිපදිනු නො ලැබේ. මෙම තත්වය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පහත සඳහන් පියවරයන් ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් හා රජයෙන් ඉල්ලා සිටීඃ

---

[67] B. Fonseka සහ D. Jegatheeswaran. "Politics, Policies and Practices with Land Acquisitions and Related Issues in the North and East of Sri Lanka," විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2013 නොවැම්බර්; M. Raheem, "Protracted Displacement, Urgent Solutions: Prospects for Durable Solutions for Protracted IDPs in Sri Lanka," විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2013; B. Fonseka සහ M. Raheem, "Land in the Eastern Province – Politics, Policy and Conflict," විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2010 මැයි, B. Fonseka සහ M. Raheem, "Land in the Northern Province – Post-War Politics, Policy and Practices," විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2011 දෙසැම්බර් බලන්න.

අ. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ කොටසක් ලෙස නෙරපා හැරෙන්නා වූත් ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය මගින් ද දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සහ ගාල්ලේ හා නුවර ලෝක බැංකුව අරමුදල් සම්පාදනය කරන ව්‍යාපෘති නිසා පීඩාවට පත් අය භුක්ති විඳින ජාත්‍යන්තර මූල්‍ය සම්පාදනය සමග බැඳී ඇති වෙනත් සුරක්ෂිතතාවන් මගින් ද සැපයෙන රැකවරණයන් සැලසීම ප්‍රතික්ෂේප වී ඇත්තා වූත් අයට දෙයාකාරයක ප්‍රමිතීන් අදාළ කිරීමේ හා වෙනස්කම් කිරීමේ භාවිතය අවසන් කිරීම.

ආ. ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියේ ප්‍රධාන මූලධර්මවලින් එකක් වන "ව්‍යාපෘතිය සඳහා පවතින විකල්පයන් හා ව්‍යාපෘතිය තුළ පවත්නා විකල්පයන් ගැන සිතා බැලීම මගින් ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් හැකි තාක් දුරට අවම කිරීම" පිළිබඳ මූලධර්මය අනුව ක්‍රියා කරමින් ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම් අවම කර ඇති බව සෑම සිද්ධියක දී ම පෙන්නුම් කිරීමට පවතින බැඳීම පිළිගැනීම.

ඇ. ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය යොදා ගැනීමේ දී අතීත යහපත් භාවිතයන්ගෙන් උගෙනීම. උදාහරණයක් ලෙස, දක්ෂිණ ලංකා ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය පහත පරිචයන්ගෙන් සමන්විත විය:[68]

- වන්දි පිළිබඳ කොන්දේසි සාකච්ඡා කිරීම සඳහා පීඩාවට පත් ජනතාවට අවකාශ සැලසෙන ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කමිටුව (LARC) පිහිටුවීම.
- හිමිකම් අයිතිය නොමැති අය ද වන්දි ලැබීමට සුදුස්සන් ලෙස පිළිගෙන ජීවනෝපායන් නැවත ආරම්භ කිරීමට සහාය වීම.
- ගොදුරු වීමට ඉඩ ඇති කණ්ඩායම් හඳුනාගෙන අමතර සහායයන් පිරිනැමීම.
- ලියාපදිංචි විධිමත් ව්‍යවසායන් හා නොවිධිමත් ව්‍යවසායන් යන දෙවර්ගය ම වන්දි ලැබීමට සුදුසු බව පිළිගැනීම.
- නැවත පදිංචි කිරීමේ අඩවි තෝරා ගන්නේ පීඩාවට පත් ප්‍රජාවන්ගේ අදහස් විමසමින් බවත් ඒවා පිහිටා තිබෙන්නේ මුල් නිවාසවලින් කි.මී. 1කට වඩා අඩු දුරකින් බවත් සහතික කිරීම.

## 4. අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට විසඳුම් සෙවීම හා කොළඹ දී දැනට මත් නෙරපා හැර ඇති හා නෙරපා හැරීමේ අවදානමට ලක්ව සිටින අයට අධිකරණය වෙත ප්‍රවේශය සහතික කිරීම

ඉහත නිර්දේශ කර ඇති පියවරයන් මත පදනම් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කොළඹ සිදු වන බලහත්කාරී නෙරපා හැරීම් සම්බන්ධයෙන් පහත සඳහන් සුවිශේෂ පියවරයන් ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් හා රජයෙන් ඉල්ලා සිටී:

අ. ක්‍රියාවලිය හා මේ දක්වා ලද අත්දැකීම් සමාලෝචනයකට ලක් කරන තෙක් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත සියලු නෙරපා හැරීම් නතර කරන බව නිවේදනය කිරීම.

ආ. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට අදාළ සියලු තොරතුරු විශේෂයෙන් ම ඉඩම් අත්පත් කර ගැනීමට හා නැවත පදිංචි කිරීමට අදාළ සියලු පැතිකඩවල් ප්‍රසිද්ධ කිරීම. සමීක්ෂණවල ප්‍රතිඵල, ප්‍රතිසංවර්ධනය සඳහා හඳුනා ගත් අඩවි, පෞද්ගලික හා රාජ්‍ය ඉඩම්වල සීමා මායිම් සහ යෝජිත අත්පත් කර ගැනීම් හා නැවත පදිංචි කිරීම් පිළිබඳ න්‍යාය පත්‍රයන් මීට අයත් ය.

ඇ. අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලියේ සියලු පැතිකඩවලින් හමුදාව ඉවත් කිරීම සහ ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියෙහි ඇතුළත් ප්‍රතිපත්තිමය මූලධර්ම, මෙම වාර්තාවේ 1 වන කොටසෙහි නැවත නැවත සඳහන් කෙරුණු ජාතික නිවාස ප්‍රතිපත්තිය අපේක්ෂා කරන ප්‍රවිෂ්ටය පිළිපැදීම, සියලු නීතිමය පිළියම් වෙත ප්‍රවේශය සහතික කිරීම ඇතුළු සාධාරණ නීතිමය ක්‍රියාවලිය අනුගමනය කිරීම.

[68] Sharni Jayawardane, "Right of Way: A journey of resettlement," දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2011.

ඇ. ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම තුරන් කිරීම හා අවම කිරීම සඳහා විශේෂයෙන් ම පෙර පැවති ස්ථානයේ ම හෝ සුදුසු වෙනත් ස්ථානයක ප්‍රතිසංවර්ධනය සිදු කිරීම ඇතුළු යොදා ගත හැකි සියලු විකල්පයන් විමසා බැලීම.

ඉ. විනිවිද පෙනෙන, හමුදාකරණය නොකළ හා සහභාගිත්ව ක්‍රියාවලියක් ඔස්සේ අවශ්‍ය තැන්වල දී සවිස්තර හිමිකම් රාමුවක් සහිත නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ද ඇතුළත් කොට පීඩාවට පත් සෑම ප්‍රජාවක් සඳහා ම සවිස්තර ප්‍රතිසංවර්ධන සැලැස්මක් සකස් කිරීම. අභිමතාර්ථය විය යුත්තේ සියලු පැතිකඩවල දී ප්‍රජාවන්ට ප්‍රමාණවත් ලෙස ප්‍රතිලාභ සැලසෙන බවත් සිරස් මුඩුක්කු නිවාස බවට පත් විය හැකි අලුතින් ඉදි කළ උස තට්ටු ගොඩනැගිලිවල බද්ධ නිවාස හිමි කර ගැනීම වෙනුවට ඔවුන් උසස් ජීවන තත්වයන් කරා ළඟා වන බවත් සහතික කිරීම යි.

ඊ. වෙනත් ස්ථානයක පදිංචි කිරීම නො වැළැක්විය හැකි තැන්වල දී එසේ පදිංචි කරන අඩවි තීරණය කරන්නේ පීඩාවට පත් ප්‍රජාවන්ගේ අදහස් විමසා බවත් පිරිවැයකින් තොරව නිවාස සම්පාදනය කරන බවත් සහතික කිරීම.

උ. පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කරන බව සහතික කිරීම – මෙම වාර්තාවෙහි ඇතුළත් සිද්ධි අධ්‍යයනයන්හි සඳහන් කර ඇති පරිදි, ප්‍රධාන භාෂාව ලෙස දෙමළ බස භාවිත කරන බොහෝ පුරවැසියන් පැවසුවේ තමන් නෙරපා හැරීමට හා නැවත පදිංචි කිරීමට අදාළව අත්සන් කළ ලියකියවිලි තමන්ට සම්පූර්ණයෙන් නොවැටහුණු බව යි. රජයේ ආයතන සමග සිදු වන සෑම අන්තර් ක්‍රියාවක දී හා සන්නිවේදනයක දී ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මෙන් ම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි ද විදහා දක්වා ඇති පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම තීරණාත්මක ලෙස වැදගත් වේ.

එ. දැනට මත් වෙනත් ස්ථානවල පදිංචි කර ඇති අයට මෙන් ම නිවාස, වත්කම් හා විධිමත් හෝ නොවිධිමත් ව්‍යාපාර අහිමි වීම නිසා අවතැන් විය හැකි අයට ද වන්දි ලබා දීම.

ඒ. අදාළ හා අර්ථාන්විත වෘත්තීය පුහුණුව, රැකියා නිර්මාණය, අධ්‍යාපනය හා සෞඛ්‍යය වෙත ප්‍රවේශය සහතික කිරීම හා ප්‍රවාහනය යනාදී වශයෙන් මානව සම්පත්වල කෙරෙන ආයෝජනය මගින් සමාජය බල ගැන්වීම පදනම් කර ගත් මූල්‍යමය නොවන වන්දි ස්වරූප කෙරෙහි අවධානය යොමු කරන බව සහතික කිරීම.

ඓ. ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ හෝ නොවිධිමත් ව්‍යාපාර යන දෙවර්ගය හරහා ම සැලසිය හැකි ජීවනෝපාය ආදායම් අහිමි වීම සඳහා වන්දි ගෙවීම, අන්තර්වාර කාල පරිච්ඡේදයේ දී යැපුම් ආදායම් මූලාශ්‍රයක් සම්පාදනය කිරීම, රැකියා අවස්ථා නිර්මාණය කිරීම සහ නිසි පුහුණු හා සම්පත් හා ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය සපයමින් මෙම මුල පිරීම් ඌනපූරණය කිරීම ඇතුළු පැතිකඩවල් ගණනාවක් සැලකිල්ලට ගන්නා ජීවනෝපාය පුනරුත්ථාපන ව්‍යාපෘතිවලට කැප වීම හා ඒවා ක්‍රියාත්මක කිරීම.

ඔ. මේ දක්වා බලහත්කාරී නෙරපා හැරීම්වල ප්‍රතිඵලයක් ලෙස පීඩාවට පත්ව ඇති සියල්ලන්ට පූර්ණ හා නිසි හානිපූරණ සම්පාදනය කරන බව සහතික කිරීම.

**කොළඹ මහ නගර සභාවට**

කොළඹ මහ නගර සභාව ක්‍රියාත්මක වන්නේ සැලකිය යුතු දේශපාලන හා සම්පත් බාධක යටතේ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිළිගනී. එහෙත්, එම සභාව කොළඹ සියලු නිවැසියන්ගේ අවශ්‍යතාවන්ට සේවය කිරීමේ නිල පැවරුමක් (Mandate) සහිත ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ ආයතනයක් ය යන කරුණ පදනම් කර ගෙන අපි එම සභාවෙන් මෙසේ ඉල්ලා සිටිමු:

අ. සියලු බලහත්කාරී නෙරපා හැරීම් නතර කිරීම සඳහා සහ දැනට මත් නෙරපා හැර ඇති හා නෙරපා හැරීමේ අවදානමට මුහුණ දී සිටින අයගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා හැකි සෑම පියවරක් ම ගන්න.

ආ. කොළඹ සියලු නිවැසියන්ට සාර්ථක, සියල්ලන් ඇතුළත් කර ගත් හා වග වීමෙන් යුතු පළාත් පාලන ආයතනයක් සම්පාදනය කිරීම පිළිබඳ මහ නගර සභා නිල පැවරුමට

නාගරික සංවර්ධන අධිකාරිය විසින් හානි නොකරන බව සහතික කිරීම සඳහා ක්‍රියාත්මකව වැඩ කරන්න.

ඇ. මහ නගර සභා සේවාවන්හි හා එහි වෘත්තීය හැකියාවන්හි විශේෂයෙන් ම නගරයෙහි වෙසෙන වඩාත් ම ගොදුරු වීමට ඉඩ ඇති නිවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සියලු පියවර ගන්න.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට**

කොළඹ සිදු වන මහා පරිමාණ බලහත්කාරී නෙරපා හැරීම් නිසා දැන් සිදු වෙමින් පවතින හා අනාගතයේ සිදු විය හැකි මානව අයිතිවාසිකම් උල්ලංඝන මාලාව පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වහා ම දැනුවත් විය යුතු ය. මෙම වාර්තාවේ දී මතු කෙරෙන නොයෙක් මානව හිමිකම් ගැටලු පිළිබඳව තම අභිමතය පරිදි වන (*suo moto*)පරීක්ෂණ ආරම්භ කරන ලෙසත් පීඩාවට පත් ප්‍රජාවන් වෙත ළඟා වී යුක්තිය සෙවීමේ දී ඔවුන්ට සහාය වන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කොමිසමෙන් ඉල්ලා සිටී. බලහත්කාරී නෙරපා හැරීම්වලින් වළකින ලෙස, සියලු පුරවැසියන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන ලෙස හා බලහත්කාරී නෙරපා හැරීම්වලට එරෙහිව සියලු පුරවැසියන්ගේ නීතිමය සුරක්ෂිතතාවන් වැඩි දියුණු කිරීම ඇතුළුව නීතියේ ආධිපත්‍යය පිළිගෙන එය අනුගමනය කරන ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවට හා නාගරික සංවර්ධන අධිකාරියට ප්‍රසිද්ධියේ බල කරන මෙන් ද අපි කොමිසමෙන් ඉල්ලා සිටිමු. මානව හිමිකම් සැලකිලිමත් වීම් පිළිබඳ බලහත්කාරී නිහඬතාවකට තුඩු දිය හැකි ආකාරයෙන් ආරක්ෂක හමුදාවන් හෝ නාගරික සංවර්ධන අධිකාරිය කරන බිය ගැන්වීම්වලට එරෙහිව පුරවැසියන් හා සිවිල් සමාජ සංවිධාන ආරක්ෂා කිරීමට ද කොමිසම පියවර ගත යුතු ය.

**ලෝක බැංකුවට හා අරමුදල් සපයන වෙනත් ආයතනවලට**

මෙම වාර්තාවේ දී ඇති කෙරෙන සැලකිලිමත් වීම් මාලාව හා ඉහත ඉදිරිපත් කළ නිර්දේශ සැලකිල්ලට ගන්නා ලෙස ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ලෝක බැංකුවෙන් හා වෙනත් ණය දෙන ආයතන වලින් ඉල්ලා සිටී. තම ව්‍යාපෘති බලහත්කාරී නෙරපා හැරීම්වලට ඍජුව හෝ වක්‍රව සහාය නොදෙන බව සහතික කිරීම ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ණය දෙන ආයතනවල විශේෂයෙන් ම ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා යහපත් භාවිතයන්ට සහාය දීමේ ඉතිහාසයක් සහිත ණය දෙන ආයතනවල වගකීමකි. එපමණක් නො ව, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට හමුදාකරණය වර්ධනය කරන නාළිකාවක් ලෙස සේවය කරන නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතනවලට තමන් දෙන සහායේ පුළුල් ඇඟවුම් ගැන දැනුවත් වීම ද ඒ හා සමානවම වැදගත් වේ. එම නිසා, ව්‍යාපෘති හා ඒවාට අරමුදල් සපයන ආයතන ප්‍රජාතන්ත්‍රවාදයට, නීතියේ ආධිපත්‍යයට හා මානව හිමිකම්වලට පූර්ණ ලෙස ගරු කරන බව සහතික කිරීමට ඉක්මන් පියවර ගන්නා ලෙස සියලු ණය දෙන ආයතනවලින් විශේෂයෙන් ම ලෝක බැංකුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටී.

## 1 වන ඇමුණුම

**ජාතික ස්වේච්ඡාමය නොවන නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය (NIRP)**:
**අරමුණු හා ප්‍රධාන ප්‍රතිපත්තිමය මූලධර්ම**

***( උපුටා ගැනීම : සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය කියාත්මක කිරීම සහ ඉඩම් අත්කර ගැනීම -***

*ප්‍රකාශනය - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය)*



# 2. සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය[1]

### 2.1 හැඳින්වීම

සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම නිසා අවතැන් වන පවුල්වල සුභසිද්ධිය සඳහා 2001 වර්ෂයේ දී සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා රජය විසින් බලාත්මක කරන ලදී. මෙම ප්‍රතිපත්තිය (i) ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක්වන පවුල් වලට ප්‍රමාණවත් වන්දි ගෙවීම, නැවත ස්ථානගත කිරීම හා පුනරුත්ථාපනය කිරීම (ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පමාවීම සහ පිරිවැය (වියදම්) ඉහළ යාම අවම කිරීම සහ (iii) ප්‍රජා සම්බන්ධතාවයන් ස්ථාපනය කිරීම අරමුණු කර ගෙන සකස් කර තිබේ.

### 2.2 සාධාරණීකරනය

සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්කර ගැනේ. මේ නිසා තම ඉඩම් හා නිවාස අහිමි වන ජනතාවට තමන්ට නුපුරුදු ස්ථාන වල පදිංචි වීමට සිදුවේ. සාමාන්‍යයෙන් නැවත පදිංචි කිරීම අවතැන්වූවන්ට විවිධ දුෂ්කරතා ගෙනදේ. නැවත පදිංචි කිරීම නිසි පරිදි සිදුවී නොමැති අවස්ථාවල ඇතිවන අයහපත් ප්‍රතිඵල ගණනාවක් ඇත. ඒ අතර ඉඩම්, නිවාස හා රැකියා අහිමි වීම නිසා බලපෑමට ලක්වන පවුල් වල දිළිඳු බව වැඩිවීම, ළදරු හා කාන්තා මරණ වැඩිවීම, ආහාර අනාරක්ෂිතභාවය, පොදු දේපළ වලට හා රජයේ සේවාවන්ට ලඟාවීමේ අපහසුතාවය සහ පවත්නා සමාජ සම්බන්ධතාවයන් බිඳ වැටීම ප්‍රධාන වෙයි. සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව ජාත්‍යන්තර, කලාපීය හා දේශීය අත්දැකීම් තුළින් මනා අවබෝධයක් ලබා ගත හැකි වේ. මෙම අත්දැකීම් නිසි පරිදි අධ්‍යයනය කොට ප්‍රයෝජනයට ගතහොත් බලපෑමට ලක්වන ජනතාවට සිදුවන අයහපත් බලපෑම් සමහරක් අවම කර ගැනීමට හැකියාව තිබේ.

වරින් වර සංශෝධනය කරන ලද 1950 වර්ෂයේ ඉඩම් අත්කර ගැනීමේ පනත අනුව වන්දි ගෙවිය හැක්කේ ඉඩම්, ඉදිකිරීම් සහ වගාවන් සඳහා පමණකි. එම පනත අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අධිකාරීන්ට නැවත පදිංචි කිරීමේදී ඇතිවන ගැටලු සලකා බැලීමට අවකාශ නොමැත. එලෙස ව්‍යාපෘති අධිකාරීන්ගේ අවධානයට යොමු නොවන ගැටලු අතර (අ) මහජනතාවට අත්වන අයහපත් ප්‍රතිඵල මගහැරලීමට හෝ අවම කර ගැනීමට හැකි වෙනත් විකල්ප ව්‍යාපෘති ගැන සලකා බැලීම, (ආ) ඉඩම් වලට ඔප්පු නොමැති පුද්ගලයන්ට වන්දි ගෙවීම, (ඇ) නැවත පදිංචි කිරීම සඳහා ඇති විවිධාකාර විකල්ප අවස්ථා පිළිබඳව බලපෑමට ලක්වන පුද්ගලයන් හා ඔවුන්ගේ සත්කාර ප්‍රජාව විමසීම, (ඈ) බලපෑමට ලක්වන පුද්ගලයින්ට හා ඔවුන්ගේ සත්කාර ප්‍රජාවට සාර්ථක ලෙස සමාජයීය හා ආර්ථික වශයෙන් අනුකලනය වීමට අවශ්‍ය මං පාදා දීම සහ (ඉ) බලපෑමට ලක්වන පුද්ගලයින් සමාජීය හා ආර්ථික වශයෙන් සම්පූර්ණයෙන්ම පුනරුත්ථාපනය කිරීම වෙයි.

1988 අංක 56 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතෙහි ස්ව කැමැත්තෙන් පදිංචි වීමට අදාළ විධිවිධාන කීපයක් සලසා ඇත. ජාතික පාරිසරික පනතෙහි කාණ්ඩ iv-c අනුව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍ය කරන ව්‍යාපෘති සහ වෙනත් කර්තව්‍යයන් වල ලැයිස්තුවක් 1995 පෙබරවාරි 23 දින දරණ අංක 859/14 ගැසට් නිවේදනය මගින් අමාත්‍යවරයා නිගමනය කොට තිබේ. පවුල් 100කට වඩා වැඩි පිරිසක් නැවත පදිංචි කිරීම පිළිබඳව මෙම ලැයිස්තුවේ අංක 12 මගින් විස්තර කර ඇත.

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා බලපෑමට ලක්වන පවුල් පිළිබඳව සාධාරණව සහ සමානව සැලකීම තහවුරු කිරීමේ අරමුණු ඇතිව සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම පිළිබඳ

[1] ඉඩම් අමාත්‍යාංශය විසින් 2003 වර්ෂයේදී පළකරන ලද 'සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අත්පොත' ඇසුරෙන් සකසා ඉදිරිපත් කොට ඇත.

ජාතික ප්‍රතිපත්තිය සම්මත කොට තිබේ. ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සිය කැමැත්තෙන් තොර නැවත පදිංචි කිරීමේ ජාත්‍යන්තරව පිළිගත් යහපත් පිළිවෙත්වලට ද ගැළපෙන රාමුවක් ස්ථාපිත කිරීමට ද මෙම ප්‍රතිපත්තිය මගින් ඉඩ සලසා ඇත.

## 2.3 ප්‍රතිපත්ති අරමුණු

- ☑ බලපෑමට ලක්වන පුද්ගලයින් ඵලදායී හා තිරසර ලෙස ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාවලියට මං සැලසීමෙන් නැවත පදිංචි කිරීම නිසා අත්වන අයහපත් සෘණ ප්‍රතිඵල මඟ හැරලීම සහ අවම කිරීම. සංවර්ධන ව්‍යාපෘති මගින් බලපෑමට ලක්වන පුද්ගලයින්ට කල් නොයවා සම්පූර්ණ වශයෙන් වන්දි මුදල් ගෙවා සාර්ථකව නැවත පදිංචි කර ඇති බව තහවුරු කිරීම. අවතැන් වූ පුද්ගලයින්ගේ ජීවනෝපායයන් ප්‍රතිස්ථාපනය කළ යුතු අතර ජීවන තත්ත්වය නංවාලිය යුතුය.
- ☑ සංවර්ධන ව්‍යාපෘති සඳහා රජය විසින් ඉඩම් අත්කර ගැනීම නිසා මහජනතාව දරිද්‍රතාවයට ඇද නොවැටෙන බවට තහවුරු විය යුතුය.
- ☑ අනිවාර්ය ඉඩම් අත්කර ගැනීම නිසා මානසික, සංස්කෘතික, සමාජීය අසහනයට පත්වන පුද්ගලයින්ට සහන සැලසීම
- ☑ පහසුවෙන් ලබා ගත හැකි හා ප්‍රවේශ විය හැකි ක්ෂණික සහන සැපයීම සඳහා ප්‍රතිපාදන සලසා ඇති බව බලපෑමට ලක්වන පුද්ගලයින්ගේ දැනගැනීමට සැලැස්වීම.
- ☑ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අධිකාරිය සහ අගතියට පත් පුද්ගලයින් විසින් කාල රාමුවක් සහිතව පාරදෘශ්‍ය (විනිවිද) භාවයෙන් යුත්, වගවීම සහිත එකිනෙකාගේ අදහස් විමසීමෙන් පසුව එකඟ වෙන ලද නැවත පදිංචි කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

## 2.4 ප්‍රතිපත්ති සිද්ධාන්ත

- ☑ ව්‍යාපෘතියට පරිබාහිරව මෙන්ම ව්‍යාපෘතිය තුළ ඇති විකල්ප විමසා බැලීමෙන් නැවත පදිංචි කිරීම හැකිතාක් දුරට අවම කිරීමට හෝ මගහැරලීමට කටයුතු කළ යුතුය.
- ☑ නැවත පදිංචි කිරීම මගහැරිය නොහැකි අවස්ථාවන්හිදී බලපෑමට ලක් වූ පුද්ගලයින්ට තම ජීවිතය යළි ස්ථාපිත කර ගැනීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීමට සහාය ලබා දිය යුතුය.
- ☑ ස්ත්‍රී පුරුෂ සමානතාවය, ප්‍රතිපත්තිය පුරාම තහවුරු කළ යුතුවා මෙන්ම ඊට අනුගතව කටයුතු කළ යුතුය.
- ☑ නැවත ස්ථාන ගත කිරීම සඳහා ස්ථාන තෝරා ගැනීම, ජීවනෝපායයන් සඳහා වන්දි ගෙවීම, සංවර්ධන විකල්ප අවස්ථා සලකා බැලීම යන සෑම අවධියකදීම ලැබෙන මුල්ම අවස්ථාවේදී බලපෑමට ලක් වූ පිරිස් සම්පූර්ණයෙන්ම සම්බන්ධ කර ගත යුතුය.
- ☑ ඉඩම් අහිමි වූ පුද්ගලයන්ට වන්දි ලබා දීමේදී කැමැති අයට ඉඩම් ලබා දීම එක් වරයක් විය යුතුය. ඉඩම් ලබා දීමට නොහැකි අවස්ථාවන්හිදී බලපෑමට ලක් වූ සෑම පුද්ගලයෙකුටම මුදලින් වන්දි ලබා ගැනීමේ අවස්ථාව සලසා දිය යුතුය.
- ☑ ඉඩම්, ඉදිකිරීම්, වෙනත් වත්කම් හා ආදායම් අහිමිවූ පුද්ගලයන්ට වන්දි ප්‍රමාණය ගණනය කිරීම ප්‍රතිසම්පාදනය කිරීමේ පූර්ණ වියදම් (Replacement Cost) මත පදනම් විය යුතුය. මෙම වන්දි මුදලට ගණුදෙනු වියදම් ද ඇතුළත් විය යුතුය.
- ☑ නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පළාත් සභා හා පළාත් පාලන අධිකාරීන්ගේ පූර්ණ සහභාගීත්වය මත සිදුවිය යුතුය.
- ☑ සමාජීය හා ආර්ථික වශයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් සත්කාර ප්‍රජාව සමඟ අනුකලනය වීමට හැකිවෙන ආකාරයට සහභාගීත්ව ක්‍රමෝපායන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.
- ☑ බලපෑමට ලක් වූ පුද්ගලයින්ට පොදු දේපල, සම්පත්, ප්‍රජා හා මහජන සේවාවන් ලබා දිය යුතුය.

- ☑ නැවත පදිංචි කිරීමේ කටයුතු, බලපෑමට ලක් වූ පුද්ගලයින් වෙනුවෙන් සිදු කරන සංවර්ධන ක්‍රියාවලියක් ලෙස සැලසුම් කළ යුතුය.
- ☑ ඉඩම් වලට නීත්‍යානුකූල හිමිකම් ඔප්පු නොමැති බලපෑමට ලක් වූ පවුල් සඳහා සාධාරණය හා යුක්තිය ඉෂ්ට විය යුතුය.
- ☑ කිසිවක් කර කියා ගත නොහැකි ලෙස අවදානමට ලක්වූ පිරිස් වෙනම හඳුනාගෙන, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීමට අවශ්‍ය ප්‍රමාණවත් සහාය ලබා දිය යුතුය.
- ☑ නැවත පදිංචි කිරීම සහ වන්දි ගෙවීම සඳහා වැයවන සම්පූර්ණ පිරිවැය ව්‍යාපෘති ක්‍රියාත්මක අධිකාරිය විසින් දැරිය යුතුය.

## 2.5 ප්‍රතිපත්තිය වලංගු වන ව්‍යාපෘති

1. ඉඩම් අත්කර ගනිමින් හෝ ඉඩම් අයිතිය රජය වෙත යළි ලබා ගනිමින් කෙරෙන සියලු සංවර්ධන කටයුතු
2. (අරමුදල් සැපයෙන මූලාශ්‍ර ගැන නොතකා) සිදු කෙරෙන සියලුම ව්‍යාපෘතීන්
3. ප්‍රතිපත්තිය බලාත්මක වූ දිනට සැලසුම් කෙරෙමින් තිබුණා වූ ව්‍යාපෘති සහ අනාගතයේ ක්‍රියාත්මක කෙරෙන සියලුම ව්‍යාපෘතීන්

## 2.6 ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ නීතිමය රාමුව

- ☑ ඉඩම් අත්කර ගැනීමේ පනත
- ☑ ජාතික පාරිසරික පනත
- ☑ නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සැලසුම් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත අවස්ථාවලට බලපාන අනෙකුත් නීති රීති හා අණ පනත් (උදාහරණ ලෙස නාගරික සංවර්ධන පනත, වෙරළ සංරක්ෂණ පනත)
- ☑ ඉහතින් සඳහන් කර ඇති පනත් යටතේ සම්මත කර ඇති රෙගුලාසි
- ☑ උසාවි තීරණ මගින් නියම කර ඇති නීති මූලධර්ම

## 2.7 ඉඩම් අමාත්‍යාංශයේ වගකීම්

සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, පරිපාලනය සහ සංවර්ධනය කිරීමේ වගකීම ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරී ඇත. මෙම කර්තව්‍යය රාජ්‍ය සහ සිවිල් සමාජ ආයතන ගණනාවක් සමඟ එක්ව ඉටු කල යුතු වේ. මේ ආයතන අතරට මධ්‍යම පරිසර අධිකාරිය, ව්‍යාපෘති ක්‍රියාත්මක බලධාරීන්, අදාළ අමාත්‍යාංශ සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළත් වේ.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ වගකීම් පුළුල් කාණ්ඩ හතරක් යටතට ගැනේ.

- ☑ සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පරිපාලනය කිරීම
- ☑ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් ආයතන වලට සහාය වීම
- ☑ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඉඩම් අත්කර ගැනීම
- ☑ එම ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ධාරිතාවය ගොඩනැංවීම

## 2.8 ජාතික ප්‍රතිපත්තිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ

ක්‍රියාකාරකම් අත්පොතට අමතරව සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පරිපාලනය කිරීම තවත් මාර්ගෝපදේශ තුනක් මගින් පහසු කෙරේ. ඉඩම් අමාත්‍යාංශයේ ධාරිතාවය ගොඩනැංවීමේ ප්‍රයත්නයන්ගේ අංගයක් ලෙස මාර්ගෝපදේශ තුනක් සකසා ඇත.[2]

[2] ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වූ අංක TA.3792 දරණ 'සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය සඳහා ධාරිතාවයන් ගොඩනැගීමේ ව්‍යාපෘතිය' යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2003 දී මෙම මාර්ගෝපදේශ ප්‍රකාශ කොට ඇත.

ඒවා නම්;

1. සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අදාළ පොදු මාර්ගෝපදේශ
2. සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම සඳහා ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ
3. සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ සහභාගීත්ව ක්‍රියාවලියක් සඳහා මාර්ගෝපදේශ

සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ හරය සහ එය ක්‍රියාත්මක කිරීමේ විධික්‍රම හොඳින් සහ සම්පූර්ණයෙන් අවබෝධ කර ගැනීම සඳහා ඉහතින් සඳහන් කළ මාර්ගෝපදේශ හොඳින් ග්‍රහණය කර ගැනීම අවශ්‍ය වේ. මෙම අත්පොත ඉඩම් අමාත්‍යාංශය ඉලක්ක කර පිළියෙල කර ඇතත් සංකල්ප, සැලසුම් සහ ක්‍රියාත්මක රාමුව ඉඩම් අමාත්‍යාංශය අභිබවා ඉදිරියට ගමන් කරයි. ව්‍යාපෘති ක්‍රියාත්මක ආයතන, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පරිපාලන අධිකාරීන් සහ ග්‍රාමීය මට්ටමේ සංවිධාන නැවත පදිංචි කිරීම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු වල නිරත වේ.

2 වන ඇමුණුම

**පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නීතිය තුළ පවත්නා විධිවිධාන මොනවා ද?**

**ඉඩම් අත්පත් කර ගැනීමේ පණත**

ඉඩම් අත්පත් කර ගැනීමේ පණත (LAA) යනු පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සඳහා විධිවිධාන සම්පාදනය කරන මූලික නීති සංග්‍රහය යි. ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ වෙනත් මොන යම් නීතියක් වුවත් කියවිය යුත්තේ ඉඩම් අත්පත් කර ගැනීමේ පණතේ විධිවිධාන සමග සසඳමිනි.

රජයට පහත සඳහන් ක්‍රියාවලිය අනුව මහජන කාර්යයන් සඳහා ඕනෑ ම ඉඩමක අත්පත් කර ගත හැකි බව පණත ප්‍රකාශ කරයිඃ

(1) යම් ප්‍රදේශයක තිබෙන ඉඩමක් මහජන කාර්යයක් සඳහා අවශ්‍ය යැයි අමාත්‍යවරයා තීරණය කරයි.

(2) එම ප්‍රදේශයේ තිබෙන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍ය බවත් මහජන කාර්යය සඳහා එම ඉඩමේ යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා එම ප්‍රදේශයේ තිබෙන ඕනෑ ම ඉඩමක නිශ්චිත ක්‍රියාවන් කළ හැකි බවත් ප්‍රකාශ කරමින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීමක් ප්‍රදර්ශනය කරන ලෙස අමාත්‍යවරයා ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ අත්පත් කර ගැනීමේ නිලධාරියාට නිර්දේශ කරයි.

(3) ප්‍රාරම්භක පියවරයන් අවසන් කළ විට, යම් ඉඩමක් මහජන කාර්යයන් සඳහා අවශ්‍යව තිබෙන්නේ යැයි 5 වන වගන්තිය අනුව අමාත්‍යවරයා ප්‍රකාශයක් නිකුත් කරන අතර, එම ප්‍රකාශය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීම ද ඉඩමෙහි හෝ ඉඩම අසල ප්‍රදර්ශනය කිරීම ද කළ යුතු ය.

(4) අත්පත් කර ගැනීමට යන ඉඩමට හිමිකමක් තිබෙන යම් පුද්ගලයෙකු සිටී නම්, තම හිමිකමේ ස්වභාවය ද වන්දි ප්‍රමාණය ඇතුළු වන්දි සඳහා ඇති හිමිකම පිළිබඳ විස්තර ද අත්පත් කර ගැනීමේ නිලධාරියාට දැනුම් දීමට මෙවිට අවස්ථාව දෙනු ලැබේ.

(5) විභාග කරන නිලධාරියකු , වෙනත් කරුණු අතර, ඉඩමේ වෙළඳ පොළ වටිනාකම, වන්දි සඳහා ඇති හිමිකම හා වන්දි ඉල්ලා සිටින පාර්ශ්වයන්ගේ හිමිකම පිළිබඳව විමර්ශනයක් කර, වන්දි සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන් ද ඔවුන්ගේ හිමිකමේ ස්වභාවය ද වන්දි ප්‍රමාණය ද සම්බන්ධයෙන් නිශ්චිත තීරණයකට එළඹෙයි.

(6) ලබා දෙන වන්දිය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන යම් පුද්ගලයෙකු වේ නම්, පණතින් පිහිටුවනු ලබන "සමාලෝචන මණ්ඩලයක්" වෙත අභියාචනා කළ හැකි ය. එවැනි අභියාචනයක් කරන්නේ නම්, අත්පත් කර ගැනීමේ නිලධාරියාගේ නියෝගය ලැබී දින 21ක් ඇතුළත එම අභියාචනය ඉදිරිපත් කළ යුතු ය.

(7) යම් පුද්ගලයෙකු සමාලෝචන මණ්ඩලයේ තීරණයෙන් සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහුට/ඇයට සමාලෝචන මණ්ඩලයේ තීරණයෙන් දින 21ක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

**රජයේ ඉඩමක් නැවත අත්පත් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවරයන් කවරේ ද?**

**1979 අංක 7 දරණ රජයේ ඉඩම් (නැවත අත්පත් කර ගැනීමේ) පණත**

<u>ඉවත් කිරීමේ ක්‍රියාවලිය</u>

පණත රජයේ ඉඩම අර්ථ නිරූපණය කරන්නේ "රජයට නීත්‍යානුකූල හිමිකමක් ඇති හෝ එහි කිසි යම් ගොඩනැගිලි යනාදියක් ඇත් නම් ඒවා ද ඇතුළුව රජය විසින් මුදා හැරිය හැකි, සහ ඊට සම්බන්ධිතව හෝ අදාළව රජයට සියලු අයිතිවාසිකම්, හිමිකම් හා වරප්‍රසාද ඇති ඉඩමක්" ලෙස ය.

එවැනි ඉඩමක් අනවසරයෙන් භුක්ති විඳින හෝ අත් කර ගෙන සිටින කිසි යම් පුද්ගලයෙකු වේ නම්, එම ඉඩමේ හිස් වූ භුක්තිය නිසි බලධරයෙකු වෙත හෝ නොතීසියේ නියම කර ඇති පරිදි වෙනත් බලය ලත් පුද්ගලයෙකු වෙත, නොතීසිය නිකුත් කළ දිනයේ සිට හෝ එවැනි නොතීසියක් ප්‍රදර්ශනය කළ දිනයේ සිට දින තිහක් ඇතුළත භාර දෙන ලෙස දන්වා නොතීසි (ඉවත් කිරීමේ නිවේදනය) යැවීමට පණත නිසි බලධරයා බල ගන්වයි.

එවැනි නොතීසියකට අනුකූලව කටයුතු කිරීමට අසමත් වන්නේ නම්, (විමර්ශනයකින් පසුව) ඉඩම අත් කර ගෙන සිටින එවැනි පුද්ගලයෙකුට හෝ ඔහුගෙන් යැපෙන්නන්ට එම ඉඩමෙන් පිට වන ලෙස නියම කරමින් නියෝගයක් නිකුත් කිරීමට මහේස්ත්‍රාත් උසාවියට බලය ලැබේ.

<u>නිදොස් කිරීමේ ක්‍රියාව</u>

පණතේ 12 වන වගන්තිය අනුව, මෙම පණතේ විධිවිධාන යටතේ ඉඩමකින් පිට කර ඇති කිසි යම් පුද්ගලයෙකු වේ නම් හෝ එම ඉඩමේ හිමිකරු යැයි උරුමකම් කියන කිසි යම් පුද්ගලයෙකු වේ නම්, ඔහුට/ඇයට සිය හිමිකම නිදොස් කරන ලෙස ඉල්ලා රජයට විරුද්ධව නඩු පැවරිය හැකි ය. එහෙත්, පිට කිරීමේ නියෝගය නිකුත් කර හය මාසයක් ඇතුළත මෙය කළ යුතු ය.

<u>වන්දි ගෙවීම</u>

කිසි යම් පුද්ගලයෙකු 12 වන වගන්තිය යටතේ රජයට විරුද්ධව නඩු පවරා එම නඩුවේ තීන්දුව එම පුද්ගලයාට වාසි සහගත වන පරිදි ලැබී ඇති අවස්ථාවක දී, එම ඉඩමේ භුක්තිය භාර දෙන ලෙස තමන්ට බල කිරීම නිසා දැරීමට සිදු වූ අලාභය වෙනුවෙන් සාධාරණ වන්දියක් අය කරවා ගැනීමට එම පුද්ගලයාට හිමිකම ඇත.

# 3 වන ඇමුණුම


රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
அரச பாதுகப்பு மற்றும் அபிவிருத்தி அமைச்சு
MINISTRY OF DEFENCE & URBAN DEVELOPMENT

දුරකථන / தொலைபேசி / Telephone – 2875916-20 2873651-2 2873644 2873647 2873649 2875333 2797200
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site – www.uda.lk
ෆැක්ස් / தொலைநகல் / Fax – 2873637

නාගරික සංවර්ධන අධිකාරිය
நகர அபிவிருத்தி அதிகாரசபை
Urban Development Authority
06 හා 07 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
6 மற்றும் 7ஆம் மாடிகள், செத்சிறிபாய, பத்தரமுல்லை
6th & 7th Floors, Sethsiripaya, Battaramulla


මගේ අංකය: URP– [illegible]
2013 ඔක්තෝබර් මස 31 වන දින.

.................................
.................................
.................................
.................................

<u>නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය - කොළඹ නගරය</u>
<u>දෙමටගොඩ නව නිවාස ව්‍යාපෘතිය</u>

මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව " අපේම අපේම අපේ ගෙයක් " තේමාව යටතේ කොළඹ නගරයේ පිහිටි අඩු පහසුකම් සහිත ජනාවාස සඳහා සියලු පහසුකම් සහිත අංග සම්පූර්ණ නිවාස ලබාදීමේ ව්‍යාපෘතිය රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරමින් පවතී. එහි පළමු අදියර යටතේ, නිවාස 500 කින් යුත් මහල් නිවාස සංකීර්ණය දෙමටගොඩ මීහිදු සෙන්පුර මාවතේ ඉදි කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරියෙහි සැලැස්මට අනුව දෙමටගොඩ මීහිදු සෙන්පුර ඉදිකිරීම් අවසන් කර ඇති පළමු නිවාස ව්‍යාපෘතියෙන් ඔබ සහ පවුලේ සාමාජිකයන් හට අංක . ........ ........ දරණ නිවස ලබා දීමට තීරණය කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

නිදන කාමර 2 ක් මුළුතැන්ගෙය, විසිත්ත කාමරය, නාන කාමරයකින් සමන්විත මෙම නිවස රුපියල් මිලියන 7ක පමණ වටිනාකමකින් යුක්තය. මෙම නිවාස වැඩසටහන හුදෙක් අඩු පහසුකම් ජනාවාස වල පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘතියක් බැවින් හා නිවාස ලාභීන්ගේ ආදායම් තත්ත්වය සලකා නිවාස ලබා දීමේ දී අදාල මුළු වටිනාකම අයකර ගැනීමේ අපහසුතාවය සැලකිල්ලට ගෙන නිවසක වටිනාකමින් රුපියල් මිලියන 01 ක මුදලක් පමණක් වසර 20 ක කාල සීමාවක දී කිසිදු පොලී මුදලකින් තොරව පහත සදහන් සහනදායි පදනමකින් අය කර ගැනීමට තීරණය කර ඇත. ඒ අනුව,

1) රුපියල් මිලියන 01ක මුදලින් රු.50,000/= ක මුදලක් එකවර ගෙවිය යුතු අතර, ඉතිරි මුදල මාසිකව රු.3960 බැගින් වසර 20 ක කාල සීමාවක් තුළ ගෙවිය යුතුය.

2) මහල් නිවාස ව්‍යාපෘතියේ දීර්ඝ කාලීන සියළු නඩත්තු සහ අළුත් වැඩියා කටයුතු සහධිපත්‍ය කළමනාකරණ කමිටුව විසින් ඉටු කරන බැවින් ඒ සඳහා රු.50,000/= ක මුදලක් වාරික තුනකින් මාස 03ක් ඇතුලත ගෙවිය යුතු අතර එම මුදල මෙම ව්‍යාපෘතියේ දීර්ඝ කාලීන නඩත්තු කටයුතු සඳහා අරමුදලක් ලෙස තැන්පත් කරනු ලැබේ.

ඔබ වෙත වෙන්කර ඇති නව නිවසේ හිමිකම් භාර දීම සඳහා ඊට අදාල ගෙවීම් 2013.11.06 දිනට පෙර සිදු කළ යුතුය. තවද දැනට ඔබ පදිංචි නිවස සඳහා ගෙවිය යුතු සියලුම බිල්පත් (ජලය, විදුලිය) සහ වරිපනම් බදු අදාල ආයතන වෙත 2013.11.15 ට පෙර ගෙවා නිමකල යුතුය.

ඔබ වෙත නිවාස ලබා දීම සඳහා ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම ඉහත දක්වා ඇති මූලික මුදල් නාගරික සංවර්ධන අධිකාරිය මුදල් අංශය වෙත ගෙවා එම ලදුපත්හි පිටපතක් මෙම අංශය වෙතට ඉදිරිපත් කරන ලෙසට කාරුණිකව දන්වා සිටිමි.

මෙම ලිපිය නිවසේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමේ ලේඛනයක් නොවන බව මෙයින් අවධාරණය කරන අතර නිවසේ අයිතිය නීත්‍යානුකූල ඔප්පුවක් මගින් පවරා දෙන තෙක් නිවසේ හිමිකාරත්වය හා ඒ පිළිබඳ තීරණය ගැනීමේ අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය සතු වන බවත් කාරුණිකව සලකනු මැනවි.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය - කොළඹ නගරය
නාගරික සංවර්ධන අධිකාරිය